ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07

"වෛරයෙන් පිරුණු තැන ප්‍රේමය ද ,
අසමගියේ තුවාලයන්ට ශාන්තියේ සුවයද,
අවිශ්වාසයෙන් යුත් තැනට විශ්වාසය ද ,
බලාපොරොත්තුව සුන් තැනට
බලාපොරොත්තුවද,
ශෝකය වටලාගත් තැනට ප්‍රීතිය ද ,
අඳුරෙන් වැසීගිය තැනට ආලෝකය ද ,
ගෙන යාමට මට වරම් දුන මැනව"

**(අසීසියේ සා. ප්‍රැන්සිස් මුනිඳුන්ගේ සාම යැදුමෙන්)**



ක්‍රි.ව. 2013 ක් වූ මාර්තු 17 ඉරිදා 147 වෙළුම 41 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/51/NEWS/2013 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

# සසුන් අසුන ඇමෙරිකා මහද්වීපයට

## ආර්ජන්ටිනාවේ හොර්හේ මාරියෝ කාදිනල් බර්ගෝලියෝ හිමිපාණෝ අති උතුම් පළමුවන ප්‍රැන්සිස් සසුනිසුරාණන් ලෙස පදවි ලබති



**ලබන සතියේ ඥානාර්ථ ප්‍රදීපය පාස්කු විශේෂ අතිරේකය සමඟ නව සසුන් පියාගේ රාමු කරගත හැකි වර්ණ ඡායාරූපයක් නොමිලේ!**

"මේ චාරිකාව අප අතර සහෝදරත්වයේ, ප්‍රේමයේ හා විශ්වාසයේ ගමනක් කරගනිමු.
අපි හැමවිටම අනෙකා වෙනුවෙන් යාච්ඤා කරමු.
ලෝකය වෙනුවෙන් යදිමු. සුවිශේෂී සහෝදරත්වයක් ගොඩනැගීමට යාච්ඤා කරමු.
අප අදින් අරඹන සභාවේ මේ ගමන, මේ මනහර නගරය
ධර්මදානයෙන් පුරවාලීමට හේතුවේවා!"

✠ අති උතුම් පළමුවන ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

## පදවියෙන් පදවියට

### සුබාසිංසන පැතුම්!



කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ රදගුරු අබිසෙස් සමරුව මාර්තු 18 දාට යෙදී ඇති අතර අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මේරියස් පීරිස්, ත්‍රිකුණාමලය රදගුරු අතිඋතුම් කිංස්ලි ස්වාමිපිල්ලේ, මන්නාරම රදගුරු අතිඋතුම් රායප්පු ජෝශප්, මඩකලපුව රදගුරු අතිඋතුම් ජෝශප් පොන්නයියා හිමිපාණන්ගේ නාමසාන්තුවර මංගල්‍යය මාර්තු 19 වෙනිදාට යෙදේ. එතුමන් සියලුදෙනා වෙත ප්‍රදීපයෙන් පිදෙන සුබාසිංසන.

# විශ්වාසය තුළ ගොඩනැගෙමින් සැබෑ සාක්ෂිකරුවන් වෙමු

### සලාපුර රදගුරු හිමි තලවිල චතාරික මංගල්‍යයේදී පවසයි

**අප රටේ තිස් වසරක යුද්ධයෙන් පසු ජනතාව අතර සහෝදරත්වය ගොඩනඟා ගැනීම අවශ්‍යයි. රටට ආදරය කරන, දහම මත පිහිටා සිටින, අන්‍යෝන්‍ය පිළිගැනීමක් ඇතිව ජීවත්වන ජනතාවක් අප රටට අත්‍යවශ්‍ය යුගයක අප ජීවත් වන්නේ. මෙම විශ්වාසයේ වසර තුළ දෙවි පියාණන් කෙරෙහි විශ්වාසය ගොඩනඟා ගැනීමට වාද භේද ආදියෙන් තොරව අපේ දායකත්වය දිය යුතුයි. විශ්මිත විශ්වාසය තුළ අපි ගොඩනැගෙමු; ගොඩනඟමු; විශ්වාසයේ සාක්ෂිකරුවන් වෙමු.**



හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් මෙසේ අවධාරණය කළේ තලවිල සාන්ත ආනා සිද්ධස්ථානයේ චතාරික මංගල්‍ය දේශනයේදී සැදැහැ ජනතාව අමතමිනි.

මෙවර මංගල්‍යයට විශේෂ ආරාධිත අමුත්තකු වශයෙන් සහභාගී වූ මන්නාරම රදගුරු අතිඋතුම් රායප්පු ජෝශප් හිමිපාණෝ සන්ධ්‍යා මෙහෙයේදී සහ මංගල්‍ය දිව්‍ය යාගයේ දී දමිල බසින් දේශනය පැවැත්වූහ. සිද්ධස්ථාන පාලක ගරු නිහාල් පයස් පියතුමා සහ සහායක ගරු දිලංක නිර්මාන් හා ගරු ඇන්ටන් නිරෝෂන් පියවරුන් ඉතා මැනවින් මංගල්‍යය සංවිධානය කර තිබුණි.

මංගල යාගයට අතිඋතුම් රායප්පු ජෝශප් රදගුරු හිමි හලාවත පදවි භාණ්ඩාගාරික අතිගරු ලුක් නෙල්සන් පෙරේරා හා සිද්ධස්ථාන පාලක ගරු නිහාල් පයස් පියවරු හවුල් වූහ.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි සහ පර්සි ප්‍රනාන්දු**

## තුඩැල්ල දිසා විසෙන්තියානුවෝ වාර්ෂික පාදනමස්කාරය

තුඩැල්ල දිසාවේ වින්සෙන්තියානුවෝ සිය චතාරික පාදනමස්කාරය මෙවර කඳුරට කල්වාරි පුදබිමේදී පැවැත්වූහ. ඒ සඳහා 150 කට අධික සාමාජික පිරිසක් සහභාගි වූහ.

දිව්‍ය පූජා යාගය පුදබිම් පාලක ගරු ශාන්ති අබේසිංහ සහ කැලුම් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

**ෆ්‍රැන්ක් වික්‍රමසිංහ**

## කඳාන සිරිහද චතාරික වන්දනාව මුන්නක්කරයේදී

කඳාන දිසා සිරිහද සමිති වාර්ෂික චතාරික වන්දනා මෙහෙය මීගමු කලපුව අසල පිහිටා ඇති මුන්නක්කරය සිරිකුරුස දේවස්ථානයේදී පවත්වන ලදී.

දිසා අධ්‍යක්ෂ ගරු ක්‍රිස්ටි නිකලස් පියතුමා නිලධාරීන්ගේ සහය ඇතිව මෙය සංවිධානය කළ අතර දූව මීසම් සේවක ගරු ෂෙල්ටන් ඩයස් පියතුමා භක්ති අභ්‍යාස මෙහෙයවිය.

**ඩල්සි මෙන්ඩිස්**

## මුල් වරට මත්තුමගල පසන් හා ලතෝනි

මත්තුමගල මීසමේ ප්‍රථමවරට පසන් හා ලතෝනි ගායනා පැවැත්විය. ගායනා කණ්ඩායම හා තරුණ සමිතිය සංවිධානය කළ එය මීසම් සේවක ගරු ඇන්සලම් ශිරාන් පියතුමාගේ මඟපෙන්වීමෙන් පැවැති අතර විශාල ජනතාවක් සහභාගි වුහ.

**ටී. ක්‍රිෂාන් ප්‍රනාන්දු**

## පසන් ගැන කරුණු නොදැන නිපදවූ රූපවාහිනී වැඩසටහනට සසුන් විරෝධය

පෙබරවාරි 23 වැනිදා ජාතික රූපවාහිනියෙන් විකාශනය වූ පසන් ගායනා වැඩසටහන පිළිබඳව මතුව ඇති කිතුනුවන්ගේ විරෝධය දක්වා ජාතික කතෝලික ජන සන්නිවේදන අධ්‍යක්ෂ ගරු බෙනඩික් ජෝශප් පියතුමා ජාතික රූපවාහිනියේ සභාපති මොහාන් සමරනායක මහතාට ලිපියක් යවා ඇත. එහි මෙසේ දැක්වේ.

2013 පෙබරවාරි 23 වන ඉරුදින පෙ.ව. 10.30 ට ජාතික රූපවාහිනි නාලිකාවෙන් විකාශය වූ රංග භූමි වැඩසටහනින්, ඉමහත් භක්තියෙන් සලකන පසන් ගායනා විහිළුවට ලක් කරන්නට තරම් කටයුතු කළ නිර්මාණකරුවන් දෙපොල සම්බන්ධව කතෝලික ජනතාව තුළ ඉතා අප්‍රසන්න හැඟීම් මතුව ඇති බව කාරුණිකව මින් දන්වා සිටිමි. මේ සම්බන්ධව කතෝලික ජන සන්නිවේදන කොමිසමේ සභාපති තුමන් වන අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ රදගුරු තුමන්ගේ අප්‍රසාදය හා විරෝධතාවය සමගින් බොහෝ කිතුනු බැතිමතුන් විසින් විරෝධතාව ප්‍රකාශ කරමින් එය සම්බන්ධව අදාල වගකිව යුත්තන් හට මෙහි බැරෑරුම් තත්ත්වය පහදා දෙන්නටයයි අවධාරණය කොට ඇත.

චතාරික කාලයේ භක්ති අභ්‍යාසයන් සමග බැඳෙන පසන් ගායනාවලට හිමි වන්නේ විශේෂිත තැනකි. මෙම කාලය තුළ ඇතැම් කිතුනු නිවෙස්වල සහ දේවස්ථානවල ගායනා කරන මෙම පසන් ගීත කිතුනුවන් තුළ ඇතිකරන්නේ ඉමහත් ශ්‍රද්ධාවකි. ඒ නිසාම කොයි ලෙසකින් හෝ අඩුතක්සේරුකර උහුළුවට විහිළුවට ලක් කරන්නට කොයි කාටවත් අයිතියක් නොමැත. ඊට හේතුව ඒ ගායනා තුළින් කිතු සමිඳුන්ගේ දුක්ප්‍රාප්තිය යළි ජීව ගන්වමින් සැදැහැවතුන් තුළ ගැඹුරු භක්ති ආදරයක් දනවන නිසාය.

මේ සම්බන්ධව 2013 මාර්තු 10 වන දින ප්‍රදීප පුවත් පතේ සඳහන් කොට තිබූ පරිදි 'වරක් සුජීව ජාගෙ ාඩ මාධ්‍යවේදියා හැඳින්වූවා ශුද්ධවූ සතිය පිළිබඳව වැරදි අර්ථකථනයක්, අළු බ්‍රහස්පතින්දා ගොක් කොළ බෙදා ගන්නා බව ඔහු ප්‍රකාශ කරද්දී මගේ හදවත මොහොතකට නැවතුනු බව මටම දැනිනි. එමෙන්ම කිතුනුවෝ පාස්කු සතියේ පසන්, කන්තාරු කැරොල් ගායනා කරන බව ප්‍රකාශ කළේ ඒ පිළිබඳ කිසිදු දෙයක් නොදැන බව කාටත් වැටහේ.....'

අපි මෙසේ ආයාචනා කරමු. අනාගතයේදී මෙවැනි වැඩසටහන් විකාශය නොවන ලෙසට වගබලා ගැනීම සඳහා කිතුනු උපදේශක මණ්ඩලය වෙත ඒවා භාර කොට, උපදේශක මණ්ඩලයේ උපදෙස් අනුව කටයුතු කිරීමෙන් සාධාරණය ඉටුකරන්නට හැකිබව මින් සඳහන් කරමි. මෙවන් ක්‍රියාදාමයක් නත්තල් සමයේද සාර්ථකව සිදු වූ බව මෙහිදි සඳහන් කරමි.

## නාසරෙත්හි මරියා පල්ලන්සේනේදී

පල්ලන්සේන මීසමේ පාස්කු දර්ශනය නව මුහුණුවරකින් ඉදිරිපත් කිරීමට මීසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමා කටයුතු යොදා ඇත. 'නාසරෙත්හි මරියා' නමින් මාර්තු 23 වන සෙනසුරාදා කල්වාරි සෙවණ වේදිකාවේදී වේදිකා ගත කිරීමට නියමිතය. පාස්කු කලා කවයේ අධ්‍යක්ෂ රේමන් ප්‍රනාන්දු සහ සහයක ඔලිවර් ප්‍රනාන්දු මහත්වරුන් ඇතුළු කමිටුව කටයුතු කරති.

පල්ලන්සේන වික්ෂෝප දේවමාතා දේවස්ථානයේ 125 වන වසර නිමිත්තෙන් ඉදිරිපත් කරන මේ නාට්‍යයට නළු නිළියන් 150 ක් සහභාගි වන අතර මීසම් සහයක ගරු ගයාන් ප්‍රසන්න පියතුමා නළු නිළි පුහුණුවීමේ කටයුතු නිරීක්ෂණය කරයි.

**මෙල්වින් ද කොස්තා**



ලක්දිව ප්‍රථම ස්වභාවික ලූර්දු ගුහාව පොල්ගහවෙල පිහිටි අතර එහි ලූර්දු දේවමාතා වාර්ෂික මංගලෝත්සවය කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. දේවමාතාවන්ගේ ඓතිහාසික ප්‍රතිමාවට එහිදී රන් ඔටුන්නක් පැළඳවිය. පොල්ගහවෙල මීසම් සේවක ගරු මනුර ශිරෝන් පියතුමාගේ මඟපෙන්වීම යටතේ සිදුකැරිණි.

**හිරාන් ද මැල්**

# සෑම ව්‍යසනයකින්ම වඩාත් බැට කෑවේ කාන්තාවන්

එකසිය තුන්වන ජාත්‍යන්තර කාන්තා දිනය සමරන අපට නිසිතැන, හිමිතැන, සමතැන ගැන අසන්නට ලැබෙනවා. එසේම කාන්තා දූෂණය, හිෂණය, හිංසනය ගැනත් නිතරම අසන්නට ලැබෙනවා. ගතවූ යුද්ධය තුළින් සටන් බිමේ හා සිවිල් සමාජයේ මියැදුන තම ස්වාමිපුරුෂයන් නිසාත් වඩාත්ම අසරණව වඩාත්ම බැට කෑවේ කාන්තාවන්, ඒවගේම සුනාමි ව්‍යසනයේදීත් එහෙමයි. ඒ අනුව සෑම ව්‍යසනයකින්ම වැඩියෙන්ම බැට කෑවේ කාන්තාවන් යයි 'පවුල රකින ඇය සුරකිමු' තේමාව යටතේ නාට්‍ය, විරිඳු හා විවිධ රංගන ඇතුළත්ව මට්ටක්කුලිය ජෝශප් ජෙරාඩ් නිමනි ශ්‍රවණාගාරයේ පැවති ශ්‍රී ලංකා ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාර කාන්තා දින සැමරුම් උලෙළේදී ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ ජාතික උපාධ්‍ය ගරු රන්ජන් මාල් මොරායස් පියතුමා පැවසීය.

ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ මෙහෙය වීමෙන් පැවති මේ උත්සවයේදී ව්‍යාපාරයේ ජාත්‍යන්තර සම්බන්ධීකාරක ඇන්ටනි මංචනායක මහතා එතෙර මෙතෙර කිතුනු කම්කරු කාන්තා නායකත්වය පිළිබඳව අවධානයට ලක්කළ අතර ශිරාන් මෛත්‍රි මහතා කාන්තා පෙළ ගැස්ම හා කාන්තා



බලසතුකරණයත්, සේවා නියුක්තියත් පැහැදිලි කළේය. ජාතික ලේකම් සුධර්මා පෙරේරා මහත්මිය විසින් කාන්තා අභියෝග සනිටුහන් කරමින් ඉදිරිපත් කළ නැටුම් වැයුම් ගැයුම් කැපීපෙනුනි. ජාතික සභාපති තියබෝල්ඩ් සමරතුංග මහතාද රැස්වීම ඇමතීය.

## පිහිටවන්න!

ඥානාර්ථ ප්‍රදීප ලේඛිකාවක වු අබේපුස්ස කීනදෙනිය මඩම පාරේ අංක 255 හි පදිංචි රීතා රණසිංහ මහත්මිය පිළිකා රෝග යෙන් පෙළේ.

ඇගේ ප්‍රතිකාර කටයුතු සඳහා මෙන්ම ඖෂද සඳහා පරිත්‍යාගිශීලින්ගෙන් ආධාර බලාපොරොත්තුවන අතර මීරිගම ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඒ ඒ රීටා නමින් අංක 1-0079-01-3147-4 ගිණුමට ඔබගේ පරිත්‍යාගය යොමුකරන්න.



මහජන බැංකුවේ සේවය කරන කිතුනුවන් පවුල් වල සාමාජිකයන්, විශ්‍රාමිකයන් හා එක්ව දින දෙකක ධර්ම විවේකයක් බුළුතොට ධර්ම විවේක මධ්‍යස්ථානයේදී පැවැත්විය. මේ එහි අවස්ථාවකි.

**ගාමිණී පීරිස්**

## වග මීසමෙන් මඩු පල්ලියට

වග මීසමෙන් වාර්ෂික චතාරික වන්දනා ගමන මෙවර මරුද මඩු මාතා පුදබිමේදී පැවැත්විණි. සැමදෙනාගේ සිත් පහන් කළ අර්ථවත් වන්දනා ගමනක් සංවිධානය කරන්නට මීසම් සේවක ගරු ප්‍රසන්න සංජීව පියතුමාට ජනතාවගේ නොමඳ සහය ලැබී තිබිණි.

පාදනමස්කාරය, ඉටිපහන් පෙරහර, ජපමාල බැතිය හා භාවනාවලින් සමන්විතව දිව්‍ය පූජාවෙන් මේ වන්දනා ගමන අවසන් විය.

**ග්‍රේටා පෙරේරා**





වත්තල සා. ආනා සමිතිය මගින් වත්තල සිංහ සමාජයේ අනුග්‍රහය ඇතිව සංවිධානය කරන ලද ප්‍රජා සත්කාරක වැඩසටහනක් වත්තල මීසම් සේවක ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය. වැඩසටහන ඇරඹීමට පෙර ආගමික වතාවත් සිදු කළ අයුරු.

**නිමල් පෙරේරා**

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2013 මාර්තු 17 ඉරිදා

# අතිඋතුම් (පළමුවන) ප්‍රැන්සිස් සසුනිසුරාණෝ

අතිඋතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන් ශුද්ධවූ නගරය වූ රෝම පුරවරයේ වතිකාන බැසිලිකාවේ සිට බිලියන 1.2 වූ ලෝක කතෝලික ජනතාවට ආධ්‍යාත්මික නායකත්වය ගෙන දෙන්නට දැන් සියල්ල සම්පූර්ණ කොට ඇත. පුරා සති දෙකකට ආසන්න කාලයක් තාවකාලිකව හිස්ව තිබූ කතෝලික සසුන් අසුන නැවතත් පිරිපුන් කොට විරාජමානව නමුත් නිහතමානි සිත් ඇතිව අතිඋතුම් දහසය වන සුදොතුම් පියාගේ අනුප්‍රාප්තිකයා ලෙස ඒ අසුන අරා සිටිනට ලබන දහනමවන දින පදවි ප්‍රාප්ත වන විට කතෝලික ලෝකය පමණක් නොව මුළු මහත් ලෝකයම කෙතරම් ප්‍රබෝධවත්ව එය දකින්නට පුල පුලා සිටිත්ද යන්න යළිත් අමුතුවෙන් පැවසිය යුතු නොවේ.

කතෝලික ආධ්‍යාත්මයෙන් හා සංයමයෙන් ඔද බැඳ ගත් ලතින් අමෙරිකාන ජනතාවගේ පිබිදෙන මනසට කථා කරමින් යුරෝපයත්, අමෙරිකාන මහද්වීපයත් අප්‍රිකාව. ඔෂිනියාව හා ආසියාව කතෝලික ධජය තුළ එක්සේසත් කරන්නටත් ගනු ලබන්නාවූ චෛතසික ධෛර්යය හුදු කැපවුනු විශ්වාසය තුළ ඉටුකරන්නට නව සසුන් පියා ඉදිරියට ගන්නාවූ ඉදිරි පියවර ගැන කුදු මහත් ලෝකය දැන් කරන කථා බහ නවතම මාදිලියක් ගෙන ඇත. එහිදි ලොවම පිළිගත් ප්‍රධාන පෙළේ මාධ්‍ය ආයතන පවත්වන මාධ්‍ය සාකච්ඡා තුළින් දෑස් විවර කරන මාවත් හරබර අදහස් මතම විවර කරන අයුරු බැලීමට චමත්කාරය.

හොර්හෙ මාරියෝ බර්ගෝලියෝ 1936 දෙසැම්බර් මස 17 වන දින ආර්ජේන්ටිනාවේ බුවනෝර්ස් අයර්ස් හි ඉතාලි ජාතික දුම්රිය කම්කරුවකුට දාව උපන්නේය. එම පවුලේ දරුවන් පස් දෙනෙකි. වයස 32 දී ජේසු නිකායික කතෝලික පූජාප්‍රසාදිවරයෙක් සේ සසුනේ අපෝස්තලික සේවාවට දිවිය භාර දුන් ගරු හොර්හෙ මාරියෝ බර්ගෝලියෝ පියතුමා දේශිය ජේසු නිකායික ශ්‍රේෂ්ඨාධිපති තුමන් ලෙස පුරා වසර 7 ක් සිය ධූරය දරා 1998 වසරේදි බුවනොස් අයර්ස් අගරදගුරු තුමන් බවට පදවි ලැබීය. 2001 වසරේදි ස්වර්ග ස්ථ භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු සසුන් පියා විසින් කාදිනල් ධූරයට ඔසවනු ලැබීමෙන් පසුව විශ්ව සභා ක්‍රියාකාරීත්වයට සෘජුවම සම්බන්ධ විය.

හොර්හෙ මාරියෝ බර්ගෝලියෝ පියතුමෙක්, රදගුරු තුමෙක්, කාදිනල් තුමෙක් වශයෙන් පුරා අවුරුදු 75 ක් තුළ ක්‍රියාකාරී සසුන් අපෝස්තලික සේවාවෙන් පසුව ඉසිඹු ලබා වසරක් ගත වීමට මත්තෙන් දැන් අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියා ලෙසින් මුළු මහත් විශ්ව කතෝලික සභාවේ නවතම සසුන් පියා ලෙස අසුන් අරා සිටී. බෙහෙවින් දැහැමි ජීවිත පැවැත්මක් ගත කළ හිම්නමක් සේ නමක් දරා සිටින අප සසුන් පියා මිලියන 501 වන දකුණු අමෙරිකාන ජනතාවගේ ආර්ථික, දේශපාලන හා ආධ්‍යාත්මික දෛනික ජීවිත පැවැත්ම ගැන හොඳින්ම කතා කළ හැකි ආධ්‍යාත්මික නායකයෙකි. එලෙසම උතුරු අමෙරිකාවේ හා යුරෝපයේ සසුන් අර්බුදයන් හා වැටීම් පිළිබඳව හොඳ වැටහීමක් ඇත්තෙකි. පිබිදෙන අප්‍රිකාවේ හා ආසියාවේ සමයාන්තර හා අන්තර් ආගමික දෘෂ්ටිය තුළ වර්ධනය වන කතෝලික දහම පිළිබඳව මැනවින් අධ්‍යනය කළ නිරීක්ෂකයකි. ආර්ථික බලවතුන් ලෙස නැගි එන මහජන චීනයේ, ඉන්දියාවේ හා බ්‍රසිලයේ සසුන් පුරාණය හා එහි අනාගත දැක්ම පිළිබඳව ඉඟි පහළ කොට දිවැස් වැකි බිනීමට සමතෙකි.

ඒ සියලු කරුණු කාරණා මධ්‍යයේ සාම්ප්‍රදායිකයින් හා නූතනවාදීන් එක්තැන් කරවන දේව ධර්මයක් හා සරල යාච්ඤා පැවැත්මක් පිළිබඳව සිතා ජනතාව එක්තැන් කරන්නට නව සසුන් පියා ඉදිරියේ දිග හැරෙන්නේ අභියෝගයේ මාවතකි. නැවතත් කිතුනු මූලාශ්‍ර කරා ගමන් කරවන්නට යුරෝපයේ තරුණ කොටස් එක්තැන් කළ යුතුවේ. හිස්පැනික් ජනතාවගේ වැඩි වර්ධනයක් ඇති උතුරු අමෙරිකාවේ කතෝලික ආධ්‍යාත්මය වට කොට බැඳ ඇති බැඳීම් මුදා හරින්නට නව දැක්මක් අවැසිව පවති. චීනයේ අන්තර් ආගමික සහජීවනයට වඩාත් ලංවිය යුතු කාලයක් උදාකර ගන්නට ඇත්තේද අභියෝගයකි. ආර්ථික දුෂ්කරතා හා යුධ හැලහැප්පීම් අතර අප්‍රිකාවේ කතෝලික සසුනට ඉදිරිය බලා ගමන් කරන්නට දිගු කළ යුතු අත අති විශාලයි. ආසියාවේ පමණක් නොව මධ්‍යම හා දකුණු අමෙරිකාව හරහා හමා යන ඉවැන්ජලිස්ත කිතුනු නිකායන් අතර පවතින සීතල යුද්ධයේ ගොදුරක් නොවන්නටද සිදුවේ. සාම්ප්‍රදායික මාවතේ නූතනත්වය ඉස්මතු කර ගන්නට දරන වෑයමද පහසු නොවනු ඇත. ශුද්ධත්වය පිළිබඳව පවතින යුද්ධය අරබයා මූලික සරල සිද්ධාන්ත වෙතට කතෝලික දිශානතිය හැරවීමට තරමක් අසීරු වනු ඇත. අව්‍යාජත්වය සරල බව හා ජනතා සමීප බව ඉස්මතු කර ගන්නට මූලික කැපවීම් රාශියක්ම කරන්නටද සිදුවනු ඇත.

මේ සියලු දේ අභියෝග වූවත් ප්‍රැන්සිස් නමින් සසුනිසුරාණන් වූ අප සුදොතුම් පියතුමන් මේ සියලු අභියෝග ජයගනු නියතයි. අසීසියේ ප්‍රැන්සිස් මුනි තුමන් සියල්ල අත්හරිමින් කතෝලික සසුන ගොඩනැගීමට ගත් කැපවීමේ ගුණාංග අප නව සසුන් පියාණන් තුළ නොමඳව ඇත. දුප්පත් ජනතාවට සමීප වෙමින් ඒ ජනතාව අතර ගමන් කරන ආධ්‍යාත්මික නායකයෙක් සේ ධර්මදානයේ නව ලොවක් හෙට දවසේ කතෝලික සසුන් කෙතේ උදාකර ගන්නට මේ ලතින් අමෙරිකාන සුන්දර මිනිසා කරන කැපවීමේ සැබෑ ප්‍රතිඵල ක්‍රියාදාමය තුළ කඩිනමින්ම දකින්නට ඇමෙරිකා මහද්වීපය ධර්මයට කුලවද්දන යුරෝපයේ දිශානතියද වෙනස් වී එය අප්‍රිකාවේ හා ආසියාවේ ප්‍රගමනයට හේතුවක් කර ගන්නට සභාවේ සම්ප්‍රදායවාදින් හා නූතන වාදින් නිකාය වාදීන් හා ලිබරල් වාදින්, විමුක්ති කාමින් හා ආරණ්‍ය වාසින් ලෙස බෙදී වෙන් නොවී එකම ශුද්ධවූ සභාවක් සේ පෙරට යන්නට එකී අනුගාමිකත්වය එක් විය යුතුමයි. එය අප්‍රමාදව ඉටු කරන්නට ශුද්ධාත්ම වරම් අතිඋතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන්ට අපි යාච්ඤා හරිතව ප්‍රාර්ථනා කරන්නෙමු.

**විශ්වාසයේ වසර**
**දහම් චින්තා 21**

# මාධ්‍ය අනාවැකි පුස්සක් කළ 2013 සසුන් පිය වරණ දැහැන

ඉකුත් පෙබරවාරි 11 වැනිදා අතිඋත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා තමන් වහන්සේගේ වියපත් බව හා දුබල ශරීර සෞඛ්‍යය හේතුවෙන් විශ්‍රාම ලබන බව ප්‍රකාශ කිරීමත් සමග කඩි ගුලක් සේ ඇවිස්සුණු බටහිර මාධ්‍ය හා බුකීකරුවෝ මීළඟ සසුන් පියා විය යුත්තේ කවුරුන් දැයි තමන් තීරණය කර ඉදිරිපත් කරන තත්ත්වයට පත්වූහ. සසුන් පිය වරණ දැහැන හුදු ජනාධිපතිවරණයක් හෝ මහ මැතිවරණයක් නොව ඊට හාත්පසින් වෙනස් අධ්‍යාත්මික මඟපෙන්වීමක් සහිත කටයුත්තක් බව අමතක කරමින් තම තමන්ගේ මතවාද හා ලෞකික ලොව වෙළෙඳ අරමුණු ඔස්සේ ඒවා ගලපන්නට වෑයම් කළහ.
එහෙත් ඒ සියල්ල උඩු යටිකුරු කර දමමින් ශුද්ධාත්ම මඟපෙන්වීම මැද ආර්ජන්ටිනාවේ අතිඋතුම් හොර්හෙ මාරියෝ කාදිනල් බර්ගෝලියෝ හිම්පාණන්ව රටවල් 48 ක් නියෝජනය කරමින් කාදිනල් සංසදයේ කාදිනල් හිම්පාණන් 115 දෙනකුගේ තුනෙන් දෙකකට වැඩි ඡන්දයෙන් තෝරා පත් කැර ගැනිණ. මාර්තු 13 දා ප.ව. 7.05 ට වතිකාන සිස්ටයින් දෙව්මැඳුරේ දුම් කවුළුවෙන් සුදු පැහැති දුම නිකුත් වීමත් සමඟ එය විකාශනය කරමින් සිටි ජාත්‍යන්තර රූපවාහිනී මාධ්‍ය පවා පත්ව ඇත්තේ අන් කාදිනල් නමක් යැයි සැක පහල කරද්දී මිනිත්තු ගණනාවකින් අනාවරණය වූයේ අතිඋතුම් හොර්හෙ මාරියෝ කාදිනල් බර්ගෝලියෝ හිම්පාණන් සසුන් පිය පදවියට තෝරාගෙන ඇති බවයි.

මාර්තු 12 වැනි අඟහරුවාදා වතිකානයේ ඓතිහාසික සිස්ටයින් දෙව්මැඳුරට කාදිනල් සංසදය ඇතුලු වූයේ අතිඋතුම් සොළොස්වන බෙනඩික් සසුන් පියා ඉසිඹු ලැබීමෙන් හිස්වූ සසුන් පිය පදවියට අනුප්‍රාප්තිකයකු තෝරා ගැනීමටය. රහස් ඡන්දයෙන් සිදු වූවත් යාච්ඤාව පෙරදැරිව ශුද්ධාත්ම වරමින් පූර්ණව මේ කාර්යයේ නියැළුණු කාදිනල් සංසදය පස්වන ඡන්ද වටයේදී සාර්ථක ප්‍රතිඵල ලැබීය. සසුන් නියමය අනුව පස්වන වටයේදී කාදිනල් හිම්පාණන් 115 දෙනාගෙන් සමන්විත කාදිනල් සංසදයෙන් තුනෙන් දෙකකට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගැනීමට අතිඋතුම් හොර්හෙ මාරියෝ කාදිනල් බර්ගෝලියෝ හිම්පාණෝ සමත් වූහ. සුදු පැහැති දුම නිකුත් වී විනාඩි දෙකක් ගතවන්නට පෙර වතිකානයේ සාන්ත පීතර බැසිලිකාවේ සීනු නද දෙන්නට පටන් ගත්තේය. ඉන් පැයකටත් වැඩි කාලයකට පසු පස්වරු 8.12 ට සාන්ත පීතර බැසිලිකාවේ කවුළුව වෙත පැමිණි ප්‍රංශ ජාතික අතිඋතුම් ජීන් ලුයිස් කාදිනල් ටවුරන් හිමි 'අපට සසුන් පියතුමකු ලැබී ඇතැ'යිද අතිඋතුම් හොර්හෙ මාරියෝ කාදිනල් බර්ගෝලියෝ හිම්පාණන් ප්‍රැන්සිස් නම ගෙන ඇතැයිද පළ කළේය.

ශිරාන් මෛත්‍රි

වසර 1300 ක කාලයක් තුළ යුරෝපයෙන් බැහැරව පත්වූ පළමු සසුන් පියා වන එතුමා ලතින් ඇමෙරිකාවෙන් බිහිවූ ප්‍රථම ශුද්ධෝත්තම පියතුමාය. ජේසු නිකායික උන්වහන්සේ 1831 දී ත්වූ බෙනදිකාන නිකායෙ අතිඋතුම් 16 වන ග්‍රෙගරි පාප්තුමාගෙන් පසුව නිකායකින් බිහිවූ මුල්ම සසුන් පියා වන අතර වර්ෂ මේ අතර 2005 දී පැවැති සසුන් පිය වරණ දැහැනේදී අතිඋතුම් ජෝශප් කාදිනල් රැට්සිංගර් හිම්පාණන් සසුන් පිය පදවියට පත්වෙද්දී දෙවන වැඩිම ඡන්ද ලබා ගත්තේ අතිඋතුම් බර්ගෝලියෝ කාදිනල් හිම්පාණන් බවට ඉතාලි මාධ්‍ය පසුකාලයේදී අනාවරණය කැර තිබිණි. එහෙත් සසුන් පිය වරණ දැහැනේ රහස්‍ය භාවය මත ඒවායේ ඇත්ත නැත්ත කොයි හැටිදැයි යන්න කිව නොහැකිය.

නව සසුන් පියා සාන්ත පීතර චතුරස්‍රයේ කවුළුව අසලට පැමිණියේ පස්වරු 8.22 ට පමණය. විශ්‍රාමික සසුන් පිය අතිඋතුම් සොළොස්වන බෙනඩික් හිම්පාණන් උදෙසා යාච්ඤා කළ උන්වහන්සේ තමන්ව ආසිරි ගන්වන්නට දෙවියන් වහන්සේගෙන් යදින්නැයි ජනතාවට ආයාචනා කළහ. ජනතාව ඊට ප්‍රතිචාර දැක්වූ අතර පසුව උන්වහන්සේ ජනතාව ආසිරි ගන්වා කෙටි දෙසුමක් පැවැත්වූහ.

වර්ෂ 1936 දෙසැම්බර් 17 වැනිදා ආර්ජන්ටිනාවේ අගනුවර වූ බුවනෝර්ස් අයර්ස් හි උපත ලද උන්වහන්සේ බුවනෝස් අයර්ස් සරසවියෙන් රසායන විද්‍යාව පශ්චාත් උපාධිය දිනා පූජකවරය සඳහා ජේසු නිකායට ඇතුළත් විය. 1969 දෙසැම්බර් 13 දා පූජකවරය ලද එතුමා 1997 ජූනි 3 දා යුව අගරදගුරු ලෙස නම් කර 1998 පෙබරවාරි 28 දා බුවනෝර්ස් අයර්ස් අගරදගුරු ලෙස පදවි ප්‍රාප්ත විය. 2001 පෙබරවාරි 21 දා අතිඋත්තම දෙවන ජුවාම් පාවුළු සසුන් පියා වෙතින් කාදිනල්වරයට ඔසවනු ලැබීය. ශුද්ධාසනයේ කොමිසම් සහා ගණනාවක සේවය කළ උන්වහන්සේ ආර්ජන්ටිනා කතෝලික රදගුරු සමුළු සභාපති ලෙස ද කටයුතු කර ඇත.

ඉතා සරල, චාම් හා නිහතමානී ගුණාංගයන් ගෙන් පිරි සසුන් නායකයකු ලෙස ප්‍රකට එතුමා සිය ආහාර තමන්ම පිළියෙළ කර ගනිමින් ජනතා සේවාව සඳහාත්, දිළිඳු අය වෙනුවෙනුත් වැඩි අවධානයක් යොමු කළේය.

සමලිංගික විවාහයන් ආර්ජන්ටිනා රජය නීතිගත කරද්දී ඊට තරයේ විරෝධය පෑ උන්වහන්සේ ග්‍රන්ථ ගණනාවක් රචනා කළහ. බස් රථයෙන් හා මෙට්රෝ දුම්රියෙන් ගමන් කළ උන්වහන්සේ චාම් අල්පේච්ඡ දිවි මඟ නිරතුරු අගය කළහ.

ලෝක කතෝලික ජනගහනයෙන් 40% වැඩි පිරිසක් වෙසෙන ලතින් ඇමෙරිකාවෙන් මුල්වරට සසුන් පිය පදවියට පත්වූ අතිඋතුම් බර්ගෝලියෝ හිම්පාණන් පළමු ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ලෙස මාර්තු 19 වැනිදා පෙරවරු 9 ට වතිකානයේ සාන්ත පීතර බැසිලිකාවේ දී පදවි ප්‍රාප්ත වනු ඇත. සසුන් පියවරයට තෝරා ගැනීමෙන් පසු විශ්‍රාමික සසුන් පිය අතිඋතුම් සොළොස්වන බෙනඩික් හිම්පාණන් දුරකථනයෙන් ඇමතූ අතර මාර්තු 14 වැනිදා එතුමන් බැහැදැකීමට යෑමට නියමිතව තිබිණ. කෙසේ වුවද විශ්‍රාමික සසුන් පියා මාර්තු 19 වැනිදා සිදුකැරෙන සසුන් පිය පදවි ප්‍රාප්ති මෙහෙයට එක් නොවන බැව් වතිකාන ප්‍රකාශක ගරු ෆෙඩ්රිකෝ ලොම්බාර්ඩි පියතුමා පැවසීය. මේ අතර මාර්තු 14 දා ප.ව. 5 ට සිස්ටයින් දෙව්මැඳුරේදී දිව්‍ය පූජාවක් පැවැත්වීමට නව සසුන් පියා කටයුතු කළ අතර සාන්ත මරියා මෙජෝරි බැසිලිකාව වෙත ගොස් දේව මාතා එරැකවරණය හා වරප්‍රසාද පතා යාච්ඤා කිරීමට නියමිත විය. මාර්තු 15 පෙ.ව. 11 ට එතුමා නිල වශයෙන් කාදිනල් හිම්පාණන් සියලු දෙනා (අවු. 80 වැඩි/ අඩු සැම) අමතන අතර මාර්තු 16 සෙනසුරාදා සවැනි පාවුළු ශාලාවේදී මාධ්‍යවේදීන් සඳහා හමුවක් පවත්වයි. ඉරිදා තිරින්දාදිය යැදුමද පවත්වනු ලබනු ඇත.



# විශ්වාසය රැකගන්නට වෙහෙසෙන්නට සිදුවෙලා

**"වර්තමාන ලෝකය තුළ එළිය වසා ගෙන අඳුර පැතිරෙනවා. යක්ෂයා ලොව පුරා දුව පැන ඇවිදිනවා. අපේ විශ්වාසය රැක ගැනීම සඳහා බොහෝසෙයින් වෙහෙසෙන්නට සිදුවී තිබෙනවා."**

තලාව මීසමේ නේවාසික පියතුමන් ලෙස පත් වූ ගරු ඔගස්ටින් කාරියකරවන පියතුමා මේ අදහස් පළ කළේ පාස්කුවට සූදානම් වීමේ දෙව්පුද මෙහෙයේදීයි.

දිව්‍ය පූජාවෙන් ඉක්බිති දේව දයාවේ නුවාන පොත හා ජේසුතුමන්ගේ පින්තූරයක් සෑම පවුලක් වෙනුවෙන් පියවරුන්ටද, පුදුම පදක්කමේ ලාංඡනය සෑම දරුවන් හා තරුණ තරුණියන්ටද, දේව මාතා සළු ධාතු කරපළඳනාව මව්වරුන් ප්‍රධාන සියලු දෙනාටද බෙදා දෙන ලද අතර ජපමාලයක් නැති සෑම දෙනාට ජපමාලය බැගින් බෙදා දෙන ලදී.

ජපමාල භක්තිය, පවුලේ ජපමාලය කීම. මෙන්ම ශුද්ධ වස්තූන් ලෙස සලකා සෑම කෙනෙක්ම තමන් ලබාගත් 'දහම් සළකුණු' පරිහරණය කළ යුතු බවද එතුමන් විසින් අවධාරණය කරන ලදී.

**ඩබ්ලියු ඩී. මැටිල්ඩා අධිකාරම්**



සම්ප්‍රදායානුකූලව දූවේ ආශ්චර්යවත් ක්‍රිස්තු ප්‍රතිමාව මීගමුවේ සා. පීතර දෙව්මැඳුරේ සිට දූව සින්දාත්‍රි දෙව්මැඳුර වෙත පසුගියදා අති මහත්වූ ජනතාවකගේ සහභාගිත්වයෙන් වැඩම කරවන ලදි. මීගමුව, වැල්ලවීදිය, මහවීදිය, මුන්නක්කරේ, මංකුලිය, පිටිපන වීදිය සහ දූව මීසම්වල ජනතාව ඉමහත් බැතියෙන්, හරසරින් මෙම ක්‍රිස්තු ප්‍රතිමාව රැගෙන එද්දී මග දෙපස ජනයා පෙරහරේ ගමන් කළ සැදැහැවත් ජනතාවට සිසිල් පැනින් කළ සංග්‍රහය කාගේත් පැසසුමට ලක්විය. දූව මීසම් සේවක ගරු ෂෙල්ටන් ඩයස් පියතුමා මෙම පෙරහර අති ගාම්භීර ලෙස සංවිධානය කිරීමට පෙරමුණ ගති.

සටහන - **ඇබ්ඩන් මිහිඳුකුල** - සේයා - **ඇන්ටනි කෲස්**

## කළුතර දිසා පාදනමස්කාරය අද

කළුතර දිසා වාර්ෂික චතාරික පාදනමස්කාරය මාර්තු 17 ඉරුදින (අද) පෙරවරු 8 ට දියලගොඩ ගාළුපාර මංසන්ධියෙන් ආරම්භ වන අතර, මග්ගොන කල්වාරිය දක්වා ගමන් කිරීමෙන් පසුව, දිව්‍ය පූජා මෙහෙය පැවැත්වේ.

කළුතර දිසානායක ගරු මොරිස් නාමල් පියතුමා සමග දිසාවේ පියවරුන් විසින් මෙය සංවිධානය කරනු ලබති.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

## චතාරික ධර්මවිවේකයක්

පාස්කුවෙන් එතෙර වීමක් අත් නොදකින ජීවිතය හිස් 'ජීවිතයකි. තේමාව යටතේ චතාරික ධර්ම විවේකයක් තේවත්ත ජුබිලි ශාලාවේදී මාර්තු 23 සෙනසුරාදා ප.ව. 2.00 සිට ප.ව. 6.00 දක්වා පැවැත්වේ.

තේවත්ත මීසම් සේවක ගරු ප්‍රිය ජයමාන්න පියතුමාගේ මගපෙන්වීම යටතේ ගරු ඇන්ටන් සුධාරක පිය තුමන් විසින් පශ්චත්තාප මෙනෙහිකිරිම සිදු කරනු ලබන අතර මහාචාර්ය ඇන්ටන් මීමන මහතා නව පශ්චත්තාපික මෙහෙය පවත්වයි.

## සලාපුර විසෙන්තියාන වාර්ෂික ධර්ම විවේකය

සලාපුර පදවියේ විසෙන්තියාන වාර්ෂික ධර්ම විවේකය අප්‍රේල් 5,6,7 දිනයන්හි පදවි විසෙන්තියාන අධ්‍යක්ෂ ගරු කුවින්ටස් ප්‍රනාන්දු පියතුමනගේ ප්‍රධානත්වයෙන් හා කෝට්ටපිටිය මීසම් සේවක ගරු ක්‍රිස්ටි පෙරේරා පියතුමාගේ සහාය ඇතිව කෝට්ටපිටිය ශු. අන්තෝනි මුනිඳුන්ගේ සිද්ධස්ථාන ශාලාවේදී පැවැත්වීමට කටයුතු සූදානම්කර ඇත.

සලාපුර පදවියේ විසෙන්තියාන සමිතිවල සාමාජික සාමාජිකාවන් විශාල පිරිසක් මෙම ධර්ම විවේකය සඳහා සහභාගිවන අතර මෙහි දේශන ගරු ලසන්ත ආබෲ ජේ. නි. පියතුමන් විසින් සිදුකරනු ඇත.

**කේ. නිහාල් ප්‍රනාන්දු**



ගෝනවිල මීසමට අයත් කිරාගාර සා. අන්තෝනි දෙව් මැඳුරේ ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් ඉදිකිරීමට යෝජිත නව දිව්‍ය සත්ප්‍රසාද නිවහනට මුල්ගල තැබීම පසුගිය දා මීසම් සේවක බෝලවත්ත දිසානායක අතිගරු සිල්වෙස්ටර් විජයකුලසූරිය පියතුමා අතින් සිදුවිය.

**හියුබට් ජයසූරිය**



මෙවර මැද කොළඹ දිසාවේ දිව්‍ය හෘද සමිතියේ චතාරික වන්දනා ගමන ගරු රොෂාන් වාස් නි.ම.නි පියතුමා සමග දිසාවේ සාමාජික සාමාජිකාවන් එක්ව බුත්තල මීසම් සේවක ලෙස්ලි සුජිත් පියතුමා සමග ඥානකාන්තියක් පවත්වා පසුදින හිගුරාණ කල්වාරි පුද බිමේ පාදනමස්කාරය පැවැත්විය.

**අනුලා පීටර්සන්**



නැ/කළුවාරිප්පුව, කටාන එකමුතු මරණාධාර සමිතියට පුටු 50 ක් ප්‍රදේශයේ දයා සේවිකාවක වූ සගසැපත් අයිරින් කුරුවිට මහත්මිය සිහිගන්වා ඇයගේ පුත් චන්න හෙට්ටිආරච්චි යුවළ පරිත්‍යාග කළහ. එම අවස්ථාවට ගරු බර්නාඩ් නෙවිල් නේවාසික පියතුමා සහ සමිතියේ සාමාජික සාමාජිකාවෝ එක්වූහ.

**සුනිල් ප්‍රනාන්දු**

# පයාගල අධ්‍යාත්මික සහ මානව සංවර්ධන ප්‍රබෝධයක්



පයාගල මීසමේ කුඩා පයාගල පරලෝක රාජේශ්වරියගේ දෙව්මැඳුරට අනුබද්ධිත දෙව්මැඳුර හා මානව සම්පත් සංවර්ධනය නමින් විශේෂ ව්‍යාපෘතියක් ජනතාවට සේවය සැලසීම සඳහාම අරමුණු කොට ගෙන දෙව්මැඳුරේදී පිහිටුවා ගන්නා ලදි.

පයාගල මීසම් සේවක ගරු නිලන්ත උඩුවක පියතුමාගේ අනුශාසකත්වයෙන් හා සහභාගිත්වයෙන් පිහිටුවා ගත් මීට විවිධ කමිටු කීපයක් ඇතුලත් වන අතර ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා එහි අධ්‍යාපන කමිටුව මගින් මේ වන විට 5 වසර ශිෂ්‍යත්ව පන්තිද අනිකුත් ශ්‍රේණි සඳහා ගණිත, විද්‍යා, ඉංග්‍රීසි විෂයන් පිළිබඳ පන්තිද ප්‍රදේශයේ පළපුරුදු, දක්ෂ ගුරුවරුන් යටතේ නොමිලේ ආරම්භ කර ඇත.

අධ්‍යාත්මික පෝෂණ කමිටුව අනුග්‍රහයෙන් චතාරිකය වෙනුවෙන් වැඩසටහන් කීපයක්ද, පවුල් යාච්ඤා, පවුල් බැහැදැකීම්, දේව වචනය පිළිබඳ දැනුවත් කිරීම ආදිය ක්‍රියාත්මක කරන අතර, විශේෂයෙන් පවුල් පෝෂිත වැඩ සටහන් මාලාවක් ගරු පැට්‍රික් පෙරේරා පියතුමා හා මහාචාර්ය ඇන්ටන් මීමන මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කර ඇත.

සමාජ සේවා කමිටුව මගින් බෝ නොවන රෝග පිළිබඳ සායනයක්ද, ජනතාවගේ පෝෂණය පිණිස විවිධ වැඩ සටහන් කීපයක්ද ඉදිරියේදී ක්‍රියාත්මක වේ. දෙව්මැඳුර හා භූමිය සංවර්ධන කටයුතුද එම කමිටුව මගින් සිදුකෙරේ. මෙම සියලු කටයුතු වල අවශ්‍යතාවයන් සඳහා ජනතාවගේ සියලු දත්ත එක්රැස් කිරීම අරමුණු කර ගෙන විශේෂ කමිටුවක් මගින් සෑම පවුලකටම විශේෂ පත්‍රිකාවක් ලබාදී ඇත. මේ සියලු කටයුතු සඳහා මුදල් සපයා ගැනීමේ අරමුණින් දෙව්මැඳුරට අයත් මීසම් ජනතාවගෙන් තම තමනට හැකි අයුරින් මාසික දායකත්වයක් ලබාදෙන ලෙස කළ ඉල්ලීමට යහපත් ප්‍රතිචාර ලැබී ඇත.

**ජී. නිහාල් ප්‍රනාන්දු**

## විශේෂප සිකුරාදා නාගොඩ පසන් ගායනා

කළුතර, නාගොඩ මීසමේ පළමු වතාවට පැවැත්වෙන පසන් ගායනා වැඩසටහන මාර්තු 22 වික්ෂෝප සිකුරාදා ප.ව. 6.15 ට දෙව්මැඳුරු භූමියේදී පැවැත්වේ. මෙදින මීගමුව, පිටිපන හා දූව නාගොඩ කණ්ඩායම් පසන් ගායනා ඉදිරිපත් කරන අතර පසන් ගායනය පිළිබඳව විශේෂ දෙසුමක්ද පැවැත්වේ.

මීසම් සේවක ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමාගේ අනුශාසකත්වයෙන් මීසම් ධර්ම සේවා සභාව හා තරුණ සමිතියේ සහයෝගයෙන් මෙදින කටයුතු සංවිධානය කෙරේ.

**කුමර නයනජිත්**

## වාද්දුවෙන් මාවතගම කල්වාරියට

වාද්දුව මීසම් සේවක ගරු ජුඩ් සුරාජ් ෆොන්සේකා පියතුමාගේ සංවිධානයෙන් මීසම්වාසි ජනතාව පසුගිය පොහෝ දින මාවතගම කල්වාරිය වෙත වන්දනා චාරිකාවක යෙදුනි. බස්රථ නමයකින් සමන්විත මෙම වන්දනා නඩය පාදනමස්කාර ගමන ආරම්භ කර 12 වන ස්ථානයේදී දිව්‍ය පූජාව පවත්වන ලදි.

ගරු පියතුමන් තිදෙනකු විසින් එක් එක් ස්ථානයන්හිදී වන්දනාකරුවන් අධ්‍යාත්මික ධ්‍යානයකට යොමු කරමින් චතාරිකය සම්බන්ධව කිතුනු ජීවිතය නව මගකට යොමුවිය යුතු ආකාරය සවිස්තරාත්මකව විස්තර කර දෙන ලදී. දිවා ආහාරයෙන් පසු සියල්ලෝ ආපසු පැමිණියහ. මේ සඳහා වාද්දුව මීසමට අයත් මොල්ලිගොඩ දේවස්ථානයේ පිරිසක්ද සහභාගි වූහ.

**බර්නාඩ් විල්ෆ්‍රඩ් ප්‍රනාන්දු**

# කීරිමනා කල්වාරිය

පුදබිමක අසිරිය

මන්නාරම ක්‍රිස්තුරාජ දෙව් මැඳුර ආරම්භ වූයේ 1985 ඔක්තෝබර් 29 දින මන්නාරමේ තාල්පාඩු පාරේ කීරි නම් ගම්මානයේ ය. අන්තෝනිපිල්ලේ, සුසිපිල්ලේ නමැති අයකු තාරවන්කෝට්ටේ හි පදිංචිකරුවකු වූ සෙබවල්ලි නමැති අයකුගේ ද සහය ඇතිව කුටියක් තනා එහි යැදුම් කිරීමට පුරුදු වී සිටියහ. කීරි ගමේ පදිංචිව සිටි සවුන්දරම් හා තිල්ලායි නමැති හින්දු ආගමික දෙදෙනකු ද ඔහුට මීට උදව් කර ඇත. මෙම කුටිය දැව කඳන් හා තල් අතුවලින් සැදුණ එකකි. එහි ජුසේතුමාගේ හා දේවමෑණියන්ගේ ප්‍රතිමා ද ස්ථාපිත කර ඇත.

ද ලාසාල් අධ්‍යක්ෂ හිලරි සහෝදරතුමා එහි ගොවිපළ ද භාරව සිටි අතර එතුමාට මෙම කුටිය දැක ගන්නට ලැබී එතුළට පිවිසුණි. එතුමා දණ ගසා යාච්ඤා කළේ ය. සුසේ නමැත්තා මෙම කුටිය ඉදිකර තිබුණේ අනවසරයෙන් නිසා ඔහුට යම් බියක් ද ඇති වී තිබුණි. නමුත් හිලරි සහෝදරතුමා මෙම කුටිය ඉදිරි කාලයේදී ලොකු දෙව් මැඳුරක් බවට පත්වන බව ඔහුට පවසා ඇත. ජේසුතුමා පවා ඉපදුණේ ගව මඩුවක බව ද එතුමා පවසා ඇත. මෙම කුටිය ක්‍රිස්තුරාජ දේව මන්දිරයක් කරන්නට තමා සිතන බව ද සුසේ නමැති අය කියා ඇත. පසුව හිලරි සහෝදරතුමා ඔහුට ක්‍රිස්තුරාජ ප්‍රතිමාවක් ලබාදීමට කැමැත්ත පළකර ඇත. එතුමා කොළඹින් ගෙනැවිත් දුන් අඩි 3 ක ක්‍රිස්තු ප්‍රතිමාව මෙම කුටියේ ස්ථාපිත කරනු ලැබූහ.

ගරු එමලියානුස්පිල්ලේ පියතුමා තාල්පාඩු මීසම බාරව සිටි සමයේ මෙහි මුල් පූජාව 1989 සිකුරාදා දිනක පවත්වා ඇත. 1996 වන විට පැවැති යුද්මය තත්ත්වය නිසා වංගාලෙ, කොන්තයාන්, නාගතාලු ඇතුළු ප්‍රදේශවල ජනතාව මන්නාරමට පැමිණ එහි පදිංචි වූහ. සමහරු ඒ කීරි ගම්මානයේ පදිංචි වූහ. මේ සරණාගත වැඩි දෙනා කතෝලික නිසා ක්‍රිස්තුරාජ පල්ලියට පැමිණ ඇත. 1993 සිකුරාදාවක මන්නාරම රදගුරු අතිඋතුම් රායප්පු ජෝශප් රදගුරුතුමා හදිසියේ මෙම පල්ලියට පැමිණ ඇත. එහි සිටි සැදැහැවතුන් දුටු එතුමා සෑම සිකුරාදා දිනක ම එහි දිව්‍ය පූජාව පවත්වන්නට කටයුතු කළේය.

1998 පාස්කු සමයේ චතාරිකයේ 6 වන සිකුරාදා තාල්පාඩු ගම්මානයේ සිට කීරි ගම්මානය දක්වා පාදනමස්කාරය සංවිධානය කර පූජාවක් පවත්වනු ලැබීය. 2001 දී මෙම මීසමට පත්වූ ගරු නෝබට් පියතුමා සැදැහැවතුන්



සංඛ්‍යාව වැඩිවන බව දැක දේවස්ථානය නවීකරනය කිරීමට පියවර ගත්හ. සරණාගතයන් නිසා මෙහි පවුල් සංඛ්‍යාව 2004 වසර වන විට 110 ක් දක්වා ඉහළ ගොස් ඇත. මෙම දේවස්ථාන භූමිය ද ලාසාල් සහෝදරවරුන්ට අයිති නිසා පල්ලියට ඉඩමක් මිලදී ගෙන අලුත්ම පල්ලියක් තැනීමට මන්නාරම් රදගුරු හිමිපාණන්ගේ අදහස විය. නව දෙව්මැඳුර සඳහා ඉඩමක් මිලදී ගෙන ඊට මුල්ගල තබා, රදගුරු හිමිපාණන් විසින් විවෘත කරන ලදී. 2004.12.22 දින තාල්පාඩු මීසමට ගරු ඥානතිකම් පියතුමා පැමිණ ඇත. 2005 සිට මෙහි ඉරුදින දිව්‍ය පූජාව ද පවත්වන්නට පටන්ගෙන ඇත.

2009 ජනවාරි 18 දා ඉලුන්තුර් නමින් අලුත් මීසමක් පටන් ගත් අතර මේ පල්ලිය ඊට සම්බන්ධ කෙරුණි. නව පූජකතුමා වූයේ ගරු ලියෝ මරියදාස් පියතුමා ය. ප්‍රධාන පූජක ගරු වික්ටර් සුසෙයි පියතුමා දේවස්ථාන මංගල්‍යය මැයි 24 දා පැවැත්වීමට තීරණය කළේය. අතිඋතුම් රායප්පු ජෝශප් රදගුරු හිමි මේ දෙව් මැඳුර 2010.05.15 සෙනසුරාදා අභිෂේක කළ අතර මැයි 16 දා මංගල මහා දිව්‍ය පූජාව එහි පවත්වා ඇත.

කල්වාරියේ මීසම් සේවක ලෙස ගරු ලියොන් පියතුමා කටයුතු කරන අතර, වැඩි විස්තර ගරු පියතුමාට කතා කර දුරකථන අංක 023-3230700 මගින් ලබාගත හැකිය.

**මැක්ෂිමස් රෝයි පෙරේරාගේ ශ්‍රී ලංකා කල්වාරි ග්‍රන්ථයෙනි**

# අර්ථවත් චතාරිකයකට මඟ

**අප මේ පිවිස සිටින්නේ චතාරික සමයටය. අප මිදුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා පුනර්ජීවනය මෙනෙහි කරන කාලයට ය. ලොව පුරා වෙසෙන කෝටි සංඛ්‍යාත කිතුනුවන් මහත් භක්තියකින් හා ජ්වලිත කමකින් ස්මරණය කරන චතාරික සමය වරප්‍රසාදීය කාලයක් ලෙස සලකති. ස්වකීය සැලසුම් පසෙකට දමා, ස්වකීය කැමැත්ත දෙවැනි කොට සලකා, දේව සැලැස්මට හා දේව කැමැත්තට පළමු තැන දී ජීවිත වෙනසක් අත්දකින්නට සූදානම්වීම වරප්‍රසාදීය කාලයක් හිමිකර ගැනීමට යෝග්‍යයම මඟයි.**

කිතුනු අප බොහෝ දෙනෙක් ජීවත් වන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ "සමඟ" ය. එසේ උන්වහන්සේ "සමඟ" ජීවත්වීම අවිනිශ්චිත දිවි පැවැත්මකි. අවශ්‍ය වූ විට අපට උන්වහන්සේ අමතක කළ හැකිය. උන්වහන්සේගේ දහමින් ඉවත් වී වෙනත් ආගම් සොයා යා හැකිය. විශ්වාසයෙන් හා ඇදහිල්ලෙන් තොර මාවතක ගමන් කළ හැකිය. සැකය, අවිශ්වාසය හා අභක්තිය ඕනෑම මොහොතක ඉස්මතු විය හැකිය. ධර්මිෂ්ඨකම වැළලී ගොස් අධර්මිෂ්ඨකම උපත ලැබිය හැකිය. ඒ අනුව "සමඟ" ජීවත්වීම ආත්මාර්ථකාමී හැඟීමකි. ක්‍රියාවකි.

එහෙත් ක්‍රිස්තුන් වහන්සේ "තුළ" ජීවත්වීම පරාර්ථකාමී හැඟීමකි. ක්‍රියාවකි. උන්වහන්සේ "තුළ" ජීවත් වීම, ගැඹුරට හාරා ගලක් මත ඉදිකළ නිවසක් හා සමානය. එතරම්ම බලවත් වන්නේ ය. කිසි විටෙක උන්වහන්සේ අමතක කළ නොහැකිය. උන්වහන්සේ අතහැර යා නොහැකිය.

ක්‍රිස්තුන් වහන්සේ "තුළ" ජීවත් වන්නා දේව සැලැස්මට අනුගතව ජීවන පැවැත්ම ගෙන යන්නෙකි. දේව කැමැත්තට අවනතව හා එකඟව ජීවත්වීමට ශක්තිය හා හැකියාව ලබන්නෙකි. හෘදය සාක්ෂ්‍යයට භය පක්ෂව දිවිය ගලා යන්නට සලස්වන්නෙකි. දුක, වේදනාව, සතුට - සොම්නස, මර්දනය, පීඩාව හා ඉවසීම - නිදහස සමබරව පවත්වා ගැනීමට ශක්තිය හා ධෛර්යය ලබන්නෙකි.

මෙලෙස අප ක්‍රිස්තුන් වහන්සේ "සමඟ" නොව, උන්වහන්සේ "තුළ" ජීවත්වීම අරඹන කල, අප තුළ නොසැලෙන හා නොනැසෙන විශ්වාසය, ඇදහිල්ල, ශ්‍රද්ධාව, භක්තිය හා ජ්වලිතකම දළු ලා වැඩෙන්නට ආරම්භ වන්නේ ය. ධර්මිෂ්ඨකම උපදින්නේ ය. වරප්‍රසාදීය කාලයකට සියළු දොර - කවුළු විවර වන්නේ ය.

මිනිස් අප ස්වභාවයෙන්ම දුබලය. වරදට පෙළඹෙන සුළුය. නිරායාසයෙන්ම පාප ප්‍රස්ථාවලට ගොදුරුවන සුළුය. එබැවින් ගෙවී යන මෙම චතාරික සමය තුළ, අප සතු ඒ දුබලකම්, වැරදි හා අඩුපාඩුකම් ඉවතලා, අර්ථවත් ජීවිත ගත කරන්නට, ක්‍රිස්තුන් වහන්සේ "තුළ" ජීවත් වන්නට දැඩි ලෙස අධිෂ්ඨාන කර ගැනීම, වරප්‍රසාදීය කාලයකට අත වැනීමකි. ඒ සඳහා සමඟි සන්ධානයේ ප්‍රසාද නිධානය හෙවත් පාපොච්චාරණය නමැති ප්‍රබල අවිය ක්‍රිස්තුන් වහන්සේ විසින්ම අපට දෙවා වදාළ සේක. පාපොච්චාරණය, ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ දිනයේදී ස්ථාපිත කළ ප්‍රසාද නිධානයකි.

යහපත් පාපොච්චාරණයක් කිරීමට අත්වැලක්

ඉතාම යහපත් පාපොච්චාරණයක් කිරීම සඳහා පිළිපැදිය යුතු ප්‍රධාන කරුණු පහක් පෙන්වා දිය හැකිය.



i. තමා කළ වැරදි, පව් සිහි කර ගැනීම
ii. ඒවාට අවංක ලෙස පසුතැවිලි වීම
iii. මින් මතුවට වැරදි, පව් නොකිරීමට අධිෂ්ඨාන කර ගැනීම
iv. කළ සැම පාපයක්ම, වරදක්ම නොසඟවා පූජාප්‍රසාදිතුමාට පැවසීම.
v. පූජාප්‍රසාදිතුමා නියම කරන දඬුවම් ක්‍රියාත්මක කිරීම.

අප කරන වැරදි හා පව් නිසි ලෙස මතක් කර ගැනීම සඳහා දස පනත උපයෝගී කර ගැනීම සුදුසුම ක්‍රමය වෙයි. දස පණතේ එක් එක් පණතට එරෙහිව අප විසින් කරනු ලබන පව් හා වැරදි මොනවාදැයි දැන ගැනීම පාපොච්චාරණයට පහසු මඟක් වන්නේ ය.

**1) සැබෑ වූ එකම දෙවියන්ට පමණක් වන්දනා කරන්න.**
- ★ දෙවියන් මවා ඇති මැවිලි වලට දේවත්වයෙන් පිදීම.
- ★ වෙනත් දෙවි දේවතාවුන්ට බාරහාර වීම.
- ★ දෙවියන්ට වන්දනා කිරීමට අතපසු කිරීම.
- ★ දෙවි කෙනෙක් නැතැයි සිතා කටයුතු කිරීම.
- ★ දෙවියන් කෙරෙහි බලාපොරොත්තු නැතිකර ගැනීම.
- ★ දෙවියන්ගෙන් නොලද බලයක් තමාට ඇතැයි සිතා ක්‍රියා කිරීම.
- ★ මූලධර්මවාදීන් පසු පස යාම.
- ★ ශුද්ධ ලියවිල්ල වැරදි ලෙස අර්ථකථනය කිරීම.
- ★ යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම්, හූනියම් කිරීම.
- ★ අංජනම් බැලීම හා නැකැත් බැලීම.
- ★ පොරොන්දම් බැලීම.
- ★ නැකතට මුල්ගල් තැබීම. දොර උළුවහු තැබීම, අකුරු කියවීම හා සෙත් ශාන්ති කරවා ගැනීම.
- ★ වෙනත් ආගමික ස්ථානවලට ගොස් මල්, පහන්, පළතුරු වට්ටි පිදීම.
- ★ පිරිත් නූල් ගැට ගැසීම හා පිරිත් පැන් බීම.
- ★ ධනය, බලය, කීර්තිය, දේපල හා ආභරණ පසුපස හඹා යාම.

**2) දෙවිඳුන්ගේ ශ්‍රී නාමය ගෙන නිගරු ලෙස භාවිත නොකරන්න.**
- ★ දෙවියන් ඇපයට තබා දිවුරීම.
- ★ දෙවියන් නමින් අන් අයට සාප කිරීම හා අයහපත ප්‍රාර්ථනා කිරීම.
- ★ ශුද්ධවූ වස්තූන්, දේව වචනය අගෞරව ලෙස භාවිත කිරීම.
- ★ එදිනෙදා සිදුවීම් වලදී දෙවිඳුන්ට බැණ වැදීම.
- ★ තමන් අතින් සිදුවූ පාපයන් හා වැරදි දේව කැමැත්ත ලෙස සාධාරණීකරණය කිරීම.
- ★ කිතුනුවකු ලෙස කිතුනුකමට සාක්ෂි නොදැරීම.

**3) ඉරුදින ශුද්ධ ලෙස ගත කරන්න.**
- ★ සිතා මතා ඉරුදින හා ණය මංගල්‍ය දිනවල දිව්‍ය පූජාවට සහභාගි නොවීම.
- ★ දිව්‍ය පූජාවට සහභාගි නොවී විනෝද ගමන් හා උත්සව, සාද සඳහා සහභාගි වීම.
- ★ දිව්‍ය පූජාවට ප්‍රමාද වී පැමිණීම හා අවසන් වීමට පෙර පිට වී යාම.
- ★ දිව්‍ය පූජාව තුළ අවබෝධයෙන් නොසිටීම.
- ★ දිව්‍ය පූජාව වෙලාවේ අනවශ්‍ය කතාවේ යෙදීම, පුවත්පත් බැලීම, ජංගම දුරකථන ක්‍රියා කරවීම හා උසුළු විසුළු කිරීම.
- ★ දිව්‍ය පූජාවට ක්‍රියාකාරීව සහභාගි නොවීම.
- ★ අන් අයට බාධා වන අයුරින් හැසිරීම.
- ★ අනවශ්‍ය ඇඳුම්, පැළඳුම් හැසිරීම තුළින් අන් අයගේ අවධානයට බාධා කිරීම.
- ★ ශීල රැකීම, ගොඩමස් කෑමෙන් වැළකීම ආදී ශුද්ධවූ සභා නියෝග ඉටු නොකිරීම.

**4) මවට ද, පියාට ද ගෞරව කරන්න.**
- ★ දෙමාපිය, වැඩිහිටියන් නොසැලකීම, ඔවුන්ට අගෞරව කිරීම.
- ★ මව්පියන්ට හිරි හැර කිරීම, බැණ වැදීම, පහර දීම හා ඔවුන්ව හුදකලා කිරීම.
- ★ දෙමාපිය, වැඩිහිටියන්ට අකීකරු වීම, සිත් රිදවීම හා ඔවුන්ගේ බලාපොරොත්තු කඩකිරීම.
- ★ දෙමාපියන් ලබා දුන් නිදහසින් අයුතු ප්‍රයෝජන ගැනීම හා ඔවුන් රැවටීම.
- ★ දෙමාපියන් සතු වස්තුව, දේපල, නම්බුව විනාශ කිරීම.
- ★ දූ - දරුවන් ලෙස තමන්ට පැවරී ඇති යුතුකම් හා වගකීම් පැහැර හැරීම.

ඉදිරියට

✍ වසන්ත පී. ඒ. රත්නායක
රද්දොළුගම

# ශුද්ධවූ ජුසේ මුනි ජීවිතයෙන් බිඳක්...



**දාවිත් රජ පරපුරේ රාජ වංශිකයෙක්ව ශුද්ධවූ ජුසේ මුනිඳු උපන්නේ ය. එතුමාගේ මුතුන් මිත්තන් අතරේ ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ්, ජුසේ නමැති ආදිපිතෘන්ද, සලමොන්, එසේකියස්, ජොසියස් යනාදි රාජ දරුවෝ ද සිටියහ. එතුමන්ගේ දෙමාපියන් රාජකීය වංශයෙහි උපන් නමුත් දිළිඳු වී ධර්මිෂ්ඨකමින් පමණක් පොහොසත් වී සිටියහ.**

දෙවි බිළිඳා ඉපදී දින අටකට පසුව ළදරු කුමරුට චර්මඡේදන පිළිවෙත සිදු කළ බව කියැවේ. එම පිළිවෙත ඉතා වේදනාකාරී බවත් කියැවේ. ඒ වනාහි චර්මඡේදනය කරනු ලබන ළදරුවාගේ මාංශ ටිකක් කපා එයින් ලේ බිඳක් වැගිරීමට සැලැස්වීමය. එම පිළිවෙතට දිව්‍ය බිළිඳා ද ලක්වී එතුමාණන්ගේ පළමු ලේ වැගිරීම මෙදින සිදුවී ඇත. මෙය දෙව්මව් සහ ජුසේ තුමාණන් අත්දුටු දැඩි වේදනාවක් විය. (තවද ශු. ජුසේ තුමන් විඳි වික්ෂෝප හතෙන් තුන් වැන්න මෙය විය.) ඉන් පසුව "ජේසුස්" යන ශ්‍රී නාමය එතුමාණන්ට තබා ඇත.

ශු. ජුසේ තුමා හා දෙවි මව් දින 40 කට පසුව දිව්‍ය බිළිඳා රැගෙන ජෙරුසලෙම් දේව මාලිගාවට ගොස් බිළිඳු කුමරුන්ව පූජා කළ බව කියැවේ. පුරාණ වේද නීතිය අනුව කුළුඳුල් පිරිමි දරුවකු උපන් කල එම මව් දින 40 ක් ද ගැහැනු දරුවකු උපන් කල දින 80 ක් ද නිවසේ රැඳී සිට පවිත්‍ර වීමේ පිළිවෙතට අනුව දෙව්මැඳුරට යා යුතු වේ. කන්‍ය මරිය තුමිය ද එම පිළිවෙතට නතු වී කොබෙයි කුට්ටමක් පූජා කර නැවත සුළු මුදලක් දී දෙවි බිළිඳා දෝතට ගත් බව කියැවේ.

ඒ අවස්ථාවේදී වියපත් වූ සිමියොන් නම් ධර්මිෂ්ඨ දිවැස්ප්‍රසාදිවරයකු එතැනට පැමිණ දිව්‍ය බිළිඳා තම දෑත් වලින් වඩා ඉහළට ඔසොවා මහත් ප්‍රීතියෙන් හඬ නගා දෙවියන් වහන්සේට ස්තූති කර, "ඊශ්‍රායෙල් ජනයන්ට මහිමය වූද සියළු ලෝ වැසියනට ආලෝකය වූද දිව්‍ය ගැලවුම්කාරයාණන් වූද මේ දරුවා බොහෝ දෙනෙකුගේ විනාශයටත්, උත්ථානයටත් හේතු වන්නේය." යන දිවැස්වැකිය වැදෑරීය. දෙවි මව් දෙස බලා "නුඹේ ආත්මය කඩු පහරකින් අනිනු ලබන්නේ"යැයි පැවසීය. මේ වචන ඇසූ දෙවි මව් සහ ශු. ජුසේ තුමන් දැඩි කම්පාවට පත් වූ බව කියැවේ. එය ශු. ජුසේ තුමා විඳි හතරවැනි වික්ෂෝපය බව සඳහන්ව ඇත.

සිමියොන් දිවැස්ප්‍රසාදින් පැවසූ ලෙසම එම දිනවලදීම හෙරෝද් රජතුමාගේ පීඩා සමය ඇරැඹිණි. රජවරුන් තිදෙනා දිව්‍ය බිළිඳුන්ට පඬුරු පුදා ආපසු හෙරෝද් රජ වෙත නොපැමිණීම නිසා ඔහුගේ බලාපොරොත්තුව ඉටු නොවුණි. ඔහුගේ අභිප්‍රාය වූයේ ඔහුද ගොස් පඬුරු පුදා අනතුරුව දිව්‍ය බිළිඳා මරා දැමීමය. ඔහුගේ කෝපය අධික විය. ඔහු රාජ අණක් පනවා බෙත්ලෙහෙම් නුවර සහ අසළ පළාත්වලද විසූ අවුරුදු දෙකකට අඩු සියළුම බිළිඳු දරුවන් මරන්ට නියම කළේය. ඒ අණ නිකුත් වූ විගසම දේව දූතයෙක් සිහිනයකින් ශුද්ධවූ ජුසේ තුමාට දර්ශනය වී "වහාම දිව්‍ය බිළිඳා හා මෑණියන් ද කැටුව ඊජිප්තු දේශයට පිටත් වී යන" ලෙස දැන්වීය. තවද හෙරෝද් රජ දිව්‍ය බිළිඳාණන් මරන්ට සොයන බව ද පැවසීය. ශු. ජුසේ තුමා බියපත් වූ දේව අණට කීකරුව එවෙලේම මෑණියන් ද ශ්‍රී කුමාරයාණන් ද කැටුව ඒ දුෂ්කර ගමනට පිටත් වී ඇත.

සැතපුම් හාරසිය පනහක දුරක් ගෙවමින් මං පහරණ හොරුන් ද වන මෘගයන් ගැවසෙන ඝන වනාන්තර මැදින් ඔවුනට යෑමට සිදුවිය. එවිට මරියතුමියගේ වයස අවුරුදු 15 ක් වූ බව කියැවේ. මේ ශුද්ධවූ පවුල ඉතා දුෂ්කර ගමනින් පසු ඊජිප්තු දේශයට ළඟා වූ විට එම පළාතේ තිබූ යක්ෂ කෝවිල්, පීඨක, යක්ෂාරූප මහ පොළොවට ඇද වැටී සුනු විසුනු වී ගිය බව පොත්වල සඳහන්ව ඇත. මේ ශුද්ධවූ පවුල "පලියෝ පොලිස්" නුවර පදිංචිවී සිට ඇත. එම අවධියේදී මෙම ශු. පවුල ඉතාම දුප්පත් වී සිටි බවද, ජීවත් වීමට මුදල් නොමැතිව සිටි බවත් විදේශිකයන් නිසා එම රටේ භාෂාවද නොදත් බැවින් කිසිම ගනු දෙනුවක් කර කියාගත නොහැකිව සිටි බව ද කියැවේ. ඇතැම් විට දී ළදරු කුමාරයා "අම්මේ බඩගිනී" කියා හැඬූ කල උන්වහන්සේට දීමට කෑමක් නොමැතිව මරියතුමී කඳුළු සලමින් සිටි බවද වේද පණ්ඩිතවරුන් පවසා ඇත. ශු. ජුසේ තුමා අධික ලෙස මහන්සි වී වඩු වැඩ කළ අතර මරියතුමිය මැහුම් ගෙතුම් වල නිරත වෙමින් මුදලක් සොයා ගැනීමට උත්සාහ කළ බව ද සඳහන් වේ.

පුත් කුමරාද පස් අවුරුදු වියේ පටන් හැකි පමණ වැඩ කරමින් මා පියන්ට යටහත්ව සිටි බව පැවසේ. දෙවි කුමරාට වසර හතක් වන විට එතුමාණන්ව මරන්නට සෙවූ කෲර හෙරෝද් රජුට භයානක රෝගයක් වැළඳී සියල්ලන්ට පිළිකුල් වී කාලකන්නි මරණයකට පත් වී ඇත. ඉන් පසුව නැවත ශුද්ධවූ ජුසේ මුනිඳුන්ට දේව දූතයා සිහිනයකින් දර්ශනය වී ඊශ්‍රායෙල් දේශයට හැරී යන මෙන් දන්වන ලදි. එවිට ශු. ජුසේ තුමා දෙවි කුමරා සහ මරියතුමියද කැටුව ආපසු පැමිණ ඇත. එවකට එම දේශයේ රජ කළ අර්කෙලවුස් රජුගෙන් දෙවි කුමරාට විපතක් සිදුවේදෝ යන බිය එතුමාගේ සිත්හි රැඳී ඇත නමුදු දේව දූතයාගේ අණ ප්‍රකාර "නාසරෙත්" නුවර පදිංචි වී සිට ඇත. ජේසුතුමාට "නසරේණු" යන නම ලැබී ඇත්තේ මේ කාලයේදීය.

පුරාණ වේද නීතිය අනුව වසරක් පාසා සෑම අයෙක්ම තුන් වරක් ජෙරුසලෙම් දෙව්මැඳුරට යා යුතු විය. එකල ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම මයඞ්දාවට අනුව දෙව් මැඳුරට ළඟා වීමට මත්තෙන් පාරවල් දෙකකින් ගොස් අනතුරුව එක් මාවතකට යොමු විය යුතු විය. මෙම ශු. පවුලද දෙව්මැඳුරට ගොස් නිසි යුතුකම ඉටු කර ආපසු ඒමට පිටත් වී පාරවල් එක්වන තැනේදී මුණ ගැසුනි.

නමුත් දෙව්කුමරා මඟ හැරී මොවුන් දෙදෙනාගෙන්ම වෙන්වී ඇති බව දැන ගත් විට ඔවුන් දෙදෙනාගේම හදවත් දුකින් වෙළී ඇත. (මෙය ශු. ජුසේ තුමා අත් දුටු හත් වැනි වික්ෂෝපය විය.) ඔවුන් දෙදෙන පුරා දින 3 ක්ම ශෝකයට පත්ව එතුමාණන්ව සොයමින් ආපසු දේව මාළිගයට පැමිණියේය. එහිදී ශ්‍රී කුමාරයාණන් වේද පණ්ඩිතයින් මැද ප්‍රශ්න විචාරමින්, දේශන පවත්වමින් සිටි බව දැක ඔවුන් ප්‍රීතියෙන් පිනා ගොස් ඇත.

ශු. ජුසේ තුමා මුළු ජීවිත කාලයෙහිම වඩු වැඩෙහි යෙදෙමින් සුදු පවුල ජීවත් කරවීමට වැය වී ඇත. එතුමාණන් සහ ශ්‍රී කුමාරයාණන් එක්ව සෑදූ නඟුලක් සහ විය ගහක් ද", ශු. සභාව ආරම්භයේදී තිබූ බව ශු. ජුස්තිනස් තුමා ප්‍රකාශ කොට ඇත. තවද ශු. ජුසේ තුමා දේව මෑණියන්ගේ පතිතුමා වීමට තෝරාගත් මොහොතේ දී එතුමාණන්ගේ හස්තයේ තිබී ඇති හැරමිටියේ මල් පිපී ඇත. එම "සැරයටිය නෙයාපොලී" නගරයේ ද, මෑණියන් හට ජුසේ තුමා පැළඳ වූ මුදුව "පෙරුෂියා නුවරෙහි ද" ගෞරවාන්විතව සුරක්ෂිතව තබා ඇති බව පොත්වල සඳහන්ව ඇත.

ශු. ජුසේ තුමා වැඩක යෙදීමට නොහැකි තරමට ගතින් දුබල වූ විට ඒ බව එතුමාණන්ට ද, ශ්‍රී කුමරාණන් හට සහ මරියතුමියට ද දැනී ඇත.

☛ 15 පිටුවට

✍ කුසුම් පීරිස්
කිඹුලාපිටිය

ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

**දෙවැනි සතිය අඟහරුවාදා සැඳෑ යාම යැදුම**

## 49 වැනි ගීය

මෙම ගීය අයත් වන්නේ ප්‍රඥා ගී කාණ්ඩයටය. එහි අන්තර්ගතය හා ලේඛන ශෛලිය සලකා බැලීමේදී එය ප්‍රඥා සම්ප්‍රදායේ මූලික කරුණු පැහැදිලි කරන අපූර්ව පාඩමක ස්වරූපයක් දරන බව පෙනේ.

මෙලොව සමාජයීය පැවැත්ම තුළ හුදෙක් ධන සම්පත් කෙරෙහි විශ්වාසය තබා ජීවත්වීම අනුවණ ක්‍රියාවක් බව මින් අවධාරණය වේ. විශ්වයේ ද ජීවිතයේ ද නිර්මාතෘවරයාණන් වන දෙවියන් වහන්සේ වෙත යොමුවීමේ මූලික අවැසියාව ගීතිකා කතුවරයා සියුම් ලෙස මේ ගීය තුළින් ඉස්මතු කරයි. විවිධ තත්ත්ව යටතේ දරිද්‍රතාව, බෙලහීන බව අත් දකින අය සඳහා දිරිගැන්වීමේ ඔවදනක් ද මෙහි දිස්වන්නේ ය.

**ලේඛන සැලැස්ම**

වගන්ති 1-4 : ප්‍රඥාවේ ඔවදන් පිළිගැනීම සඳහා විශ්ව ඇරයුම

වගන්ති 5 - 12 : ධන සම්පත්වල අස්ථාවර පදනම සහ මරණයේ නියත යථාර්ථය

වගන්ති 13-20 : ධන සම්පත් මත යැපීමේ සහ දෙවි සමිඳාණන් මත යැපීමේ වෙනස

**විග්‍රහය සහ අරුත**

(අ) වගන්ති 1-4 :

ප්‍රඥාවේ ප්‍රතිපත්තිවලට සහ ඉගැන්වීම්වලට සවන් දීම සඳහා කෙරෙන මෙම පොදු ඇරයුම තුළ දිවැසිවර ප්‍රකාශන ස්වරූපයක් දිස්වේ. එය විශ්වය පුරා විසිර වෙසෙන ජනයන් වෙත යොමු වූවකි.

මෙය අසන්න : මෙම යෙදුම ප්‍රඥා සම්ප්‍රදායෙහි ඉගැන්වීම් ඉදිරිපත් කිරීම සඳහා භාවිත කෙරෙන හැඳින්වීමේ ඇමතුමකි (උත්. 4:23). එය දිවැසි වදනක් නොවූවත් දිවැසි ප්‍රකාශන ශෛලිය හා සමාන්තර බවක් පෙන්නුම් කරයි. (යෙසායා 1:2, මිකා1:2)

ලොකු කුඩා

මෙවැනි සංසන්දනාත්මක පද යුගල හෙබ්‍රෙව් ලේඛන සම්ප්‍රදායෙහි අර්ථයන් තීව්‍ර කිරීම සඳහා යොදා ගැනෙයි. හෙබ්‍රෙව් බසින් එන "බේනේ ඉෂ් උබේනේ අදාම්" යන පද යුගළයෙන් "උසස් සහ පහත්" සමාජ මට්ටම්වල සිටින්නන් සංක්ෂිප්තව දැක්වේ. එය "දුප්පත් සහ පොහොසත්" පද යුගළ හා සබැඳීය. (ගීතා 62:10).

නැණවත් සිතිවිලි.....

ගුණවත් වදන්

මේවා මිනිස් ජීවිතයේ ගැඹුරු බව පෙන්වන, අවබෝධ කරවන ප්‍රඥාවේ සංකල්ප සහ ප්‍රකාශන වේ. ඒ සමගම යෙදෙන හිතෝපදේශ විසඳුම් ආදි යෙදුම් උපමාත්මක, තේරවිලි වැනි ව්‍යංගාර්ථය මතු කරන භාෂා යෙදුම් වේ. (හෙබ්‍රෙව් බසින් "මෂාල්", "හිදා"). ජීවිතයේ උත්තරීතර බවත් දෙවි සමිඳාණන්ගේ අභිරහස්‍යමය ක්‍රියාකාරිත්වයත් අවබෝධ කරගැනීමේ ප්‍රඥාවේ ඔවදන් උපකාරී වන්නේ ය.

(ආ) වගන්ති 5-12:

ගීතිකා කතුවරයා මේ කොටස තුළ සංසන්දන ලේඛන ශෛලියක් යොදා ගනී. එමඟින් ඔහු ධනවතුන් හා බලවතුන්ගේ ක්‍රියාකාරකම් මරණයේ නියත බව හමුවේ නිෂ්ඵලවන සැටි ප්‍රබලව පෙන්නුම් කරයි.

මම කිසිසේත් බිය නොවන්නෙමි.

ප්‍රඥා සාහිත්‍යය පදනම්කොට දෙන පාඩමක හරය මින් සාරාංශ වේ (ව. 16)

ඉදිරියට...

ගීතාවලිය



ශුද්ධ ලියැවිලි වසර

**(46)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

---

ගරු හෙන්රි සිල්වා පියතුමා **72**

## පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යය හා ගීතාවලිය



**පසුගිය සතිය හා සබැඳේ**

7- 14 දක්වා වගන්ති සමිඳුන්ගේ නීතිය පිළිබඳ විස්තරයක් සපයමින් එය ඉටුකිරීම සම්බන්ධ අනුශාසනයක් ද ඉදිරිපත් කරයි. කතුවරයා, ව්‍යවස්ථාව පිළිපැදීමේ වාසි ඉදිරිපත් කරන බැවින් හෙතෙම නීතිය උගන්වන ගුරුවරයකු ලෙස පෙනේ ( 11 වන වගන්තිය). මෙවැනි විවිධ තෙහිලි ගීත එක්කොට ඇත්තේ මන්ද යනුවෙන් ප්‍රශ්න කළ හැකිය. ප්‍රථමයෙන්ම තෙහිලි ගීතය එහි මුල් කොටස 6 වන වගන්තිය සමඟ අනපේක්ෂිත ලෙස අවසන් වෙයි. කිසියම් කරුණක් හේතුකොටගෙන, තෙහිලි ගීතයේ අවසාන කොටස ගිලිහී ගොස් ඇති බව අයෙකුට නිගමනය කළ හැකිය. එබැවින් එය ප්‍රඥා ගීතයක් ලෙස හැඳින්වෙන දෙවෙනි කොටස හා එකතු කර ඇති බව පෙනේ. තෙහිලි ගීත 150 ට වැඩි ප්‍රමාණයක් පැවතීම මෙයට හේතු සාධක වූවා විය හැකිය. ඒ සියල්ල ගීතාවලියට ඇතුළත් කිරීම සඳහා මෙලෙස බද්ධ කිරීම අවශ්‍ය වූ බව පෙනේ.

**බෙදුම**

| | | |
|---|---|---|
| 1-4 අ | : | අහස් තලයෙහි දේව මහිමය පිළිබඳ විස්තරය |
| 4 ආ - 6 | : | සූර්යයා පිළිබඳ විස්තරය |
| 7 - 10 | : | සමිඳුන්ගේ ව්‍යවස්ථාව විස්තර කිරීම |
| 11 | : | සමිඳුන්ගේ ව්‍යවස්ථාව පිළිපැදීමේ විපාක |
| 12 - 13 | : | කතුවරයා තමන් පාපයෙන් වළක්වාලන ලෙස දෙවිඳුනට කරන ආයාචනය |
| 14 | : | කතුවරයාගේ යැදුම දෙවිඳුන් විසින් අසනු ලැබේවා යන පැතුම |

**විග්‍රහය**

1 "දේව මහිමය" - පුරාණ ගිවිසුම තුළ දේව මහිමය, දෙවියන් වහන්සේ ප්‍රකාශවීම හා සම්බන්ධය. සාමාන්‍යයෙන් දෙවියන් වහන්සේගේ මහිමය ප්‍රකාශ වීම සිදුවන්නේ මහත් සලකුණු හා ප්‍රාතිහාර්යය මඟිනි. එලෙසම එය දෙවියන් වහන්සේ සතු සර්වබලය දෘශ්‍යමානව හා ප්‍රතාපවත්ව ප්‍රකාශ වීමක් ද වෙයි.

2 - 4 අ : දේව මහිමය පිළිබඳව අඛණ්ඩ සංනිවේදනයක යෙදෙන දූතයන් බවට පත් කිරීම සඳහා කතුවරයා දවාල හා රාත්‍රිය පුද්ගලාරෝපණය කරයි.

4 ආ : "හිරුට මණ්ඩපයක්" - මෙය, මුහුදට බැස යාමෙන් පසු ඉර ඔරුවක නැගී රාත්‍රිය ගත කිරීම සඳහා තම විවේකස්ථානය කරා ගමන් ගන්නා බව පැවසෙන මිසර (ඊජිප්තුව) ජන ප්‍රවාද සංග්‍රහයෙන් මතු වූ අදහසක් විය යුතුය.

9 "සමිඳුන් කෙරෙහි ගරුබිය" - එය, දේව අණ පනත් පිළිපැදීම හා සමගාමීව දැක්වේ. (තෙහිලි ගී 112: 1; 119 : 63; 128:1-4).

14 "මාගේ පර්වතය" - පර්වතය යන්න දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිය හැකි බව මෙන්ම, ඔවුන් වහන්සේ තම ජනතාව ආරක්ෂා කරන බව ද ඇඟවීමට තෙහිලි ගීතවල භාවිතා වන රූපකයකි.

**පණිවුඩය**

තෙහිලි ගීතය අපට ඇරැයුම් කරනුයේ, ස්වභාවධර්මයාට සමීපව පුදුමාකාර ලෙස එහි අනාවරණය වන දේව හස්තයේ ක්‍රියාකාරිත්වය අත්දැකීමට ය. පවත්නා සියල්ලෙහි මැවුම්කරුවාණන් ඔවුන් වහන්සේ වන නිසා මවන ලද හැමෙක තුළම ඔවුන් වහන්සේගේ මහිමය ප්‍රකාශ වෙයි. ඔවුන් වහන්සේගේ අණ පණත් තුළ අනාවරණය වන නීතිය පිළිපැදීම ධර්මිෂ්ඨ දිවි පෙවෙතකට මඟ දක්වයි.

☛ ලබන සතියට

---

# සමාව ඉල්ලීම හා සමාව දීම

මෙවර පාස්කු කාලය ලං වත්ම, අප බොහෝ දෙනෙකුට අමතක වන ක්‍රිස්තුන් වහන්සේගේ පණිවුඩයක් සිහිපත් කරවන සිද්ධියක් ඔබ සමඟ බෙදා ගන්න සිතුණා. ළඟ දී දිනක එක්තරා ගුවන් විදුලි නාලිකාවක ප්‍රචාරය වුණ එක්තරා වැඩසටහනක් සඳහා සත්‍ය කතාවක් පාදක කරගෙන තිබුණා. ඒ කථාව කෙටියෙන් සඳහන් කරන්නම්.

"ඇමරිකාවේ විසූ එක්තරා වැන්දඹු මාතාවකගේ අවු. 14 ක වයසැති එකම දියණිය දූෂණය කර මරා දමා තිබුණා. අවුරුදු කීපයකින් එම වරදකරු නීතියට අසුවුණා. එම මව ඒ තැනැත්තාව දුටු පළමු හා අවසාන අවස්ථාව එදින උසාවියේයි. කලින් කුමන අන්දමේ ආගමික කටයුතුවල යෙදී තිබුණත්, එදින වරදකරු කෙරෙහි ඈ තුළ ඇතිවුණ වෛරය, ඇයගේ සිතෙන් ඉවත් කරන්න කොහොමටත් බැරිව තිබුණා. පසුව ඇය වියපත් වයසේ දී එක්තරා ආගමික වැඩපිළිවෙලකට දිගු කාලයක් පුරා සම්බන්ධව සිටි පසු ටිකෙන් ටික ඇගේ සිත වෙනස් වී තිබුණා. "

මේ කතාව ගැන අදහස් දක්වන ලෙස එම ගුවන් විදුලි වැඩසටහන මඟින් අසන්නන්ගෙන් ඉල්ලීමක් කරනු ලැබුවා. එයට ප්‍රතිචාර වූයේ තම දියණිය විනාශ කළ මිනිමරුවාට එම මවගෙන් සමාව ලැබෙනු ඇතැයි සුළුතරයක් සිතා තිබුණු අතර, අනෙක් අය කීවේ කෙසේවත් සමාව දීමට බැරි බවයි. සමහරු කෝප හඬින් කීවේ වරදකරු විනාශ කළ යුතු බවයි. එම ප්‍රතිචාර විශ්ලේෂණය කිරීමේදී මට මෙහෙම හිතුනා. ජීවිතයේ කුමන හෝ අවස්ථාවක යමෙකුට හෝ කීප දෙනෙකුට සමාව දී සිත නිදහස් කර ගැනීමේ පුරුද්දක් තිබුණ අය පමණක්, එම මව විසින් මිනිමරුවට සමාව දෙනු ඇතැයි සිතා තිබූ බවයි.

මේ සංවාදයේදී මට ඇති වූ ප්‍රශ්නය වුණේ "සමාවදීම" යන උතුම් ක්‍රියාව සිදු කිරීමට අපට මොනතරම් අපහසුද යන්නයි. එලෙසම, මට කිසිවෙකුට කිසිදින සමාවක් දෙන්න බැරි නම් "සමාවක් ඉල්ලීමට"ත් අයිතියක් තියෙනවද යන්නයි. පුංචි උදාහරණයක් ගනිමු. ඔබ පාරේ නිවැරදි පැත්තෙන් කල්පනාවෙන් ඇවිද යන විට හදිසියෙන් ආපු කෙනෙක්, ඔබේ ඇඟේ හැපුනා යයි සිතමු. හැපුණ කෙනාම ඔබට, "පාර බලාගෙන යනවකෝ" කියලා කිවුවොත්, ඔබගේ ක්ෂණික ප්‍රතිචාරය කුමක් විය හැකිද? වරද ඔබේ නොවුණත් ඔබ දෙන උත්තරය "සමාවෙන්න" යැයි නම් ඔබ ඉවසීම පරිනත ලෙස පුරුදු පුහුනු කළ අයෙක් බවට සැකයක් නැහැ. ඔබගේ නිවැරදි බව සනාථ කරනට උත්තර බැන්දොත්, නැතිනම් හැපුණ පුද්ගලයා සමඟ තරහක් ඇති වුවොත් ඔබ තුළ "නිවැරදි කරගත යුතු යමක්" ඇති බවයි මේ කියන්න උත්සාහ කරන්නේ. කෙනෙකු ගැන ඔබේ සිතේ අමනාප සිතුවිල්ලක් පහළ වූ විට පළමු හානිය ඇති වන්නේ ඔබේ සිතටයි. අමනාපය, කෝපය, වෛරය හරියට ඇසිඩ් වගෙයි. තිබෙන තැන පුච්ච-නවා. එම අමනාප සිතුවිල්ලම ඔබගේ සිතේ සතුට සමාදානය නැතිකර දමනවා. ඔබට දයාබර අයෙකු සිහිවෙනවාට වඩා වැඩි වාර ගණනක් අමනාප කෙනාව මතකයට නැගෙනවා. ඒ එක් එක් වාරයක් පාසා ඔබේ සිත දූෂණය වෙනවා. ඔබ අමනාපව සිටින පුද්ගලයාට නම් ඉන් වන බලපෑමක් නැති තරම්, අමනාපය දුරදිග ගිය විට, වෛර සිතුවිලි පහළ වන්නට හා ඒවා ක්‍රියාවට නැගෙන්නටත් ඉඩ තියෙනවා. මේ සියලු දේ ඔබේ සතුට නැති කර දමනවා. ඔබ වරදකරු නොවුනත් වැඩි දඬුවමක් විඳින්නේ ඔබමයි. එබැවින් දවස තුළ ඇති වන පුංචි පුංචි දේවල් වලට එවෙලේම සමාව දෙන්න. සමාව ගන්න. මෙය නිවසින් පටන් ගන්න පුළුවන්. එය ලජ්ජාවට කාරණයක් නෙවේ. සමාව දීම යන උතුම් ක්‍රිස්තු පණිවුඩය ලෝකය පුරා පැතිරවීමේ පළමු පියවර ඔබේ පවුලෙන්ම පටන් ගත යුත්තේ එලෙසයි.

**✍ නිර්මලා ප්‍රියන්ති රොඩ්රිගෝ**
**කැපුන්ගොඩ**

---




# "යන්න, මින්පසු තවත් පව් නොකරන්න."

## මාර්තු 17 - චතාරික සමයේ පස්වන ඉරුදින

**අද පළමු කියවීමෙන් දිවැසිවර යෙසායා බැබිලෝනියේ ජුදෙව්වන්ට ප්‍රකාශ කළ ධෛර්යවන්ත පණිවුඩයක් ඉදිරිපත් කරන අතර දෙවන කියවීමෙන් ශු. පාවුළු තුමා තම සිත් මාරුවට කලින් දැන් තමාට විරුද්ධ වන ජුදෙව්වරුන්ට වඩා යහපත් ජුදෙව්වකු බව පවසයි. අදට නියමිත සුවිශේෂ ප්‍රකාශයෙන් ඉදිරිපත් කැරෙන්නේ පව්කාර ස්ත්‍රියගේ සිද්ධියයි.**

දිවැසිවර යෙසායා "පසුගිය දේ සිහි නොකරන්න... බලන්න, මම අලුත් දෙයක් කරන්නෙමි, මම කාන්තාරයේ පවා මාර්ග යක් සාදා එහි ජලධාරා ඇතිවන්නට සලස්වන්නෙමි." (යෙසායා 43:18). පසුගිය දේ අමතක කර දමා ඉදිරියේ තිබෙන දේ දෙසට නෙත් යොමා ක්‍රිස්තුන් වහන්සේ මඟින් දෙවියන් වහන්සේට දෙන්නට කරන ස්වර්ගීය ත්‍යාගයක් ලබන පිණිස දිනුම්කණුව බලා මම දුව යමි" යනුවෙන් ශු. පාවුළු තුමා ප්‍රකාශ කරයි. (පිලිප් 3:13).

"මමත් ඔබට වරද නොතබමි, යන්න මින්පසු තවත් පව් නොකරන්න" යනුවෙන් ජේසු සමිඳාණෝ පව්කාර ස්ත්‍රියට පවසයි. උන්වහන්සේ ස්ත්‍රියට අභියෝගයක් ද එල්ල කළේය. එනම් ඇගේ....පව්කාර බව අත්හැර දමා තම ජීවිතය නැවත යහපත් ලෙස ගොඩනඟා ගැනීමටය.

දෙවියන් වහන්සේ මිනිසුන් පශ්චත්තාපයට කැඳවීමට විවිධ ක්‍රියාමාර්ග යොදන සේක. සමහර විට ප්‍රශ්නයක් කෙළින්ම හෘද සාක්ෂියට යොමු කරන සේක "පවක් නැති තැනැත්තේ පළමු කොට අයැට ගලක් ගසන්න" ඇතැම් විට දුක, වේදනාව



මඟින් මනස්ථාපනයටත්, පිරිසිඳු බවටත් ඔවුන් ගෙනෙන සේක. "යන්න නැවත පව් නොකරන්න"යි ජේසුස් වහන්සේ ස්ත්‍රියට ප්‍රකාශ කරන සේක. "ඔබ කළ දේ පාපයක් නොවේ"යි පවසන්නේ නැත. අනුකම්පාව දක්වන අතර පව්කරුවා ප්‍රතික්ෂේප නොකර පාපයේ ඇති බරපතළකම ගැන වටහා දෙයි.

මෙවැනි සිද්ධියක් තුළ අපගේ ක්‍රියා කලාපය කුමක් ද? අප ස්වාමින් වහන්සේ එම දුෂ්කර අවස්ථාවේ දී ක්‍රියා කළ ආකාරය ගැන අප ආඩම්බර විය යුතුය. "ඔවුන් ඒ වචනය ඇසූ විට වැඩිහිටියන්ගෙන් පටන් ගෙන එක් එක් කෙනා බැගින් යන්නට ගියෝය." පව්කාර ස්ත්‍රියට ගල් ගසන්නට යෝජනා කළ අය ගැන ඔබට මට පිළිකුලක් දැනෙනු ඇත. එහෙත් අපගේ තත්ත්වය කුමක් ද? අප එදිනෙදා ජීවිතයේ අනිත් අයගේ හොඳ නම කැත නොකරමු ද චරිත ඝාතනයට ඉඩ නොතබමු ද? ක්‍රිස්තුන් වහන්සේ පෙන්වූ දයාව, අනුකම්පාව යනාදිය අපි පිළිපදිමුද?

ශු. සභාව සතු පව් කමා කිරීමේ බලය ගැන "කතෝලික සභාවේ ධර්මෝපදේශ සංග්‍රහය" ඉතා අලංකාරව පැහැදිලි කර දී ඇත. "යම් වරදක් අතිශයින්ම බරපතළ වූවද ඊට සමාව දීමේ බලය සභාවට ඇත. ඕනෑම කෙනකුට ඔහු කොතෙක් කුරිරු හා වැරදිකරුවකු වුනත් සමාව ලබා ගත හැකිය. එකම කොන්දේසිය ඔහු අවංකව හිත හරවා ගැනීමය. ක්‍රිස්තුන් වහන්සේ සියලු මිනිසුන් උදෙසා තම ජීවිතය පූජා කළ සේක. උන්වහන්සේගේ අභිමතය වන්නේ උන්වහන්සේ සභාව තුළ පාපය අතහැර සමාව පතන හැම දෙනාටම සමාව දානය කිරීමේ දොරටුව නිරතුරුව විවෘතව තැබීමයි. (අංක 982).

සභාව තුළ සමඟි සන්ධානයේ බලය නොතිබුණා නම් සදාතනික ජීවිතය හා විමුක්තිය ගැන බලාපොරොත්තුවක් කිතුනු අපට උරුම නැත. සාන්ත සභාවේ මේ සා මහත් වූ උතුම් තිළිණයක් දුන් දෙවිඳුන්ට අප ස්තුති කළ යුතුය. (අංක 983). චතාරික සමයේ සතරවන සතිය නිමාකර අවසන් සතියට පා තබා ඇති අප සැම අප ජීවිත තුළ සැබෑ සිත් මාරුවක් ඇති කර ගත යුතු ද නැද්ද යන්න සිතා බැලිය යුතුය. මන්ද උන්වහන්සේ ප්‍රකාශ කරන පරිදි මේ වරප්‍රසාද හා ප්‍රසාද ජනක කාලයේ අප සැමදෙනා පාපයට වහලකු නොවී මරණය ජයගත් උත්ථාන වූ සමිඳුන් සමඟ පාස්කු අභිරහස සමරන්නට නිවහල් ජනතාවක් ලෙස පෙළ ගැසෙමු.

අම්පිටිය ජාතික දෙව්සත්හලේ
**✍ ගරු ප්‍රසන්න දිල්රුක් සහෝදරතුමා**

# සංවර්ධනයේ නවෝදය හා කිරුළ අහිමි හිඟුරාන කිතුනු පුදබිම

**කතුතුමනි,**

දැයට කිරුළ සංවර්ධන වැඩ සටහනට සමගාමීව අම්පාර ප්‍රදේශයන් සංවර්ධනය විය. එමෙන්ම නැගෙනහිර නවෝදය යටතේද මේ ප්‍රදේශයන් හි විවිධ සංවර්ධන කටයුතු සිදුවිය.

එහෙත් මේ කී කිසිදු සංවර්ධන ක්‍රියාදාමයකට අයත් නොවුනු කිතුනු පුදබිමක වෙසෙන කිතුනු ජනයා නැවතත් සංවර්ධනයේ නාමයෙන් මුලා කොට ඇත. ඒ අනුව අම්පාර දේවස්ථානය ඇතුළුව හිඟුරාන සා. අන්තෝනි දේවස්ථානය හා කල්වාරි පුදබිම සංවර්ධනය කර දෙන මෙන් එහි කිතුනු ජනයා අවස්ථා කීපයකදී අදාල අංශ වෙත ඉල්ලීම් සිදුකළත් කිසිදු යහපත් ප්‍රතිචාරයක් මේ වන තෙක් ලැබී නොමැත.

හිඟුරාන - කල්වාරි පුදබිමේ පාදනමස්කාර ස්ථාන සියල්ලෙහි ප්‍රතිමා තැම්පත් කිරීම අවසන් කොට ඇති අතර නව දේවස්ථානයේ මේ වන විට ඉදි වෙමින් පවතී. එහි වහල ඇතුළු තවත් බොහෝ දෑ ඉදි කළ යුතුව ඇත. පුදබිම කරා ගමන් කිරීමට ඇති මාර්ගයේ අඩක් කොන්ක්‍රීට් අතුරා ඇතත් නිසි ලෙස පිළිසකර කොට නැත. ජලය බැස යාම සඳහා කානු පද්ධතියක් ඉදිකළ යුතුව ඇත. මාර්ගය හරහා ඇති බෝක්කුවද ඉතා පටුවන අතර එයද ප්‍රතිසංස්කරණය කළ යුතුව පවතී. පුදබිමේ පොදු පහසුකම් ඇතුළුව තවත් බොහෝ දෑ සංවර්ධනය කළ යුතුව තිබෙන අතර මේ පිළිබඳව අදාල වගකිව යුත්තන්ගේ අවධානය මෙතෙක් යොමු වී නොමැත.

ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව මගින් මේ පුදබිම සංවර්ධනය කිරීමට යම් ප්‍රතිපාදනයක් ලබාදීමට යෝජිතව ඇතත් එය ද මේ වන තෙක් ලබා දී නොමැත. එහි උසස් නිලධාරියෙක් පවසා සිටියේ දැයට කිරුළ ප්‍රතිපාදන යටතේ ආගමික ස්ථානයන් සංවර්ධනය කිරීමට ප්‍රමුඛස්ථානයක් නොදෙන බව හා ප්‍රදේශයේ මංමාවත් ඇතුලු පොදු පහසුකම් සංවර්ධනය කෙරෙහි අවධානය යොමුවන බවත්ය. කෙසේ වෙතත් අප කළ චාරිකාවේදී අපට දැක ගැනීමට හැකිවූයේ ප්‍රදේශයේ අන්‍යාගමික සිද්ධස්ථාන දිනෙන් දින සංවර්ධනය වී තිබෙන අයුරුය.

දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයට මේ වන විට ආරම්භව පැවතියත් එළඹෙන චතාරික සමයේදී දේවස්ථානය සංවර්ධනයට ප්‍රතිපාදන නොමැතිනම් අවම වශයෙන් හෝ හිඟුරාන පුදබිමට යන මාර්ගය නිසිලෙස කොන්ක්‍රීට් හෝ කාපට් අතුරා නිමාකර දෙන මෙන් කිසි දිනක තම පාර සාදා දෙන ලෙස ඉල්ලා උද්ඝෝෂණ නොකරන එහි කිතුනු ජනයා අදාල බලධාරින් වෙත අවධානය යොමු වේවායි අපේක්ෂාවෙන් දෙවිඳුන් යදිති.

**චින්තක ද මැල්**

# චංගුම්ගේ රුවට නොව චරිතයට ආදරය කරන්න

**කතුතුමනි,**

සුජාත දියණිය වන චංගුම් නමැති දිරිය තරුණියගේ චරිතය අද අපේ රටේ පමණක් නොව මුළු ලොව පුරා ජනප්‍රිය බවට පත්වී ඇත.

චංගුම්ගේ චරිතයට පණ පොවන කොරියානු ජාතික කාන්තාවගේ රුවට වශීවී ඇත්තේ තරුණ වැඩිහිටි අය පමණක් නොව පෙර පාසල් දූ දරුවන් පවා අද වැඩිහිටියන්ගෙන් ඉල්ලා සිටින්නේ රසකැවිලි නොව. චංගුම්ගේ සේයාරුවයි. මේ නිසා එදා ෂාරුක් ඛාන්ගේ රුවට වශීවී වෙළෙන්දන් සුපිරි වෙළෙන්දන් බවට පත්කළ අප ශ්‍රී ලාංකිය ජනතාව කටේ කිරි සුවඳ නොගිය දූ දරුවන්ට පවා චංගුම්ගේ නොයෙක් ආකාරයේ සේයාරු වෙළඳ සල්වලින් අධික මිලදී රැගෙන දෙති. වෙළඳසල් හිමියෝද විදේශයෙන් එන ඕනෑම හොඳ හෝ නරක දේ වැළඳ ගන්නා ශ්‍රී ලාංකීය ජනතාව රවටා ගනිමින් විසිතුරු දේ මවා පාමින් තමන්ගේ මඩිය තර කර ගනිති.

විදේශිය කාන්තාවෝ අද කොරියාන ජාතික නිළියක් වන ලී යං ගේ රුව මෙන් රුවක් සාදා ගැනීමට ප්ලාස්ටික් සැත්කම් වෛද්‍යවරුන්ගේ පෝලිමේ සිටිනවාට කිසිම සැකයක් නැත.

අවශ්‍ය වන්නේ මෙයද? වෘත්තියට වඩා පවුල් ජීවිතයට මුල්තැන දෙන අසරණ වන ජනතාවගේ සුබසාධන කටයුතුවල නියැලෙන අන් අයගේ දුක දැනෙන ලී යං ගේ රුව නොව එවන් හදවතක් ප්ලාස්ටික් සැත්කම්වලින් බද්ධ කර ගැනීමයි කළ යුතු වන්නේ. 'සූජාත දියණිය' ටෙලිනාට්‍යයේ චංගුම් චරිතය ජීවමාන කරමින් ලොව පුරා ජනතාවගේ ආකර්ශනය දිනාගත් ලී යං නිළියද, ක්‍රිස්තු චරිතය ජීවමාන කළ අපගේ කතෝලික ජනතාවගේ වීරයා විය යුත්තේ ක්‍රිස්තුන් වහන්සේද? ක්‍රිස්තුන් වහන්සේගේ රුව අපගේ ජීවිතවලින් පෙන්නුම් කළ නොහැකිද?

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**
බදුල්ල



# ධර්මානුකූල දිවි පෙවෙත වසර පුරාවටම....

**කතුතුමනි,**

චතාරික කාලයේ දහසක් වත් පිළිවෙත් දාන ධර්ම ආදි සුවහසක් වැඩකටයුතුය. කතෝලික සභාව මෙන්ම අනෙකුත් ගිහි පැවිදි සංවිධානද නොයෙකුත් වැඩ සටහන් සංවිධානය කරති. මේ සියල්ල ඉතාමත් අලංකාරය, ප්‍රශංසනීයය, දැහැමි ජනයා ආගමාලයෙන් මුසපත් කරවන සුලුය. මේ ටික පමණක් ඇද්ද? චතාරිකයට පමණද මේ ක්‍රියාදාමයන්? ප්‍රසාද ජනක කාලය මුලු වසර පුරා පවත්වාගෙන යන්න වෙනත් ක්‍රමවේදයක් නැද්ද? මෙන්න මේ කාරණය ගැන අප වඩාත් විමසිලිමත්ව බැලිය යුතුය. ප්‍රසාද ජනක වර්ෂයක් කරගන්න තාම කවුරුවත් හිතුවෙ නැද්ද?

චතාරික සමයේ ඉතා දැඩි ලෙස උපවාස කරන, නිරාහාර ශීලය රකින, වෙනත් මර්දන ක්‍රියා කරන ජනතාවක් දැකිය හැකිය. එය හොඳ ප්‍රවනතාවයකි. අපට දැන් අවශ්‍යව ඇත්තේ මේ තත්ත්වය තව තවත් ප්‍රගුණ කරමින් නිරන්තර ක්‍රමවේදයක් ලෙසින් පවත්වාගෙන යාමයි. පාස්කු ඉරිදායින් පසුව නැවතත් පරණ පුරුදු රැල්ලට වැටී යනවා නම් එය සාර්ථක නොවනු ඇත.

චතාරික කාලයේ තරම් දැඩි භාවයකින් නොවෙතත් දැන් අප කරන ක්‍රියාවන් අනෙක් කාලයන් වලදීත් සිදුවන්නේ නම් එය දෙයාකාරයකින් ප්‍රයෝජනවත් වනු ඇත. එකක් දේව රාජ්‍යය අතළඟ බවත්, මනස්ථාපනයෙන් ප්‍රේම පාරමිතාව සපිරෙන බවත් මිනිසාට දැනෙන්න පටන් ගන්නා අතරම තමාගේ ශරීරයටත් මනා පැවැත්මක් නිතැතින්ම ඇතිවන බවත්ය. මිනිසා එදිනෙදා ගන්නා ආහාරය සෑහෙන තරමකට පාලනයවීමෙන් තම ශරීර සෞඛ්‍යයද රැකේ. එවිට ගත සිත දෙකම එකම තලයකට පැමිණෙනු ඇත.

මේ ක්‍රියාවලිය වෙනත් වගකිව යුත්තන්ගෙ අණපනත් අනුව නොව ස්ව කැමැත්තෙන් කෙරෙනවා නම් එහි අගය වැඩිවේ. මිනිසා මෙවන් ස්වපාලනයක් මගින් තම ජීවිත රටාව සකස් කරගන්නේ නම් පාස්කු කාලයට පමණක් එළිදැක්වෙන විවිධ වැඩසටහන් දැනුවත් කිරීමකින් තොරවම පැවැත්වෙනු ඇත. චතාරිකයට පමණක් සියලුම දුක්ගාවිනා ක්‍රියාවට නංවමින් පාස්කුව හමාර වූ වහාම සිය සුපුරුදු සුඛෝපභෝගි දිවියට නැතහොත් සියලු දුසිරිත් සංකලනය අඩුවැඩි වශයෙන් කිරීමට ප්‍රවිශ්‍ය වන්නේ නම් එය සිතා මතා දෙවියන් රැවටීමකි. ඉන් රැවටෙන්නේ තමන් බව වැටහෙන්නේ නැත.

**කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි**
මීගමුව

# 'තමකම' නසාලන්නට අපට හැකියාවක් ඇද්ද?

**කතුතුමනි,**

චතාරිකයේ ආරම්භයත් සමගම, දෙව් වදන අපට ඇරයුම් කරනවා 'තමකම නසා' දින පතා සිය කුරුසිය දරාගෙන එන්නට. කිතුනුවන් වන අප හැමෝටම කරන ආරාධනයක්, කැඳවීමක්. එහෙත්, අපේ හුරුපුරුදු ජීවිත රටාව තුළ, එයට පහසුවෙන් පිළිතුරු දීමේ හැකියාවක් නොමැති බව පෙන්වාදෙනු කැමැත්තෙමි. හැම විටම, දේව වචනය අපට අභියෝගයක් නොවන්නේද?

අභියෝග ජයගත හැක්කේ දෙව්වදන තුළින්ම බව අපට ප්‍රත්‍යක්ෂ වෙනවා. එය එසේ නොවේද? අද සමාජයේ අප ගතකරන මේ ජීවිතයම කුරුසයක් වී නැද්ද? තවදුරටත් එය විස්තර කර දැක්වීම අවශ්‍ය නොවේ යයි සිතේ. කිතුනුවන් වශයෙන් ලෝකය තුළ ජීවත්ව සිටියත්, අප ලෝකයට අයිති නැත. ජීවිතය අපට කුරුසියක් වී තිබෙන්නේ, අප ලෝකයට අයිතිවී ජීවත්වීමෙනුයි. එය පිළිගත හැකි සත්‍යයක් නොවන්නේද? ලෝකය තුළ සිටිමින්, ලෝකයට අයිති නොවී ජීවත්වීම පහසු කාර්යයක්ද නොවේ. එයම නොවේද? අප කිතුනු ජීවිතවලට එල්ල වන අභියෝගය?

තමකම නසාලීමත් අපට අභියෝගයක්! එය අපේ උත්සහයෙන් පමණක් නසාලිය හැක්කේද? මට මගෙන් බැහැරවිය හැකිද? ආත්මාර්ථයෙන් තොර. මමත්වයෙන් තොර, පරාර්ථකාමී ජීවිතයට පෙරලෙන්නට අපට හැකිද? මගේම ආශාවන්, මගේම සැළසුම්, මගේම අයිතිවාසිකම් පසෙකලා, අන් අය වෙනුවෙන්, ඒ අයගේ දියුණුව, යහපත, පහසුව වෙනුවෙන් ක්‍රියා කළ හැකිද? තමන් වෙනුවෙන් ම ජීවත්වන අපට. එය එසේ කළ නොහැකි බවයි අපට වැටහෙන්නේ. මනුෂ්‍යයන්ට නම් එය කළ නොහැක. එහෙත් දෙවියන් වහන්සේට නම්....... 'මා බලවත් කරන තැනන්වහන්සේ තුළ, මට සියලු දේ කළ හැකිය.' යන දෙව්වදනට අප විශ්වාසයෙන් යොමුවෙද්දී ඒ අභියෝගයෙන් ද, අපට ජයගත හැකි නොවන්නේද?

දෙව් වදන අප ජීවිතවලට කොතෙක් අභියෝග යක් වුවද, ඊට පිළිතුරු දීමට අප තුළ කැමැත්තක්. වුවමනාවක් ඇත්නම්. අප තුළ නැති බලයක් අප වෙත එවා එය ඉටුකරන බව නම් ප්‍රත්‍යක්ෂයය.

**රිචඩ් වික්‍රමසිංහ**
බටගම

# දෙව් මැඳුරේ දේපළට බලහත්කාරකම්

**කතුතුමනි,**

මතුගම සා. මරියා දේවස්ථානයේ සුසාන භූමියට කරන්නාවූ කෙනෙහෙලිකම් අවසන් වන්නේ කවදාද? මෙය අද ඊයේ පටන් ගත්තක් නොවේ. මිනී වලවල කුරුස කඩා දැමීම, පුංචි පල්ලියේ කුරුස ප්‍රතිමාව කීප වතාවක් කඩා දැමීම, තාප්පය පෙරලා දැමීම, ගේට්ටුව කඩා දැමීම, භූමිය පවරා ගැනීමට තැත්කිරීම ඉන් සමහරකි. මේ කරදරකාරි විෂම දේ ඉතා සැලසුම් සහගතව වසරක් වසරක් පාසා සිදුවෙයි.

මෙවර ඊට නොදෙවෙනි විශාල අලාභයක් සිදුකර ඇත්තේ ප්‍රාදේශීය ලේකම් තුමියගේ උපදෙස් මතයි. අගරදගුරු මැඳුරට අයත් පූජනීය ස්ථානයක් සතු දේපලකට මීසම් සේවක පියතුමාගේ සහ මීසම්වාසී ජනතාවගේ දැඩි විරෝධතාවය නොතකා අඩුතරමින් පියතුමාට හෝ නොදන්වා අනවසරයෙන් සුසාන



භූමියට ඇතුලුවී භූමියේ වවා තිබූ අවුරුදු හයක් වයසැති මහෝගනී ගස් තුනක් කපා දැමීම යුක්ති සහගත නොවන අසාධාරණ ක්‍රියාවකි.

සුසාන භූමිය හැරෙන්නට ඒ අවට ට්‍රාන්ස් පෝමරයක් සවිකිරීමට අවකාශ තිබියදී සුසාන භූමි ඉඩමේ ට්‍රාන්ස් පෝමරය සවිකර ගස්වල අතුකපා දමනවා වෙනුවට ගස් කපා දමා ඇත. මීට සති කීපයකට පෙර පියතුමා මේ හා සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමින කතා බස් කිරීමෙන් පසුව විරෝධතාවය ප්‍රකාශකර අත්සන් තබා තිබියදී හිතුමතේ බලය පාවිච්චිකිරීම නොහොබිනා ක්‍රියාවකි. මින් ඉදිරියේදීද මීට වඩා දේවල් සිදුවීමට ඉඩ ඇති හෙයින් වගකිවයුත්තන් නිසි ක්‍රියා මාර්ග ගතයුතුව ඇත.

**සුනිතා මාලනී විජේසිංහ**
මතුගම





තරුණ පූජක තුමකු ලෙස...



පාසල් වියේදී සිය සමකාලීනයන් දෙදෙනකු සමඟ නව සසුන් පියා (දකුණේ)





සිය දෙමාපියන් සහ සහෝදර සහෝදරියන් සමඟ

ආර්ජන්ටිනාවේ අගනුවර වන බුවනෝර්ස් අයර්ස්හිදී ඉතාලි සංක්‍රමිකයන් වන දුම්රිය කම්කරු මාරියෝ ජෝස් බර්ගෝලියෝ හා රෙජිනා මාරියා සිවොරි යුවළට දාව 1936 දෙසැ. 17 වැනිදා උපන් දරුවා හොර්හේ මාරියෝ බර්ගෝලියෝ විය. දරුවන් පස් දෙනෙකුගෙන් යුතු පවුලක විසූ එතුමා ගැටවර වියේදී ඇති වූ ආසාදන රෝගී තත්ත්වයකින් පෙනහැල්ලක් ඉවත් කරන්නට සිදුවිය.

පාසල් අධ්‍යාපනයෙන් පසු බුවනෝස් අයර්ස් විශ්ව විද්‍යාලයෙන් රසායන විද්‍යා පශ්චාත් උපාධිය දිනුවේය. 1958 මාර්තු 11 වැනිදා ජේසු නිකායට බැඳී දර්ශනය හා දේව ධර්මය හදාරා 1969 දෙසැම්බර් 13 වැනිදා අගරදගුරු අති උතුම් රාමොන් ජෝස් කැස්ටෙල් ලානෝ හිම්පාණන් වෙතින් පූජකවරම් ලැබීය. බුවනෝස් අයර්ස්හි දර්ශනවාදය හා දේවධර්මය පිළිබඳ සා. මිගෙල් පීඨයේ පීඨාධිපති ලෙස පත්වන උන්වහන්සේ එහි දේව ධර්මය කථිකාචාර්ය වරයා බවට ද පත්වෙති.

ජන්මයෙන් ලබා තුබූ නායකත්ව ගුණාංග හේතුවෙන් 1973 දී ආර්ජන්ටිනා ජේසු නිකා ප්‍රාදේශියාධිපති තනතුරට පත්ව 1979 දක්වා කටයුතු කර තමා ඉගෙනුම ලැබූ සා. මිගෙල් දෙවිසත්හලේ අධ්‍යක්ෂ ලෙස 1980 දී පත්ව 1986 දක්වා කටයුතු කළේය. 1992 දී බුවනෝස් අයර්ස් සහයක රදගුරු ලෙස නම් කරන එතුමා රදගුරුවරයට අබිසෙස් ගන්වන්නේ 1992 ජුනි 27 දා අවුකා හි නාමධාරී රදගුරු ලෙසිනි. 1998 පෙබරවාරි 28 වැනිදා බුවනෝස් අයර්ස් අගරදගුරු ලෙස පත්වන එතුමා ආර්ජන්ටිනාවේ පෙරදිග කතෝලිකයන් වෙනුවෙන් ද පත්විය.

2001 පෙබරවාරි 21 වැනිදා අති උත්තම දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් කාදිනල්වරයට ඔසවන ලද අතර දේව වන්දනාව සහ සක්‍රමේන්තු විනය පිළිබඳ සසුන් කොමිසමේ, පූජකවරුන් පිළිබඳ සසුන් කොමිසමේ, අපෝස්තලික ජීවිත සංගම්වල සහ ආලේපලත් ආයතන පිළිබඳ සසුන් කොමිසමේ, පවුල පිළිබඳ සසුන් කොමිසමේ සහ ලතින් ඇමරිකාන කොමිසමේ සාමාජිකත්වය දැරීය.

සමාජ සාධාරණය උදෙසා ඇප කැප වූ එතුමා සිය සරළ හා චාම් ජීවිත පැවැත්මෙන් ඊට ආදර්ශයක් ලබා දුනි. කුඩා ගොඩනැගිල්ලක ජීවත් වෙමින් සුව පහසු රථ වාහන අත්හැර පොදු ප්‍රවාහන සේවා උපයෝගී කරගෙන තම ආහාර අත්හැර තමාම පිළියෙල කරගත්තේ ය. අති උත්තම දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා සගසුව දිනීමත් සමඟ ඊළඟට පත්වන සසුන් පිය ලැයිස්තුවේ අති උතුම් බර්ගෝලියෝ හිම්පාණන්ගේ නම ද නිතර කියැවිණ. 2005 සසුන් පිය වරණ දැහැනට සහභාගි වූ කාදිනල් සංසදයට උන්වහන්සේ ද අයත් වූහ. එහිදී තේරී පත් වූ අති උතුම් ජෝශප් කාදිනල් රැට්සිංගර් හිම්පාණන්ට පසු වැඩිම ඡන්ද ලබා ගත්තේ අති උතුම් හොර්හේ මාරියෝ කාදිනල් බර්ගෝලියෝ හිම්පාණන් යැයි 2005 නිකුත් වූ නිර්නාමික දිනපොතක සටහන්ව තිබිණි.

2005 නොවැම්බර් 5 වැනිදා ආර්ජන්ටිනාවේ අපෝස්තලික කොමිසමේ සභාපති ධුරයට රදගුරු හිම්පාණන් අති බහුතරයක ඡන්දයෙන් පත් වූ අතර 2008 නොවැම්බර් 11 දා යලි තෙවසරකට පත්විය.

වර්ෂ 1976 සිට 1983 දක්වා ආර්ජන්ටිනාවේ හමුදා ඒකාධිපති පාලන සමයේ දී ජේසු නිකායේ ප්‍රාදේශියාධිපති ලෙස කටයුතු කළේය. එහිදී ඊට එරෙහි නොවූ බවට ඇතැම්හු චෝදනා නැගූහ. එහෙත් මේ සමය පිළිබඳ ග්‍රන්ථයක් පළ කළ හොරාසියෝ වර්බිට්ස්කි නම් ලේඛකයා කියනුයේ ඒ චෝදනා සනාථ නොවන බවකි. මේ අතර 2010 දී අති උතුම් බර්ගෝලියෝ කාදිනල් හිම්පාණන්ගේ චරිතාපදානය ග්‍රන්ථාරූඪ කළ සර්ජියෝ රූබන් පවසනුයේ ඒකාධිපති පාලන සමයේ පීඩාවට පත් ජනතාවට සෙවන සදන්නට එතුමා අනන්තවත් යොමු වී ඇති බවයි. වරක් ජුන්ටා හමුදාවේ ඉලක්කයක් වූ පුද්ගලයකු කාදිනල් බර්ගෝලියෝ හිමි හැඩරුවට සමාන වූ නිසා පියතුමා සිය අනන්‍යතා තොරතුරු ඔහුට ලබා දී රැකවරණය සහිතව පළා යන්නට ඉඩ සලසා දී ඇත.

ගබ්සාව, අනායාස මරණය, මරණ දඬුවම ඇතුළු නූතන සමාජයේ බරපතළ ප්‍රශ්නවලට එරෙහිව හඬ නඟන්නටත්, කටයුතු කරන්නටත් නිතර ඇප කැප වූ උන්වහන්සේ ලතින් ඇමරිකාන රටවල් අතරින් ආර්ජන්ටිනාව 2010 දී සමලිංගික විවාහ නීතිගත කිරීමේ වෑයමට එරෙහිව ජනතාව පෙළ ගස්වන්නට පෙරමුණ ගත්තේය.

1982 සිට ග්‍රන්ථ ගණනාවක් රචනා කර ඇති එතුමා, ආගමික කරුණු විෂයයේ පමණක් නොව සමාජ, ආර්ථික හා දේශපාලනික ප්‍රශ්න හා ගැටළු සම්බන්ධයෙන් ද අභීතව සිය මතය ප්‍රකාශ කරන්නේ ය. ලතින් ඇමෙරිකාවේ ප්‍රකට විමුක්ති දේව ධර්මය පිළිබඳව ස්වාධීන පිළිවෙතක පිහිටා කටයුතු කරන උන්වහන්සේ කවර හෝ ගුරු කුලයන්ට ආවඩන්නේ නැතිව කටයුතු කරන අයකු ලෙස ප්‍රකටය.

"ෆාදර් හොර්හේ" යන දයාබර ඇමතුමෙන් කාදිනල් හිම්පාණන් නමකු වූ පසුවද එතුමන් අමතනු ලබන අතර මුඩුක්කුවල ජනතාව අතර ද එතුමා ඉතා ජනප්‍රිය චරිතයකි. සාන්ත සභා නෞකාව විසි එක්වන සියවසේ අභියෝග මැද පදවා යන්නට වරම් ලද පළමු ප්‍රැන්සිස් නම් ලත් 266 වැනි සසුනිසුරාණන් ලෙස උන්වහන්සේ අසීසියේ ප්‍රැන්සිස් මුනිඳුන්ගේ අපිස් සාම දැහැනත්, සිය නිකායේම සාන්ත ප්‍රැන්සිස් සේවියර් මුනිඳුන්ගෙ ජ්වලිත ධර්මදූතික පන්නරයත් සිය දූතික දැක්ම කර ගැන්මට සිතා සිටිනු නියතය.

අති උත්තම පළමු ප්‍රැන්සිස් සසුනිසුරාණනි! ජේසු ක්‍රිස්තු ආරාධිත වේවා!

- මෛත්‍රී











සිය රටෙන් නව සසුන් පියා බිහිවීම ගැන උද්දාමයට පත්වී



# අති උතුම් පළමු ප්‍රැන්සිස් සසුනිසුරාණෝ



කාදිනල්වරයට ඔසවනු ලැබූ අවස්ථාව



විශ්‍රාමික සසුන් පියාබැහැදුටු මොහොතක්...



ආර්ජන්ටිනා ජනාධිපතිනිය සමග සාකච්ඡා කළ මොහොතක්

# සියක් වස සමරන කඳාන සාන්ත සෙබස්තියන් බාලිකා ප්‍රාථමික විදුහල



ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමු කලාපයේ ජා-ඇල කොට්ඨාශයේ කීර්තිමත් කිතුනු බාලිකා ප්‍රාථමික පාසලක් ලෙස ජයග්‍රාහී ශත වර්ෂය සපුරන සාන්ත සෙබස්තියන් බාලිකා ප්‍රාථමික විද්‍යාලය කතෝලික පාසල් පෙරමුණේ සිටින කඳාන ග්‍රාමයේ පිහිටි ජනප්‍රියතම බාලිකා පාසලකි. 1913 දී රොමොල්ඩ් පියතුමා විසින් පැවිදි සොයුරියන් යොදවා පාසල ආරම්භ කළේය. එවකට කතෝලික සභාවෙන් පාලනය වූ මෙහි 3 වන ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්විණ.

ක්‍රි.ව 1928 දී මේරි කැලිස්ටා පැවිදි සොයුරිය විදුහල්පති තුමිය ලෙස දෙවසරක කාලයක් මහඟු සේවයක් ඉටු කළ අතර 1930 ගරු මේරි සෙලෙස්ටා මව්තුමිය ද, 1931 මේරි ගාඩියන් ඒන්ජල් මව්තුමිය ද, මෙහි විදුහල්පතිනියන් ලෙස විශාල සේවාවක් ඉටු කළහ. 1932 දී ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකරනු ලැබීම විදුහලේ දියුණුවට හේතුවක් විය. 1934 දී ගුරු මණ්ඩලය ද 9 දෙනෙක් දක්වා වර්ධනය විය. එවකට මෙය මිශ්‍ර පාසලක්ව පැවතිනි. 1936 - 1944 කාලය දක්වා මේරි පැට්‍රීෂියා පැවිදි සොයුරිය විදුහල්පතිනිය ලෙස විවිධ අංශ කෙරෙහි තම අවධානය යොමු කරන ලදි. 1945 වසරක කාලයක් ගරු ජෙනෙවි පැවිදි සොයුරිය ද, 1946 ගරු මේරි ලුසිල්ඩ් පැවිදි සොයුරිය ද විද්‍යාල ප්‍රගතියේ නියමුවරියෝ වූහ.

ඉන්පසු මේරි නාර්සින් පැවිදි සොයුරිය, මේරි මාර්තා පැවිදි සොයුරිය, ගරු මේරි සෙලෙස්ට් පැවිදි සොයුරියන් විසින් විදුහල්පති ධුරයන් දරමින් විවිධ වූ අමිල සේවාවන් ඉටු කරන ලදි. ආගමික පරිසරයක් සමස්ථ පාසල් පද්ධතියේම විද්‍යමාන විය.

දිනෙන් දින උන්නතියට පා තැබූ මෙම පාසල කතෝලික සභාවෙන් මිදී 1962.07.02 වන දින රජයට පවරා ගන්නා ලදි. ගරු මේරි ප්ලැසිඩා පැවිදි සොයුරිය විදුහල්පතිනිය ලෙස කටයුතු කළ අතර එකල දැල්පන්දු බාල දක්ෂ ආදී විෂය බාහිර ක්‍රියාකාරකම් ද ක්‍රියාත්මක විය. 1968 දී මෙම පාසලෙන් පිරිමි ළමුන් වෙනත් පිරිමි විදුහලකට මාරු කර යවන ලදි. 1968.01.04 වන දින සිට මෙම විදුහල පූර්ණ බාලිකා පාසලක් බවට පරිවර්තනය විය. පුරා තෙවසරක් විදුහල්පතිනිය ලෙස කටයුතු කළ මේරි ඇන්සලම් පැවිදි සොයුරිය සරඹ සංදර්ශන මැහුම් ගෙතුම් අත්කම් ප්‍රදර්ශන පවත්වමින් විද්‍යාලයට කීර්තියක් ලබා දුනි. 70 දශකය අවසානයේ දී ජ්‍යෙෂ්ඨ පන්තියේ සිසුන් වසරින් වසර සාන්ත සෙබස්තියන් බාලිකා මහ විදුහලට අනුයුක්ත කිරීම සිදුවිය. ආගමික පරිසරයක් තුළ අධ්‍යාත්මික පෝෂණය ඇති කිරීමට ආරම්භයේ සිට පැමිණි පැවිදි සොයුරියෝ මූලිකත්වය ගත්හ. පැවිදි නායකත්වයට විරාමය තබමින් 1972 දී ගිහි විදුහල්පතිතුමියක පැමිණියාය. 1974 ඇම්. පී. ජී. ප්‍රනාන්දු මහතා ද, 1978 එන්. ඩී. ජ්ලෝරි ගුණසේකර මහත්මිය ද, 1987 ඩී. මේරි ලිලී සපරමාදු මහත්මිය ද, 1996 ටී. ඒ. ඩී. ආර්. අයි. එස්. රණසිංහ මහත්මිය ද පාසලේ උන්නතියට හා ආගමික පුනර්ජීවයේ ප්‍රබල නියමුවරියෝ වූහ. ගොඩනැගිලි ඉදිකිරීම් විෂය බාහිර ක්‍රියාකාරකම් තූර්ය වාදන කණ්ඩායම් බිහිවීම ආදියෙන් පාසල පරිපූර්ණ වූයේ ද මේ අවධියේ ය. සිසුන්ගේ ප්‍රමාණය දහස ඉක්මවූ අතර ආචාර්ය මණ්ඩලය ද 40 දෙනෙකුට අධික විය. සාන්ත සෙබස්තියන් මුනි පහස ලබමින් කඳාන පුරවරයේ ජනප්‍රියතම බාලිකා ප්‍රාථමික පාසල වීමේ ගෞරවය මෙම පාසල දිනා ඇති බව ආඩම්බරයෙන් පවසමු.

2002 වසරේදී වත්මන් විදුහල්පතිනිය වන ජෙනට් සපරමාදු මහත්මියගේ පැමිණීම පාසලේ මෙතෙක් පැවති කිතුනු නවෝදයට මහත් ආලෝකයක් විය. වාර්ෂිකව පවත්වනු ලබන විවිධ වූ කිතුනු වැඩසටහන් බාලිකාවන්ගේ ජීවන රටාවට බොහෝ ලෙස ආදර්ශයක්ම විය. වාර්ෂිකව 4 වන ශ්‍රේණියේ බාලිකාවන් ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමේ පිළිවෙත හය මසක කාලයක් පුරා අධ්‍යාත්මික වටිනාකමක් ලැබෙන ලෙස දියත් කිරීමට විදුහල්පතිනිය දරන උත්සාහය ප්‍රශංසනීය ය. වත්මන් ගුරු කැළ ද ඒ සඳහා ඇප කැපව සිටි. එමඟින් දිව්‍ය සත්ප්‍රසාදයේ වටිනාකම පිළිබඳව මනා අවබෝධයක් ලබා ගත් පසු එම උතුම් දීමනාව දානය කරනු ලබන අතර සෑම කිතුනු දරුවකු තුළම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳව මහත් ගරුත්වයක් ඇතිවනු ඇතැයි විශ්වාස කරති. පාසලේ සියලු වැදගත් අවස්ථාවන්හිදී ඊට උචිත වන ලෙස ආගමික වතාවත් වලට මූලික තැනක් දීම වත්මන් විදුහල්පතිතුමියගේ ප්‍රධාන අභිලාෂයයි. මෙම සියලු ආගමික වත් පිළිවෙත් සඳහා පාසල හා බැඳී සිටින කඳාන සිද්ධස්ථාන පාලක පියතුමා ඇතුළු සහයක පියතුමන් දක්වන අනුග්‍රහය ගෞරවාන්විතව සිහිපත් කරන්නෙමු. 1 ශ්‍රේණියට සිසුන් බාරගෙන ඔවුන් ආසිරි ගැන්වීම, අර්ථවත් චතාරික කාලයක් වෙත සිසුන් රැගෙන යාම අගය කළ යුතුමය. අධ්‍යාත්මික ගුණ වගාවෙන් පෝෂිත දරුවා ලොවටම ආභරණයක් බව විදුහල්පතිතුමියගේ අදහසයි.

චතාරික සමයේ ප්‍රධාන වත් පිළිවෙත් සිදුකර මනස්ථාපිත චතාරිකයක් වෙත සිසුන් පුහුණු කරනු ලබයි. මැයි මස දී මරි මවුන්ට පාසල කැප කරනු ලබන අතර පාසල වටා යන මනරම් පෙරහරකින් මරි මවු පුදනු ලබයි. එතුමියගේ ජීවන ආදර්ශය බාලිකාවන්ට ඇතිවන ලෙස අදාළ වැඩසටහන් ක්‍රියාත්මක වේ. පාසල ප්‍රවිෂ්ඨයේ ස්ථාපිත කර ඇති මරි මවු ප්‍රතිමාව නිරතුරුවම බාලිකාවන්ගේ පුද සත්කාරය ලබයි. සෑම මසකම අන්තිම සිකුරාදා දින පාසලට දිව්‍ය පූජාවක් ලබා දීමට කඳාන සිද්ධස්ථාන පාලක පියතුමා කටයුතු කර තිබීම භාග්‍යයකි. ජුනි මස දී පාසල දිව්‍ය හෘදයට කැප කරනු ඇත. මෙහිදී විදුහල්පතිතුමිය, ආචාර්ය මණ්ඩලය, සිසුවියන් හා සේවක පිරිස ආශිර්වාද ලබන අතර සියලුම පන්ති කාමර පියතුමා විසින් ආශිර්වාද කර පැහැදිලි කිතුනු භූමිකාවක් පාසල තුළ විද්‍යමාන වන බවට සාක්ෂි දරයි. සිද්ධස්ථානයේ විවිධ උත්සව වලදී පාසලේ පෙර - අපර තූර්ය වාදන කණ්ඩායම් වලින් ලැබෙන දායකත්වය ගම්වාසිහු බොහෝ අගය කරති. පාසල හා සිද්ධස්ථානය අතර නිරන්තර සබඳතාවයක් ඇති බව එයින් මනාව පැහැදිලි වේ.

සියවස් සැමරුමට සමගාමීව මාර්තු 23 වන දින වෛද්‍ය සායනයක් හා ලේ දන්දීමක් ද අප්‍රියෙල් 25 වන දින පා ගමන ද අප්‍රියෙල් 30 වන දින දිව්‍ය පූජාව හා සැමරුම් උත්සවය ද ප්‍රදර්ශනය ද පැවැත්වීමට කටයුතු සංවිධානය වෙමින් පවතී.

1913 - 2013 යන ශත වර්ෂය තුළ ආගමික පසුබිමකින් පැවත ආ කඳාන පුරවරයට ආශිර්වාදයක් බඳු වූ සාන්ත සෙබස්තියන් බාලිකා ප්‍රාථමික විදුහලට හෙට දිනයේ ද දෙව් ආසිරි මැද ආධ්‍යාත්මික පෝෂණයෙන් සපිරි බාලිකාවන් බිහි කරන්නට ශක්තිය, ධෛර්යය ලැබේවායි ඉත සිතින් පතමි.

විදුහල් මවුනි, සියක්වස සමරන ඔබතුමියට සුබ පැතුම්!

**ඊ. අජිත් ද සිල්වා (විදුහල්පති)**
**බප/මීග, වෑවල ප්‍රාථමික විද්‍යාලය**

1913 - 2013 දක්වා කඳාන සාන්ත සෙබස්තියන් බාලිකා ප්‍රාථමික විදුහලේ ඉගෙනුම ලබා මේ වන විට වෘත්තීන් වල විවිධ තනතුරු දරණ සියලුම ආදි ශිෂ්‍යාවන්ගේ නාමාවලියක් සැමරුම් පොතට අවශ්‍ය ඇති බැවින්, ඒ සඳහා ඔබගේ තොරතුරු බලාපොරොත්තු වෙමු.

011-2230133 දරණ දුරකථන අංකයට හා ෆැක්ස් අංකයට ඔබේ තොරතුරු මාර්තු 25 ට පෙර ලබා දීමට කටයුතු කරන්න. (පාසල් වේලාව තුළ)

**ජුබිලි කමිටු සංවිධායක කමිටුව**

කලා සංග්‍රහය

# වසර විසිපහකට පසු 'ගොල්ගොතා' යළිත් කරළියට

එදා කතෝලිකයන්ට චතාරික සමයේ විවිධ ස්ථාන වල රඟ දැක්වූ පාස්කු නාට්‍ය අසාමාන්‍ය දෙයක් නොවුවද 'බොරලැස්ස පාස්කුව' වැනි සුවිශේෂී නාට්‍යයන්ට ඔවුහු විශේෂ ඇල්මක් දැක්වූහ. පෙරදින රාත්‍රියේ සිට පසුදා අළුයම වන තුරු පැවති මෙම නාට්‍ය නැරඹීම සඳහා රාත්‍රී ආහාර, ජලය රැගෙන යා යුතු වුවද ඔවුහු එය කරදරයක් ලෙස නොසැලකූහ.

ජේසුතුමන්ගේ දුක්ප්‍රාප්තිය, මරණය සහ උත්ථානය විදහා දැක්වූ මෙම සාම්ප්‍රදායික පාස්කු නාට්‍ය දිවයිනේ විවිධ ස්ථානවල ප්‍රදර්ශනය වෙද්දී 1976 දී නයිනමඩම සාවියන්ස් නාට්‍ය හා ක්‍රීඩා සමාජය අභියෝගාත්මක කාර්යයකට අත තැබීය. පාරම්පරික ශිල්ප ක්‍රම හා සාම්ප්‍රදායික දර්ශන තුළ සිරවී තිබූ පාස්කු නාට්‍ය ගමන්මග වෙනතකට හැරවීමේ ඓතිහාසික තීරණයක් ඔවුන් ගෙන තිබිණි. ඒ අනුව ජේසුතුමන්ගේ පූජනීයත්වය, උත්තරීතරබව, පව්කාරයන් වෙත දැක්වූ කරුණාව, අසාධාරණයට, සාගින්නට විරුද්ධ සටන්කාමීත්වය මෙන්ම එදා සමාජයේ දෙබිඩි ජීවිත ගත කළවුන් නිරුවත් කිරීමට 'ගොල්ගොතා' නවරැල්ලේ පාස්කු නාට්‍ය මෙරිල් ප්‍රනාන්දුගේ රචනයක් හා අධ්‍යක්ෂණයක් ලෙසින් 1976 චතාරිකයේ නයිනමඩම වික්ෂෝප මාතා දේවස්ථාන භූමියේදී රඟ දැක්විණි.

නයිනමඩම ග්‍රාමයේදී ජන්මලාභය ලැබූ කම්කරුවන්, රියදුරන්, හමුදා නිළධාරීන්. ව්‍යාපාරිකයන් හා හිටපු කථානායක හා ඇමැති හියු ප්‍රනාන්දු වැනි දේශපාලකයින්ගෙන් සුසැදි විවිධ තලවල නළු නිළි, කාර්මික කණ්ඩායමක දායකත්වය යටතේ එදා කරලියට ආ 'ගොල්ගොතා' ශ්‍රී ලංකාව පුරා ජනාදරයට පාත්‍රවීමට තවත් හේතුවක් වූයේ එවක කතෝලික සභාව තුළ බිහිවූ විශිෂ්ටතම ගිහි කිතුනු සංගීතඥයා වන ජේ. කේ. ඇස්. පෙරේරා මහතාගේ සංවේදී සංගීතයයි. 1976, 1977, 1980, 1987 හා 1988 වර්ෂවල 'ගොල්ගොතා' වේදිකාගතවූයේ නයිනමඩම වික්ෂෝප මාතා දේවස්ථාන භූමියේ ඉදිවූ දැවැන්ත ප්‍රේක්ෂකාගාරයක් තුළය.

පොල්ගස් සිටුවා පොල් අතු බැඳ ඉදිකළ ඒ සුවිසල් ප්‍රේක්ෂකාගාරයේ හිඳ නාට්‍යය නරඹා පැමිණි එක්තරා රාජ්‍ය සේවකයකු පැවසුවේ ප්‍රේක්ෂකාගාරය පෙන්වීම සඳහාද මුදලක් අයකළේ නම් අසාධාරණයක් නොවන බවය. සෑම වර්ෂයකටම දින හයකට නොඅඩු දින ගණනක් ගොල්ගොතා ප්‍රදර්ශනය විය. 1980 දී දින තුනක් ගොල්ගොතා ප්‍රදර්ශනය වූයේ හලාවත සුදසුන ශාලාවේදීය. 1987.06.02 දින සංස්කෘතික



අධ්‍යක්ෂ-මෙරිල් ප්‍රනාන්දු



ජේසුතුමා - ලහිරු ප්‍රනාන්දු



පිලාත් - අජිත් දබරේරා



දේවමාතාව - අමාලි ප්‍රනාන්දු

දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් උවදුරුවලදී විපතට පත්වූවනට ආධාර පිණිස බංඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී එවක අගමැති ආර්. ප්‍රේමදාස මහතාගේ ප්‍රධානත්වයෙන් ගොල්ගොතා ප්‍රදර්ශනය විය.

'ගොල්ගොතා' පිළිබඳව කැළණි සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය එම්. එච්. ගුණතිලක මහතා පුවත්පත් වලට ලියූ ලිපියක මෙසේ සඳහන් විය. 'ගොල්ගොතා' පාස්කු නාට්‍ය මගින් පෙන්නුම් කළේ ජේසුන් වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම පමණක් නොවේ. එදා සමාජයේ පැවති අයුක්තියට පීඩනයට එරෙහිව විවෘත අභියෝගයක් කරමින් තම ජීවිතය පවා පූජකළ තරුණයකුගේ කථාවයි. ගොල්ගොතා නැරඹූ සඟ සැපත් ගරු මර්සලින් ජයකොඩි පියතුමා මෙසේ ලීවේය. 'අධික වියදම් නිසා මෙය වසරකට වරක් රඟ දැක්විය නොහැකි වූවත් වසර දහයකට වරක්වත් රඟ දැක්විය යුතු අගනා නිර්මාණයකි.'

2013 වර්ෂයේදී නැවතත් ගොල්ගොතා පාස්කු නාට්‍ය වේදිකා ගත කිරීමට ගොල්ගොතා පවුල දැන් සූදානම් වෙයි. දැනට බිහි වී ඇති උපරිම තාක්ෂණය උපයෝගි කරගනිමින් මෙවරත් වික්ෂෝප මාතා දේවස්ථාන භූමියේදී මාර්තු 21, 22, 23, 24, 26, 27, 29 හා 31 දින වල රාත්‍රී 7.00 ට ගොල්ගොතා ප්‍රදර්ශනය වෙයි.

නයිනමඩම මීසම් සේවක ගරු ලයිලි ප්‍රනාන්දු පියතුමාගේ අනුශාසකත්වයෙන් පැවැත්වෙන ගොල්ගොතා මෙවරත් අධ්‍යක්ෂණය කරන්නේ මෙරිල් ප්‍රනාන්දු මහතායි. උපදේශක (පුහුණුවීම්) ලෙස කඩයමට්ටේ මීසම් සේවක ගරු පීටර් බොතේජු පියතුමා කටයුතු කරයි. සංගීතය මෙහෙයවන්නේ ජේ. කේ. ඇස්. ශූරීන්ගේ පුත් ප්‍රවීන සංගීතඥ ලාල් පෙරේරා මහතායි. ප්‍රධාන සංවිධායක ජේ. කේ. සුමිත් පෙරේරා මහතායි. ජේසුතුමාගේ චරිතය, විප්ලවකාරී තරුණයාගේ චරිතය සහ මරියතුමියගේ චරිතය උසස් අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් වන ලහිරු ප්‍රනාන්දු, රමේශ් පෙරේරා සහ අමාලි ප්‍රනාන්දු පණ ගන්වති. ජුදාස්ගේ චරිතය රේමන්ඩ් ප්‍රනාන්දු රඟපාන අතර සුනිල් පෙරේරා සේනාධිනායක චරිතය රඟපායි. නිමල් ප්‍රනාන්දු., රෝහිත ප්‍රනාන්දු, සරත් ඇන්ටනි සහ හසිත සුපෙම් නායක පූජකවරුය. පිලාත් චරිතය රඟපාන්නේ අජිත් දබරේරායි. ඇඳුම් නිර්මාණය ලතිකා ප්‍රනාන්දු මහත්මියයි.

මෙවර ගොල්ගොතාවේ විශේෂත්වය වන්නේ 1976 වර්ෂයේ රඟපෑ නළුවන්ද සමග තරුණ බාල නළු නිළියන්ද එකට රඟපෑමයි. ෂර්ලි වාස් විසින් දැනටමත් දැවැන්ත වේදිකාව නිමවා අවසන් කර ඇත. එක්දාස් පන්සිය දෙනෙකුට අසුන්ගත හැකි සියළු පහසුකම් සහිත ප්‍රේක්ෂකාගාරයක් ඉදිවෙයි.

**ජේ. පැට්‍රික් ප්‍රනාන්දු / ජෝ සංඝපාල ආරච්චි**

# 'අහෝ මාගේ සෙනඟෙනි' මෙවරත් හල්පේ දෙව්මැඳුරු බිමේ

හල්පේ ආඩිමුල්ල (කටාන හල්පෙ) මීසම් පවුලේ උරුමයක් ලෙසින් 'අහෝ මාගේ සෙනගෙනි' පාස්කු දැක්ම 2013 වසරේදී එළිදැක්වෙන්නේ 5 වන වරටය. මේ සඳහා තම කාලය, ධනය, ශ්‍රමය කැපකරගෙන ලොකු පූජාවීමකින්, හදපත්ලේ ගැඹුරු තැනින්ම නික්මෙනා පිවිතුරු චේතනා පෙරදැරිව කටයුතු කරනා සැමගේ දායකවීම සුවිශේෂයි. කණ්ඩායම් හැඟීම් සාංඝිකත්වය හා සහෝදර බැම්ම අතිශයින් අමිලයි.

මේ කාර්ය සාර්ථක කරගැනීමෙහිලා කටාන දිසානායක සහ හල්පේ මීසම් සේවක ගරු අමිල ගෝමස් සහ මීසම් සහයක ගරු සුරංග ෆොන්සේකා පියතුමන්ගෙන් ලැබෙන අනුශාසනා හා මඟපෙන්වීම ඉතා ප්‍රශස්තයි.

1999, 2000, 2003 හා 2007 වසරවල 'අහෝ මාගේ සෙනගෙනි' පාස්කු දැක්ම හල්පෙදී වේදිකාගතවිය.

මෙවර මාර්තු 26 අඟහරුවාදා (පෝදා) ප.ව. 7.00 ට කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් හල්පේ - ආඩිමුල්ල සා. ප්‍රැන්සිස් සවියෙර් දේවස්ථාන භූමියේදී පැවැත්වේ. 2013.03.29 වන දින (මහ සිකුරාදා) දින ප.ව. 7.00 ට අහෝ මාගේ සෙනගෙනි පාස්කු දැක්ම අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ද මාර්තු 31 වන ඉරුදින (පාස්කු ඉරුදින) පාස්කු දැක්ම මීගමුව කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමාගේ මූලිකත්වයෙන්ද වේදිකා ගතවේ. අධ්‍යක්ෂණය සහ ක්‍රිස්තු චරිතයට පණ පොවන්නේ ඉන්දික ක්‍රිශාන්ත රණවීර, සහය අධ්‍යක්ෂණය ප්‍රැන්ක් ප්‍රනාන්දු, මරියතුමිය නයනා පුෂ්පකුමාරි, ගෝලයින් 12 දෙනා ජුවාම් - තරංග ප්‍රනාන්දු, සීමොන් - ඇල්බට් ප්‍රනාන්දු. අන්දරේ - ප්‍රේමසිරි සිල්වා, පේදුරු - ජස්ටින් ප්‍රනාන්දු, තෝමස් - සුනිල් ජෝනස්, අයිවන් ප්‍රනාන්දු - බර්තලමෙවුස්, තිස්ස ප්‍රනාන්දු - මතෙව්, ඇන්ටනි පාරිස් - පිලිප්, ප්‍රෙඩී නිශාන්ත - ජොහාන්, නිමල් රාජපක්ෂ - තද්දේවුස් ජෙරාඩ් අමරසිංහ - ජාකොබ් සහ පුෂ්පකුමාර ජයකොඩි - ජුදාස්, පරිසි - ඩබ්ලිව් ඒ. රණදේව සුමිත්, චන්දන පුෂ්පකුමාර සහ ශ්‍රීනාල් විජේසූරිය, සමරිතානු ස්ත්‍රිය - කාංචනා ලක්ෂානි, මරිය මදලේනා, ඉමාෂි නිසංසලා, ලේකම්වරු - අෂේන් පත්තප්පෙරුම, ග්‍රේෂන් ප්‍රනාන්දු, විල්ෆ්‍රඩ් කුමාර, පේරු සහ සවන්ත ප්‍රනාන්දු - හෙරෝද්, ඩොනල්ඩ් ෆොන්සේකා, දොරටුපාල ස්ත්‍රීන් - කොන්ස්ටන් ශාන්ති, අයිරින් ගුණසේකර, කුදු ස්ත්‍රිය - ඈන් පෙරේරා, වැන්දඹු ස්ත්‍රිය - බ්‍රිජට් ප්‍රනාන්දු, පිලාත් - නිහාල් ප්‍රනාන්දු, පිලාත්ගේ බිරිඳ - ජුඩිත් රාජිණී, යක්ෂාවේශ තරුණයා - ඩේලියන් ප්‍රනාන්දු, මාර්තා - ප්‍රදීපා ප්‍රනාන්දු, මරියා - ෂර්ලි ෆොන්සේකා, ජුදාස් - පුෂ්පකුමාර ජයකොඩි, ප්‍රධාන සෙබළ - සම්පත් ශ්‍රී අනුරුද්ධ, වමේ හොරා - ප්‍රසංග ෆොන්සේකා, දකුණේ හොරා - පැට්‍රික් විජේසූරිය, සෙබලුන් - චුලංක ශෂිමාල්, ඩිල්ෂාන් ප්‍රනාන්දු, ෂෙහාන් නිමන්ත, ක්‍රිෂාන් ප්‍රනාන්දු සහ ඩිල්ෂාන් කුමාරපේරු, ගෝලයන් - ජෙරාඩ් අමරසිංහ, අයිවන් ප්‍රනාන්දු, පාරිස්, සෙබලුන් - සම්පත් ශ්‍රී අනුරුද්ධ, ක්‍රිශාන් දිලංග, අමල් සුරංග, රොෂාන් දිලංග, නිහාල් හර්ෂණ, රුමේෂ් මධුසංක, නිරෝෂන් විජේසිංහ, විමුක්ති ප්‍රනාන්දු, ඩිල්ෂාන් කුමාරපේරු, ජීවන්ත ප්‍රසාද්, ඩබ්ලිව් කේ. නිරෝෂන්, ටිරෝන් නිශාන්ත, දිල්ෂාන් නිශාන්ත, ෂෙහාන් කෝසල, ගයාන් මධුසංඛ, ශානක මධුවන්ත, ෂෙහාන් නිමන්ත සහ කොස්තා, වෙළෙඳුන් - නිහාල් සරත්, නීල් ශාන්ත, අනිල් ප්‍රනාන්දු, දිනේෂ් මංගල, ප්‍රැන්සිස් ප්‍රනාන්දු, කාලයා - අජිත් අරවින්ද, ගෝලයා - කුමාර ප්‍රනාන්දු, ස්නාවක ජුවාම් - ප්‍රියන්ත වීරක්කොඩි, ජෝශප් - රොෂාන්ජාන්ස්, නිකදේමුස් - රෝෂන් රාජපක්ෂ, වෙරෝනිකා - කවීෂා පත්තප්පෙරුම, පරිවාර ස්ත්‍රීන් - ක්‍රිෂ්මා ගිම්හානි. කසුනි රොෂන්ති, මරියතුමියගේ පරිවාර ස්ත්‍රීන් - ක්‍රිෂාදි සුදේශිකා, ෂෙහානි කෝෂලා, යක්ෂයා - නවින් ශානක, නැටුම් - හිරුණි අමන්ති. දිමන්ති ඉමේෂා, සසිනිකා සඳරුවනි, ක්‍රිෂානි පියුමලී. දෙබස් සිහිකිරීම - චමීර මිහිරාන්, ඇඳුම් නිර්මාණය - ජෙරාඩ් අමරසිංහ, සුවිනීතා ප්‍රනාන්දු සහ මාගරට් ප්‍රනාන්දු ෂර්ලි අමරසිංහ, එලිසබෙත් ප්‍රනාන්දු, වේදිකා පසුතල නිර්මාණය - හෙන්රි නේරියස්. කල්ප අෂාන සජිත් රනුක, බ්‍රයන් සුරේෂ්, රංගභූමි පරිපාලනය - නිලාල් ප්‍රියන්ත - වේදිකා පසුතල් චිත්‍රකරණය - නිලාල් ප්‍රියන්ත - වේදිකා පසුතල චිත්‍රකරණය ප්‍රසංග ෆොන්සේකා, සංගීත අධ්‍යක්ෂණය - වෛද්‍ය ප්‍රභාත් - ආලෝක සහ කසුන් ෆිමාල් (සිරස සුපර් ස්ටාර්) සංගීතය සැපයීම - කාංචන ජයසිංහයන්ගෙනි.

**සිසිල් ඩැනීසියස්**



ෆිලීෂන් අබයකෝන්ගේ

## සුබස 230

## ඒත් නොදන්නා ලාගේ (පසන්)

**රූපත් ගරුතර කුමරා; අල්ලාගෙන සත වේ ගේ**
**යහපත් ගුණ ඇති මියුරා; ඒත් නොදන්නා ලාගේ**

නොදන්නා ලාගේ නම් නොදන්නා වගේ යනුයි. ලාගය නම් ආකාරයයි. මේ ලාගය වචනය සම්භාව්‍ය සාහිත්‍යයේ පෙනෙන්නේ තුන් පළක බව පැවසේ. සුරඹ ලාගෙන යයි ගිරා සඳෙසෙහි එන ලාගය ගුත්තිලයේ දැක්වෙන්නේ දකුතු රඟන සුරඟන ලාගේ උමතු නොවෙද කෙලෙසක කාගේ ලෙසය. කාව්‍යශේඛරයේ සරය මල්සරුගේ හලාහල විස පෙවූ ලාගේ නම් අනංගයාගේ හලාහල විස පෙවූ ඊය වැනි යනුයි.

පද්‍ය සාහිත්‍යයට සීමාවූ ලාගය බඳු අප්‍රකට වචනයක් පසන් පොතේ හතර පළක ඇතුළු කිරීමෙන් විදහාපාන්නේ ගොන්සාල්වෙස් පඬිපාණන්ගේ ශබ්ද කෝෂ ශක්තියත්, ගැඹුරු පුළුල් සාහිත්‍ය ග්‍රන්ථඥානයත්ය. කර්තෘ ගැන හෝඩුවාවක් නැති මග සලකුණ නම් මාර්ග විස්තර පද්‍යකෘතියෙත් 'එලාග යට තොප නෙත සිත ලොබ නොකර' ලෙසත් 'එළි බැස තැනින් තැන සිට එක ලාගයට' ලෙසත් දෙවරක් දැකිය හැකිය.

පසන් පොතේ ලාගය දිස්වෙන අනිත් තුන් තැන් මෙසේය. ජුදෙව්වෝ පැන නටා කෙළ කෙළ ඉන් පිලාත්තුට උන් මෙලාගෙන් නැවත දෙව් දැක්වූ.

2. මලානිකව වත පොඩිවම ශ්‍රී ගත; වෙලා වණද ඇට නහර පැදෙමින - මෙලාගයෙන් ගත සියලු තැනම වූ; මුළාව දැක සොඳසේ

3. බස අදහා ජුදයාගේ; වද කරවති තද වේගේ ස්වාමිදරුවන්නි මාගේ; කෙලෙසද වැවෙන ලාගේ

## ශ්‍රී ලංකාවේ කල්වාරි

**සම්පාදක - මැක්සිමස් රෝයි පෙරේරා**
**මිළ - රු. 450/=**




ශ්‍රී ලංකාවේ කතෝලික දෙව්මැඳුරු හා මීසම් වල පවතින කල්වාරි පුදබිම් පිළිබඳ තොරතුරු මේ දක්වා එක පොතකට ගොනුවී තිබුණේ නැත. මේ අඩුව සපුරාලන්නට කතුවරයා උත්සුක වී ඇති අතර ඒ පිළිබඳව ඔහුට තුති පිදිය යුතුය. විශේෂයෙන් යාපනය හා මන්නාරම රදගුරු වසම් හි කල්වාරි පුදබිම් තොරතුරු ගොනුකරන්නට කතුවරයා දරා ඇති වෑයම අගය කටයුතුය.

ශ්‍රී ලංකාවේ කල්වාරි පුදබිම් 29 ක් පිළිබඳව මෙහි තොරතුරු අඩංගුවී තිබේ. උතුරු නැගෙනහිර පුදබිම් පිළිබඳව දමිළ ඉංග්‍රීසි බසින්ද තොරතුරු අඩංගුව තිබීම වැදගත්ය. පාදනමස්කාර ස්ථාන 15 ට අදාළ ප්‍රතිමා විවිධ කල්වාරි පුදබිම් වලින් ලබාගෙන වර්ණයෙන් පළකර තිබීමත්, සෑම පුදබිමක් සමග ඡායාරූප පළකර තිබීමත් වැදගත්ය. ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතේ පුදබිමක අසිරිය විශේෂාංගය යටත් පළ වූ ලිපි ගණනාවක් මේ ග්‍රන්ථයට ඇතුළත් කර ඇති අතර ඇතැම් ඉපැරැණි ලිපිවල සඳහන් මීසම් සේවක වතගොත යාවත් කාලීන කිරීමට නොහැකි වීම නිසා බොහෝ ස්ථානවල පැරැණි නම් ගම් සඳහන් වී ඇති බැව් පෙනේ.

කෙසේ වෙතත් සිරිලක කල්වාරි පුදබිම් පිළිබඳ තොරතුරු දැනගැනීමට කදිම අත්පොතක් බඳු ශ්‍රී ලංකාවේ කල්වාරි ග්‍රන්ථය අධ්‍යාපනය ලබන දූ දරුවන්ට මෙන්ම තරුණ වැඩිහිටි කොයිකාටත් එකසේ එලදායි බැව් අමුතුවෙන් කිවයුතු නොවේ. කතුවරයාට ප්‍රදීප සුපැතුම්!

## සදහම් සරණිය
### පාස්කු කලාපය

**ප්‍රධාන සංස්කාරක - ගරු ක්ලෝඩ් සඳරුවන් පෙරේරා පැතුනි සොයුරු**
**ප්‍රකාශනය - ප්‍රැන්සිස්කන් තුන්වන නිකාය**

වාර්ෂිකව චතාරිකය හා පාස්කු මංගල්‍යය කේන්ද්‍ර කර ගනිමින් අම්පිටිය ජාතික දෙව්සත්හලේ ඉගෙනුම ලබන ප්‍රැන්සිස්කාන තුන්වන නිකායේ සහෝදර තුමන්ගේ දායකත්වයෙන් එළිදකින 'සදහම් සරණීය' සඟරාව දැන් නිකුත්වී තිබේ.අපගේ ජීවිත පාපයෙන් එතෙර කර ගන්නට අත්වැලක් සපයන්නට දසවැනි වරටත් සදහම් සරණීය ගෙන එන්නට දායක කාරකවූ සෑම දෙනාට තුති පිදිය යුතුය. චතාරිකයේදී මෙන්ම පාස්කුවේදීත් සුවිශේෂී ජනවන්දනා පිළිවෙත් රැසක් පවතින අතර ඒ සෑම සියලු දෙයක් ආවරණය කරමින් කිතුනු ජීවිත වලට මහත් ආලෝකයක් රැගෙන එන්නට වෑයම් කිරීම ගැන සංස්කාරක මණ්ඩලයට තුති පිදිය යුතුමයි.

සදහම් සරණීය කිතුනු ජීවිත පෙරැළියක් සඳහා පාදක කරගත හැකි වටිනා දහම් පඬුරකි. මේ දහම් පඬුර මගින් කිතුනු දිවි මඟ ආලෝකවත් කරගන්නට ඔබ සැමට ආරාධනා! සදහම් සරණීයට ප්‍රදීප සුපැතුම්!




**මෛත්‍රී**

## සී. ටී. ප්‍රණාම ගීසර 35 සඳවට රන්තරු

සී. ටී. ප්‍රනාන්දු සූරීන්ගේ 35 වන අනුස්මරණය නිමිති කර 'සඳවට රන්තරු' නමින් උපහාර ගී ප්‍රසංගයක් සී. ටී. ප්‍රනාන්දු මහතාගේ දයාබර පුත් ප්‍රියන්ත ප්‍රනාන්දු ගායකයාණන්ගේ සහභාගිත්වයෙන් හා ප්‍රවීන කලාකරුවන් හා සී. ටී. ගී රසික රසිකාවියන් රැසක් මධ්‍යයේ මාර්තු 23 සෙනසුරාදා ප.ව. 3.00 ට ගම්පහ සුමේධ රංග ශාලාවේදී පැවැත්වීමට ගම්පහ සරසවි කලාකවය කටයුතු යොදා ඇත.

මේ සී. ටී. ප්‍රණාම ගීසර 35 හි ගීත ගායනය මිල්ටන් මලවි ආරච්චි ප්‍රමුඛව, බී. එම්. මධුභාෂිණී, සිතාරි විතානගේ, ෆාතිමා රම්සිනා, උපාලි රංජිත්, අමන්දා ලක්ෂාණි. පූර්නිමා ලක්ජයනි හංසි අමල්කා යන යොවුන් ගායක ගායිකාවන් විසිනි. සංගීත අධ්‍යක්ෂණය රුක්ෂාන් කරුණානායක, ප්‍රමුඛ ගුවන් විදුලි/ රූපවාහිනී ප්‍රවීන වාද්‍ය ශිල්පීන්ගෙනි. සේපාලි රංගායතනය හා සිතාරි විතානගේ සිසු කැළ නර්තනයෙන් දායක වෙති. කථනය ප්‍රවීන නිවේදක අජන්ත කරුණාරත්නයන්ගෙනි.

නොමිලේ පැවැත්වෙන මේ සී. ටී. ගී උපහාර ප්‍රසංගය නැරඹීමට, සී. ටී. හරසර පුදන්නට ගම්පහ සරසවි කලා කවයේ සංවිධායක මිල්ටන් මලවි ආරච්චි සහෘද ඔබ සැමට විවෘතව ආරාධනාවක් කරයි. දුර. 071-4961390

# සසුනිසුරාණන් තේරීම උගැන්වෙන සිසු අනුකාරක සංසදයක්

ඉසිඹුලත් XVI වැනි බෙනඩික්ට් සසුනිසුරාණන් වෙනුවට නව තැනැත්තකු පත් කිරීම කෙරෙහි මුළු ලෝකයම අවධියෙන් සිටිනා මෙම කාල පරාසය තුළදී මාර්තු මස 05 වැනිදා වර්ජිනියාවේ කතෝලික විද්‍යාලයක, සසුනිසුරාණන් කෙනෙකු තේරීම පිළිබඳ සිසු දරු දැරියන්ගේ අනුකාරක සංසදයක් පැවැත්විණි. විදුහලේ කණිෂ්ඨ පන්ති වල දරු දැරියෝ මෙම අනුකාරක සංසඳය පැවැත්වූහ. විදුහලේ සමස්ත සිසු දරුවෝ ද ආචාර්ය මණ්ඩලය ද දෙමාපියෝ ද ඊට මහත් උනන්දුවක් දැක්වූහ. සසුනිසුරාණන් තේරීම සඳහා සිසු දරුවන් 33 දෙනෙක් සහභාගි වූ අතර එක් එක් දරුවා ඒ ඒ මහද්වීපයන් හා ඇතැම් රටවල් නියෝජනය කළෝය. ඔවුහු කාදිනල් වරුන් මෙන් අනුරූප වස්ත්‍රයන්ගෙන් ද සැරසී සිටියහ. ඔවුන්ගෙන් බොහෝදෙනා පූජාවට උදව් වන්නෝ වූහ.

විදුහලේ දරුවන්ගෙන් දෙමාපියන් විසින් විදුහල් රැස්වීම් ශාලාව පුංචි වතිකානයක් බවට පරිවර්තනය කර තිබිණි. සිස්ටයින් දෙව් මැඳුර ද කාදිනල් සංසදය ද අනුකාරකයන් සේ සකසා තිබිණි. මාර්තු මස 04 වෙනිදා උදයකාලයේ. එම පාසලේ ඇතැම් දරුවෝ ආරක්ෂක හටයන් ද, පැවිදිවරුන් ද මාධ්‍යකරුවන් ද පූජකවරුන් ද ලෙසින් සැරසී සිටියහ. කාර්ය මෙහෙයුම බාරව සිටි මැතිව් හුබර්මුලර් පියතුමා දරුවන් ද ආචාර්ය මණ්ඩලය ද අමතමින් මෙහෙයවීම් කටයුතු කළේය. කාදිනල්වරුන් සේ සැරසී සිටි දරුවෝ යාච්ඤාවෙන් පසුව සිය රහස් ඡන්දය පාවිච්චි කළෝය. එහෙත් කිසිවෙකුට තුනෙන් දෙකක බහුතර ඡන්දය නොලැබී ඇත. එම නිසාවෙන් සූදානම් කර තිබූ කළු දුම් පිටවීමෙන් එම දැන්වීම ප්‍රකාශ කරනු ලැබීය. පළමු අවස්ථාවේදී මෙම කාර්ය සඳහා ගතවූ කාලය පැයක් පමණ වූවත් මුළු රැස්වීම් ශාලාව තුළ ගැඹුරු නිශ්ශබ්දතාවයක් පැවතිනි. ඉන්පසු දරුවෝ තම තමන්ගේ පන්ති කරා ගියෝය.

පාසල් කාලය අවසන් කිරීමට පැයක් පමණ තිබියදී සියළු සිසු දරුවන් රැස්වීම් ශාලාවට යළි කැඳවන ලදී. ඒ සමගම රහස් ඡන්දය ප්‍රකාශ කිරීම ආරම්භ වී ඇත. ඡන්දය භාවිත කිරීමෙන් පසුව, නිරීක්ෂකයන් විසින් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලැබීය. ගණන් කිරීම අවසානයේදී සුදු දුම් පිටාරයෙන් හෙළි දක්වනු ලැබුවේ තුනෙන් දෙකක ඡන්ද ලබා ගැනීමෙන් නව පාප් තුමකු පත්වී ඇති බවය. 'අපට පාප් තුමකු ලැබී ඇත" යනුවෙන් ප්‍රකාශ කරමින් තෝරා ගනු ලැබූ තැනැත්තා 1 වැනි සෙබස්තියන් වශයෙන් හඳුන්වා දෙනු ලැබීය. ශාලාවේ එක්රැස් වී සිටි දරුවෝ ඒ ඒ රටවල් නියෝජනය කැරෙනා ධජයන් ඔසවාලමින් ප්‍රීති ඝෝෂා පැවැත්වූහ. 'මෙම අභ්‍යාසය ඇදැහිල්ල පිළිබඳ සැබෑ පාඩමක් දරුවන් වෙත ඉදිරිපත් කරනු ලැබුවා. දරුවෝ ද මෙම අභ්‍යාසය යැදුම් දැහැමින් පිළිගත්තා. සැබැවින්මැ මෙවන් සක්‍රීය ක්‍රියාදාමයන් තුළින් කතෝලික සංඝය තුළ තමන්ගේ කැඳවීම කෙරෙහි විවෘතව සිතීමට දරුවන්ට මඟපෙන්වීමක් ද වෙනවා.' මෙලෙස පැවැසුවේ එම පාසලේ විදුහල්පති තුමාය.

## කාදිනල් සංසදය රැස්වෙද්දී රෝම තරුණ මධ්‍යස්ථානය අඛණ්ඩ යැදුමේ

ලෝක කතෝලික ශිෂ්‍ය හා තරුණ මධ්‍යස්ථානය රෝමයේ පිහිටා ඇත. නව සසුනිසුරාණන් පත් කිරීමේ සංසදය පවත්නා කාලය පුරාවට ශිෂ්‍යන් හා තරුන තරුණියන් පැය 24 ක කාලය පුරා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඳනමස්කාර කිරීමේ නිරත වන බැව් එම මධ්‍යස්ථානය විසින් ප්‍රකාශ කොට තිබේ.

'ශුද්ධාත්මයාණන්ගේ ආගමනය තෙක් අපෝස්තුළුවරු දේව මාතාවන් පිරිවරාගෙන ඇදැහිල්ලේ යැදුමේ නිරතව සිටියා සේ අප ද නව සුධොතුම් පියෙකු තෝරාගනු ලැබීම තෙක් අඛණ්ඩව යැදුමේ යෙදී සිටිනවා.' මෙලෙස පැවැසුවේ එම මධ්‍යස්ථානය බාර තේබියන් ලැම්බර්ට් පූජක තුමාය.

කාදිනල් සංසදය ආරම්භ වෙත්මැ මෙම දිව්‍ය සත්ප්‍රසාද යැදුම් වන්දනාව ආරම්භ කැරුමට නියමිතව වී, තවද මාර්තු මස 15 වැනිදා ශිෂ්‍ය ශිෂ්‍යාවෝ හා තරුණ තරුණියෝ සා. පීතර චතුරශ්‍රය දක්වා සත්ප්‍රසාද වහන්සේ රැගත් පා ගමනේ යෙදෙති. ඉන් ඉක්බිති බැසිලිකාවේ පඩිපෙලේ වාඩිලා පොදු ජපමාලය එකාවන්ව උච්චාරණය කරනු ලැබීමට නියමිතයි. පසුව, ඉතාලියේ ග්ලෝවන්නි ද ඊර්කෝල් රදගුරු තුමා විසින් දිව්‍ය යාගය පැවැත්වෙනු ඇත. මෙම ශිෂ්‍ය හා තරුණ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වර්ෂ 1983 දී II වැනි ජුවාම් පාවුළු සසුනිසුරාණන් විසින් පිහිටුවනු ලැබීය. මෙම මධ්‍යස්ථානය පිහිටුවීමේ මුඛ්‍ය පරමාර්ථය වී ඇත්තේ යැදුම ද, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අත්දැකීමද, ලෝක තරුණ තරුණියන් හා සහෝදරත්වය වගා කරවීම ද මගින් ඇදැහිල්ලේ ධර්මදානයේ නිරත වීමයි. ලෝ පුරා වෙසෙන සකළ කතෝලික ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා තරුණ තරුණියන් විසින් මෙම මධ්‍යස්ථානය ඔවුන්ගේ මහ ගෙදර වශයෙන් සලකනු ලබන බැව් වාර්තා වේ.

## සුදොතුම් පිය නිළවරණය සඳහා නව බඳුන්

සසුනිසුරාණන් තෝරා ගැන්මේදී පාවිච්චි කැරෙන නව බඳුන් ජාත්‍යන්තර ජනමාධ්‍යයන් හමුවේදී මාර්තු මස 05 වෙනිදා නිරාවරණය කරනු ලැබීය. මෙම නව බඳුන් නිර්මානය කරනු ලැබුවේ, ඉතාලි ජාතික නිර්මාණ ශිල්පි සෙක්කෝ බොනානෝතෝ විසිනි.

නව සසුනිසුරාණන් කෙනෙකු තෝරාගනු ලැබීමේදී ඡන්ද පත්‍රිකා බහලනු ලබන චැලිසය නැතහොත් ශුද්ධ වූ බඳුන් පිළිබඳ ඉපැරණි ප්‍රතිරූපයක් පිළිබිඹු කැරෙන වියමන් ගෙතුමක් වතිකාන කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කරනු ලැබ ඇත. වර්ෂ 1623 සිට 1644 කාලපරාසය තුළ සිටි සුදොතුම් පියාණන් වන යුර්බාන් විලි උතුමාණන් තෝරාපත් කරනු ලැබූ අවස්ථාවේදී ඇතිවූ සිද්ධියක් එම ගෙත්තම මගින් පිළිබිඹු කැරේ. එම ශුධොතුම් පිය නිළවරණයේදී එක් ඡන්ද පත්‍රිකාවක් අස්ථාන ගතවී තිබිණි. අස්ථානගත එම ඡන්ද පත්‍රිකාව විසල් බඳුණේ ඇත්දැයි සුපරික්ෂාකාරක වරයා සොයා බලනා අයුරු එම ගෙත්තමෙන් හුවා දක්වා ඇත. එකී ගෙත්තමේ දැක්වෙන බඳුනට සමාන බඳුනක් සිස්ටයින් දෙව් මැඳුරේ ආරක්ෂා සහිතව තබා ඇත. II වැනි ජුවාම් පාවුළු තුමා තෝරා ගැන්ම දක්වා, පසුගිය ශතවර්ෂය පුරාම සසුනිසුරාණන් තෝරා ගැන්මේ සංසදයන් හී එම බඳුන ඡන්ද පත්‍රිකා බහාලීම සඳහා පාවිච්චි කොට ඇත.

වර්ෂ 1996 පෙබරවාරි මස 22 වෙනිදා II වැනි ජුවාම් පාවුළු රෝමානු සසුනිසුරාණන් තෝරා ගැන්මෙන්, අපෝස්තලික ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරනු ලැබීමේදී, නව ධර්මතාවයන්ට අනුකූලව බඳුන් ලබාගත යුතු වේ. රෝගාතුර වීමෙන් සිය කුටි වලින් බැහැරවිය නොහැකි කාදිනල් වරුන් වෙතොත් ඔවුන්ගේ ඡන්ද ලබා ගැනීම සඳහා පාවිච්චි කළ හැකි තවත් එක් බඳුනක් ද අවශ්‍ය වේ. එහෙත් II වැනි ජුවාම් පාවුළු සසුනිසුරාණන්ගේ සමයේදී එක් බඳුනක් වෙනුවට බඳුන් 3 ක් ම සකස් කරනු ලැබීය.

බඳුන් වල ක්‍රියාකාරිත්වය ව්‍යවස්ථාවේ 5 වැනි පරිච්ඡේදයේ සවිස්තර කර ඇති අතර පළමු බඳුන මත තැටියක් තැබිය යුතු යයි ද දක්වා ඇත. සිය ඡන්ද පත්‍රිකාව තැටිය මත තබා බඳුන තුළට දැමීම කළ යුතු වේ. රෝගාතුරවීමෙන් සංසදය වෙත ඒමට නොහැකි කාදිනල්වරුන් වෙතොත් ඔවුන් විසින් පමණක් දෙවැනි බඳුන පාවිච්චි කරනු ලැබීය හැක. සුධොතුම් පියෙකු තෝරාගෙන ඇතය හෝ නැතය දැනැවෙන සම්ප්‍රදායික කළු හෝ සුදු දුම් පිට කරනු ලැබීමෙන් පසුව ඡන්ද පත්‍රිකා ගිනිබත් කෙරුම සඳහා ඒවා එක්රැස් කර ගැන්මට තුන්වන බඳුන පාවිච්චි කරනු ඇත.

## ඉස්ලාම් නායකයෝ ඉසිඹුලත් සසුන් පියාණන් අගයත්

රටවල් 43 ක ඉස්ලාම් ආගමික නායකයන් 148 දෙනෙකු විසින් ඉසුඹුලත් XVI වැනි බෙනඩික්ට් ශුධොතුම් පියාණන් අගයමින් පොදු ප්‍රකාශයක් නිකුත් කරත. වර්ෂ 2006 සැප්තැම්බර් මස 12 වෙනිදා XVI වැනි බෙනඩික්ට් ශුධොතුම් පියාණන් විසින් ජර්මනියේ රිජෙන්ස්බර්ග් විශ්ව විද්‍යාලයේදී 'ඇදහිල්ල සහ තර්කය' යන තේමාව යටතේ කරන ලද දේශ නයේදී ඉස්ලාම් දහම පිළිබඳ එක් වැරැදි මතයක් ප්‍රකාශ විණි යැයි එම ඉස්ලාම් නායක කණ්ඩායම විසින් ප්‍රකාශ කැරුණු විට, ශුධොතුම් පියා ඒ පිළිබඳව සිය කණගාටුව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ සේක.



එතුමාගේ එම කණගාටුව දැක්වීමේ ප්‍රකාශය එදා මහ ඉහළින් පිළිගනු ලැබීය. ඉන් ඉක්බිති, එම ඉස්ලාම් නායක කණ්ඩායම විසින් ලෝක කිතුනු ජනතාව හා ලෝක ඉස්ලාම් ජනතාව අතර සමගි සන්ධානය වර්ධනය කරනු වස් XVI වැනි බෙනඩික්ට් ශුධොතුම් පියාණන්ට නායකත්වය ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

ඒ අනුව බොහෝ අවස්ථාවන් හිදී අන්තර් ආගමික සාකච්ඡා මගින් ලෝක කිතුනු ඉස්ලාම් ජනතාවන් අතර සමගිය වර්ධනය කිරීමේලා ශුධොතුම් පියාණන් ගත් වෑයම කෙරෙහි එම ඉස්ලාම් නායක කණ්ඩායම ශුධොතුම් පියාණන් වෙත සිය ගෞරවය පුදදෙන බැව්ද ප්‍රකාශනයේ දක්වා ඇත. සමස්ථ ලෝක ජනතාවගෙන් අඩකට වඩා වැඩි කොටසක් කිතුනුවන් හා ඉස්ලාම් බැතිමතුන් වන හෙයින් XVI වැනි බෙනඩික්ට් ශුධොතුම් පියාණන් විසින් ඇතිකළ සමගි පදනම ඉදිරියට ගෙන යා යුතු යයි ද එම ඉස්ලාම් නායකයෝ සිය ප්‍රකාශනයේ හුවා දක්වති.

## අප්‍රිකාවේ ටන්සානියාවේදී පූජක තුමකු ඝාතනය කැරේ

එවිරිස් මුෂි පියතුමා පෙබරවාරි මස 17 වෙනිදා උදෑසන සැන්ෂියාර් නගරයේ සා. ජුසේ තුමාගේ ආසන දෙව් මැඳුරට පැමිණියේ ඉරිදා දිව්‍ය යාගය පැවැත්වීම සඳහාය. එතුමා සිය වාහනය නවතා දොර විවර කොට බිමට පා තැබුවා පමණි. එකෙනෙහිම මෝටර් සයිකලයක නැගගත් දෙදෙනෙක් එතැනට කඩා වැදුණේය. මෝටර් සයිකලයේ පිටුපස වාඩිගෙන සිටි කෙනා විසින් පිස්තෝලයකින් පියතුමා වෙත වෙඩි පහර තුනක් එල්ල කරන ලදි. පියතුමා එතැනම දිවිපුද දුන්නා. මෙලෙසින් මාධ්‍යයට ප්‍රකාශ කරනු ලැබුවේ සන්ෂියාර් හී ඔගස්ටින් ෂාවෝ රදගුරු හිමිපාණන් විසිනි.



පසුගිය සති කීපය තුළදී ද පුවත්පත් මගින් හෙළිදරව් කර තිබුණේ රදගුරු හිමිවරුන්ට මෙන්ම පූජක හා පැවිදි අයට ද මරණ තර්ජන එල්ල වෙමින් පවත්නා බවයි. පසුගිය නත්තල් සමයේදී අම්බ්‍රෝස් මන්තන්ඩා නම් පියතුමා වෙත ද වෙඩි පහර එල්ල කොට තදබල හානි සිදුකරන ලදී. එතුමා තවමත් අසීරු තත්ත්වයෙන් රෝහල් ගතව සිටී. පසුගිය 2012 වසර තුළදී ටන්සානියාවේ කතෝලික දෙව් මැඳුරු දෙකක් ද වෙනත් කිතුනු සභාවන්ට අයත් දෙව් මැඳුරු කීපයක් ද විනාශ කොට තිබුණි. කිතුනුවන්ට පහර දෙන නව කණ්ඩායමක් බිහිවී ඇති බව ප්‍රචලිත නමුත් ඒ පිළිබඳ පූර්ණ සොයා ගැන්මක් පොලීසිය විසින් තවම සොයාගෙන නොමැති යයි වාර්තා වේ.

## කිතු දහමට හැරවීමේ චෝදනාවට මරණීය දඬුවම

ලිබියාව සියයට සියයක් ඉස්ලාම් භක්තිකයන්ගෙන් සමන්විත වේ. ඒ රට තුළ වෙනත් ආගමක් පතුරුවාලීම මරණ දණ්ඩනය කරා ගෙනයා හැකි වරදකි. එම වාතාවරණය යටතේ, පසුගිය සතියේ පත්‍රිකා මාර්ගයෙන් කිතුනු දහම පතුරුවාලීමට යත්න දරා ඇතැයි යන චෝදනාව මත විදේශිකයන් සතර දෙනෙකු සිරබාරයට ගෙන ඇත. ඔවුහු ඇමෙරිකාවේද, ඉජිප්තුවේද, දකුණු කොරියාවේ ද, දකුණු අප්‍රිකාවේ ද පුරවැසියෝ වෙති. ඔවුන් වෙත එල්ල කොට ඇති චෝදනාව වී ඇත්තේ, කිතුනු ආගම පතුරුවාලීම පිළිබඳ පත්‍රිකා විශාල සංඛ්‍යාවක් පතුරුවා හැරීම සහ තවත් පත්‍රිකා 45,000 ක් පමණ මුද්‍රණය කරගෙන යෑම වේ. අදාළ මුද්‍රණාල ගොඩනැගිල්ල ද උපකරණ ද පොලීසිය යටතට ගෙන ඇත. වැඩිකල් නොයා ඔවුන් සතරදෙනා ලිබියානු අධිකරණය වෙත ඉදිරිපත් කෙරෙනු ඇත. දැනට වාර්තා වෙන ආකාරයට එල්ල වන චෝදනා ඔප්පු වුවහොත් ඔවුන් සතරදෙනා මරණ දඬුවමට පාත්‍ර වෙනු ඇතැයි වාර්තා කැරේ.

## සූඩානයේ කිතුනු පීඩන දිගින් දිගටම

උතුරු සූඩානයේ කිතුනුවන් 55 දෙනෙකු විවිධ වාචික චෝදනා මත පසුගිය සතියේ රාජ්‍ය නිළධාරීන් විසින් සිරබාරයට ගෙන ඇතැයි ද, එමෙන්මැ කිතුනු පාසල් කීපයක් වසා දමා ඇතැයි ද ලෝපුරා කිතුනු පීඩන හෙලි දක්වන්නාවූ "ලෝක කිතුනු සහෝදරත්වය" නම් සංවිධානය විසින් ජාත්‍යන්තර ජනමාධ්‍ය වෙත ප්‍රකාශ කොට ඇත. රාජ්‍ය අනුග්‍රහය යටතේ කැරෙන කිතුනු විරෝධි ක්‍රියාකාරකම් වලට විවිධ මාධ්‍යයන් විසින් ද අනුබල ලබාදෙන බැව් ද වාර්තා වේ.

උතුරු සූඩානය හා දකුණු සූඩානය අතර යුද්ධයක් වර්ෂ 1983 සිට වර්ෂ 2005 දක්වා පැවැතිනි. දකුණු සූඩාන බහුතරය කිතුනුවන් වන අතර උතුරු සූඩානයේ බහුතරය ඉස්ලාම් භක්තිකයෝය. වර්ෂ 2011 දී පැවැති ජනමත විචාරණය අනුව දකුණු සූඩානයේ අති බහුතරය විසින් ප්‍රකාශ කරනු ලැබුවේ තමන් ස්වාධීන රාජ්‍යයක් බවට පත්විය යුතුය කියාය. මේ අනුව වර්ෂ 2011 ජූලි මාසයේදී දකුණු සූඩානය ස්වාධීන රාජ්‍යයක් බවට පත් වුවත් උතුරු සූඩානයේ පදිංචි කිතුනුවන් විශාල සංඛ්‍යාවක් දකුනු සුඩානයට පැමිණියේ නැත. මේ නිසාවෙන් උතුරු සූඩානයේ වෙසෙන කිතුනුවන්ට නිරන්තර තාඩන පීඩන සිදු කෙරෙන බැව් වාර්තා වේ. එම කිතුනු ජනතාව අයිති වන්නාවූ උතුරු සූඩානයේ කතෝලික සංඝය එරටේ අගනුවර වන කාර්කුං හී වෙසෙන කාදිනල් තුමා විසින් මෙහෙයවනු ලබයි.

## හිටපු ජනපති වාවෙස් වෙනුවෙන් දුක්ගාවිනා පූජාවක්

වෙනිසියුලාවේ අතිඋතුම් ජෝර්ජ් උරෝසා කාදිනල් සාමිනෝ හිමිපාණන් රෝමයට පැමිණියේ නව සසුනිසුරාණන් තෝරා ගැන්මේ සංසදයට සහභාගි වීම සඳහාය. වෙනිසියුලාවේ කතෝලිකයකු වන හිටපු ජනපති හියුගෝ චාවේස් ගේ මරණය හේතුකොට ගෙන ඔහුගේ ආත්මය වෙනුවෙන් දෙවිඳුන් යදින්නැයි කාදිනල් හිමිපාණෝ සිය කතෝලික ජනතාවගෙන් ඉල්ලීමක් කළහ. තවද නැසීගිය හිටපු ජනපති හියුගෝ චාවෙස්ගේ ආත්මය වෙනුවෙන් දුක්ගාවිනා පූජාවක් පැවැත්වීමට කටයුතු යොදා ඇති බැව් ද කාදිනල් තුමා නිවේදනය කර තිබේ.

රෝමයේදී පැවැත්වෙන එම දුක්ගාවිනා දිව්‍ය යාගයට රෝමයේ ජීවත්වන වෙනිසියුලානු ජාතිකයෝ එක්වෙති.

ටික කළකට ඉහතදී හියුගෝ චාවෙස්ගේ රෝගය අසීරු වෙද්දී ඔහු විසින් සිය කැමැත්තෙන් රෝගීන්ගේ ආලේපය ද දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ද ලබාගෙන ඇත. නැසී ගිය ජනපති හියුගෝ චාවෙස්ගේ 'කුරුළු හඬින්' (TWITTER) ප්‍රකාශ කළ අවසන් වදන් වී ඇත්තේ 'මම තවමත් ක්‍රිස්තුන් වහන්සේට තුරුළුව සිටිමි; මගේ වෛද්‍යවරුන් ද විශ්වාස කරමි' යන්නයි.

බැසිල් ෆොන්සේකා විසිනි



**අති උත්තම සොළොස්වන බෙනඩික් සසුනිසුරාණන් සසුන් පිය ධුරයෙන් ඉසිඹු ලැබීමට ගත් තීරණයත් සමඟින් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ දී ශුද්ධෝත්තම පියතුමාගේ සේවය ඇගමේ විශේෂ සැසිවාරයක් පෙබරවාරි 20 දා පැවැත්විණි. එහිදී ඉදිරිපත් වූ අදහස් කිහිපයක් පසුගිය සතියේ පළවිය. මේ එහි ඉතිරි කොටසයි**



# ලොකු බලයක් තියෙන ආධ්‍යාත්මික නායකයෙක්

## ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)

**ගරු කතානායකතුමනි. අපේ ආධ්‍යාත්මික නායකයා වෙනුවෙන්, කතෝලික සභාවේ ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කරමින් කටයුතු කරන පාප් වහන්සේ වෙනුවෙන් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රතිබිම්බයක් කියලා කිව්වොත් හරි. කතෝලිකයකු වශයෙන් වචන කිහිපයක් කථා කිරීමට ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා.**

විශේෂයෙන්ම මම මතක් කරන්නට ඕනෑ. දේශපාලන නායකයකුට වඩා ආධ්‍යාත්මික නායකයකුට ලොකු බලයක් තිබෙනවාය කියා. බිලියන එකකට වැඩි කතෝලිකයන් ප්‍රමාණයක් මෙහෙයවන මේ ආධ්‍යාත්මික නායකයාගේ වචනය විශ්වාස කරන්න, ඒ වචනයට ගරු කරන්න එසැණින්ම ඉදිරිපත් වන විශාල ජන කොටසක් මේ මිහිතලය මත ඉන්නවා. අයතුල්ලා කුමේනි, ටිබෙට් දේශයේ දලයි ලාමා වාගේ තවත් ආධ්‍යාත්මික නායකයන් රැසක් ඉන්නවා. ඔවුන්ට දේශපාලනඥයන්ට වඩා ලොකු බලයක් තිබෙනවා. ඒ අයගේ ක්‍රියා කලාපය සාමය මුල් කර ගත්තු එකක්. ගරු කථානායකතුමනි, කතෝලික ආගමේ අපට ලොකු ශක්තියක් වුණා, අතිඋතුම් මැල්කම් රංජිත් අගරදගුරුතුමා අපේ මේ පුංචි දිවයිනේ කාදිනල්වරයකු වශයෙන් පත් කිරීම. එතුමාව කාදිනල්වරයකු වශයෙන් පත් කිරීමට පාප් වහන්සේ ගත්තු උත්සාහය ගැන අපි උන්වහන්සේට හිස නමා නමස්කාර කරනවා. ප්‍රශංසා කරනවා. කාදිනල්වරු 117 දෙනෙකුගෙන් අලුත් පාප් වහන්සේ කෙනෙක් තෝරා පත් කර ගන්න රැස් වෙද්දී මේ පුංචි දිවයින නියෝජනය කරන්න අවස්ථාවක් ලැබීම දේව හාස්කමක් විධියටයි අපි දකින්නේ.

ගරු කථානායකතුමනි, මම කියන්න කැමැතියි, පාප් වහන්සේගේ සේවය සුළුපටු සේවයක් නොවෙයි කියා. උන්වහන්සේ හැම දාම අන්‍ය ආගමිකයන්ට ගරු කරපු නායකයෙක්. නියාස් මවුලවිතුමා, බෙල්ලන්විල විමලරතන නායක ස්වාමින් වහන්සේ, හින්දු පූජකවරුන් පවා උන්වහන්සේ හමුවුණු බව මට මතකයි. ඒ තරමට උන්වහන්සේ නිහතමානි වුණා. මටත් අවස්ථාවක් ලැබුණා, අති ගරු ජනාධිපතිතුමාත් එක්ක ගිහිල්ලා උන්වහන්සේ බැහැ දැකලා උන්වහන්සෙගේ මුදුව සිපාචාර කරන්න. පාප් වහන්සේ දෙනමකගේ ඒ මුදුව සිපාචාර කරන්න මට අවස්ථාව ලැබුණා.

ගරු කථානායකතුමනි, කතෝලික ජනතාව වෙනුවෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. අපේ පාප් වහන්සේගේ මඟ පෙන්වීම යටතේ මූල ධර්මවාදී සිතුවිලි නැතුව සහජීවනයෙන්. අන්‍ය ආගමිකයන්ට ගරු කරමින් කටයුතු කරන සභාවක් මේ රටේ පවත්වා ගෙන යන්නට අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ට පුළුවන් වීම ගැන අපි සන්තෝෂ වෙනවා. නීතියේ තිබෙන අඩු පාඩුවලින් සමහර අය එක එක ආයතන පිහිටුවා ගෙන මූල ධර්මවාදීන් විධියට කටයුතු කරද්දී ඊට හාත්පසින්ම වෙනස්ව, දේව විශ්වාසය පදනම් කර ගෙන, සාමය විශ්වාස කර ගෙන ඇත්ත වශයෙන්ම ක්‍රිස්තුස් වහන්සේගේ මඟපෙන්වීම යටතේ කටයුතු කිරීම ගැන අපි විශේෂයෙන්ම ආඩම්බර වෙනවා.

නව පාප් වහන්සේ පත් කර ගැනීමට කාදිනල් තුමන්ලා 117 නමක් සූදුසුකම් ලබා තිබෙනවා. අපේ කාදිනල් තුමාත් ඒ අතර ඉන්නවා. ගරු කථානායක තුමනි, පාප් වහන්සේගේ සමු ගැනීම අපට වේදනාවක් වුණත් ආගමික සිද්ධාන්තවලට ගරු කරමින් අපි උන්වහන්සේට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.



# ආගමික සහජීවනයක් ඇති කළ උතුම් නායකයෙක්

## ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

**ගරු කථානායකතුමනි, විපක්ෂ නායක සහ එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ යෝජනාවක් පරිදි, එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමේ එකගත්වය අනුව විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ජෝන් අමරතුංග මැතිතුමා විසින් අද දින මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අති උත්තම දහසයවන බෙනඩික්ට් පාප් වහන්සේගේ සේවය අගය කිරීම ගැන විශේෂයෙන්ම කතෝලික පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස යමක් කියන්නට මටත් අවස්ථාවක් ලැබීම මගේ ජීවිතයේ මා ලද භාග්‍යයක් ලෙස සලකන්නට කැමැතියි.**

ගරු කථානායකතුමනි, ඔබතුමා රුහුණේ හොඳ බෞද්ධයෙක්. අන්න ඒ වාගෙ ම රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් හෙලේනා විජේවර්ධන මැතිනියගේ පරම්පරාවෙන් පැවත එන හොඳ බෞද්ධයෙක්. ගරු කථානායකතුමනි. ඔබතුමාගේ අනුමැතිය ඇතුව විපක්ෂ නායකතුමා මේ යෝජනාව ගෙන ආවා. අපේ කතෝලික සභාවේ ආධ්‍යාත්මික නායකයා ලෙස අපි ඉතාමත්ම ගෞරවයෙන් සලකන අති උත්තම දහසයවන බෙනඩික්ට් පාප් වහන්සේගේ සේවය අගය කිරීමට මේ උත්තරීතර පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමුවැනි වතාවට අවස්ථාවක් ලබාදීම ගැනත්, ඒ සඳහා අපට අවස්ථාව ලැබීම ගැනත් මා සතුටු වෙනවා. ඒ ගැන මා ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙම යෝජනාව මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ගෙන ඒමට ක්‍රියා කළ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ජෝන් අමරතුංග මැතිතුමාටත්, විපක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තුවේ ඉදිරි පෙළ මන්ත්‍රීවරයෙක් ලෙසත් කතෝලික මන්ත්‍රීවරයෙක් ලෙසත් මා ස්තුතිය පළ කරන්නට කැමැතියි.

අති උත්තම දහසයවන බෙනඩික්ට් පාප් වහන්සේ කතෝලික සභාව තුළ විප්ලවවාදී ආධ්‍යාත්මික නායකයෙක් වුණා. උන්වහන්සේ මේ නවීන ලෝකයේ කතෝලික දහම ප්‍රචලිත කරන්නට, අපේ රටේ පමණක් නොව සමස්ත ලෝකයේම ජනතාව අතර කතෝලික විශ්වාසය ප්‍රචලිත කරන්නට උදාර නායකත්වයක් ලබා දුන් පාප් වහන්සේ නමක් හැටියටයි මම දකින්නේ. විශේෂයෙන්ම උන්වහන්සේ ආගමික සමගිය ඇති කරන්නට සියලුම ආගමික නායකයන් සමග එකම වේදිකාවක එකට එක්ව ක්‍රියා කරන්නට කටයුතු කළ ආධ්‍යාත්මික නායකයෙක් ලෙස ඉතිහාසගත වනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා ආගම්වාදය ජාතිවාදයට රුකුලක් බව. ආගම්වාදයත් ජාතිවාදයත් බෙදුම්වාදයට රුකුලක්. කතෝලික දහම උගන්වන සාමය. එකමුතුකම, සංහිඳියාව අනුව යමින් ලෝකයේ විවිධ ජාතින් විවිධ ආගම් අදහන භක්තිකයන් එකම සමාජයක එකම පවුලක් ලෙස ජීවත් වීමේ වැදගත්කම අති උත්තම දහසයවන බෙනඩික් පාප් වහන්සේ අපට පෙන්වා දුන්නා. උන්වහන්සේ විසින් කැඳවන ලද ලෝකයේ ආගමික නායකයන්ගේ ජාත්‍යන්තර සම්මේලනයකට සහභාගි වන්නට මටත් අවස්ථාවක් ලැබුණා.

ගරු කථානායකතුමනි, මා නියෝජනය කරන මීගමුව පුරවරය හඳුන්වන්නේ 'පුංචි රෝමය' කියලයි. කතෝලිකයන් බහුතරයක් ජීවත් වන මේ පුංචි රෝමයේ සමස්ත කතෝලික ජනතාව පමණක් නොව, සමස්ත ශ්‍රී ලාංකීය ජනතාවගේ ත්‍යාගයක් ලෙස අපේ රටේ සම්ප්‍රදායානුකූල මූර්ති ශිල්පය අනුව තැනවූ උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රතිමාවේ අනුරුවක් දහසයවන බෙනඩික්ට් පාප් වහන්සේ වෙත පරිත්‍යාග කරන්නට, පූජා කරන්නට ශ්‍රී ලංකාවේ වතිකාන තානාපති අති උතුම් ජෝශප් ස්පිටේරි අගරදගුරුතුමාත් කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගෙත් මඟපෙන්වීම යටතේ මට අවස්ථාවක් ලැබීම මා ලැබූ තවත් භාග්‍යයක් හැටියට මා සලකනවා.

ගරු කථානායක තුමනි, අපේ රටේ ජීවත් වන සිංහල, දෙමළ සහ මුස්ලිම් යන මේ හැම ජන කොටසකට එක හා සමාන අයිතිය, එක හා සමාන උරුමය, එක හා සමාන අවස්ථාවන් ලබාදිය යුතු, ලැබිය යුතු අවස්ථාවකයි අප සිටින්නේ. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වෙන්නට ඕනෑ. අපේ රටේ ස්වාධීන කොමිෂන් පිහිටු විය යුතු අවස්ථාවකයි අද අපි ජීවත් වන්නේ. ස්වාධීන මැතිවරණ පැවැත්වීම, ස්වාධීන රාජ්‍ය සේවයක්, ස්වාධීන අධිකරණ සේවයක්, ස්වාධීන පරිපාලන සේවයක් මේ රටට අත්‍යවශ්‍ය අවස්ථාවක පාප් වහන්සේගෙන් අපට ලබාගත හැකි උපරිම ආදර්ශය නම් ප්‍රජාතන්ත්‍රවාදය සුරැකෙන මානව හිමිකම් සුරැකෙන ශ්‍රී ලාංකීය සමාජයක් බිහිකිරීමයි.

ගරු කථානායක තුමනි, අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න කැමැතියි. දහසයවැනි බෙනඩික්ට් පාප් වහන්සේට අපට ලබා දිය හැකි උපරිම ගෞරවය, ආචාරය අපි පිරිනමන්න ඕනෑ. උන්වහන්සේ අපට උගන්වපු, උන්වහන්සේ අපට කියා දුන්නු, උන්වහන්සේ අපට මග පෙන්වපු කතෝලික දහමේ තිබෙන මේ අර්ථවත් ආදර්ශය අනුව ශ්‍රී ලාංකීය සමාජය නිර්මාණය කර ගැනීමට මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් මන්ත්‍රීවරු පමණක් නොව, රටේ රාජ්‍ය නායකයා ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත් ක්‍රියා කළ යුතුය කියන කාරණය මා මේ අවස්ථාවේ දී මතක් කර දෙන්නට කැමැතියි.

ගරු කථානායකතුමනි, දහසයවැනි බෙනඩික්ට් පාප්වහන්සේට අප අදහන ආගම අනුව දෙවියන් වහන්සේගේ ආශිර්වාදයෙන් නිරෝගී වේවා, දීර්ගායුෂ ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ශ්‍රී ලංකාව කියන පුංචි රටේ අපේම කාදිනල් හිමිපාණන් වහන්සේ නමක් වන අති උතුම් මැල්කම් රංජිත් හිමිපාණන් වහන්සේට දෙවියන් වහන්සේගේ මිදි උයනේ තවත් උසස් ස්ථානයක, උසස් තනතුරකට පත් වන්නට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ලැබේවා කියලාත් ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

# ශ්‍රේෂ්ඨ මනුෂ්‍යත්වයක් ඇති උතුම් ආගමික නායකයෙක්

## ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)



**ගරු කථානායක තුමනි, අති උත්තම බෙනඩික්ට් පාප් වහන්සේ පාප් තනතුරෙන් ඉවත් වීමට තීරණය කිරීම ගැන මුළු ලෝකයම කම්පාවට පත් වුණා. මොකද, මීට අවුරුදු 600 කට උඩදී තමයි පාප් වහන්සේ නමක් ඒ විධියට ඉල්ලා අස් වුණේ. උන්වහන්සේගෙන් මෙහෙම ඉල්ලා අස් වන්න හේතු වුණේ මොකක්ද කියලා ඇහුවාම, "මාගේ වයස අනුව සනීප ගතිය මදි නිසා මම ඉල්ලා අස්වනවා" කියන ප්‍රකාශය තමයි කර තිබෙන්නේ. තමන්ට තේරෙනවා නම්, වයස අනුව ඒ වැඩ කොටස් කරන්න බැහැ කියලා එතැනින් ඉවත් වන එක සුදුසුයි කියන එක උන්වහන්සේ ලෝකයටම පෙන්වූවා.**

ගරු කථානායකතුමනි, අතිඋත්තම බෙනඩික්ට් පාප් වහන්සේ පසු ගිය කාල සීමාව තුළ දී ලෝකයට නොයෙක් විධියේ අවවාද, අනුශාසනා කළා. මොකද පසු ගිය කාලයේ ලෝකයේ හුඟක් රටවල එක එක ආගම් වශයෙන් නොයෙක් විධියේ කලබලකාරි තත්ත්වයන් ඇති වුණා. කතෝලික ආගම විතරක් නොවෙයි, වෙන වෙන ආගම් වශයෙන්, ජාතීන් වශයෙන්, ප්‍රදේශ වශයෙන් ඇති වුණු ඒ කරදරකාරී තත්ත්වයන් ගැන උන්වහන්සේ කෙළින්ම ප්‍රකාශ කළා, මනුෂ්‍යත්වයේ ශ්‍රේෂ්ඨත්වය ආරක්ෂා කරමින් මේ කලබලකාරී තත්ත්වයන් මනුෂ්‍යයන් විසින් ඇති කරන්න එපා, සාමයෙන් සමාදානයෙන් ඉන්න උත්සාහ කරන්න ඕනෑය කියලා.

ගරු කථානායකතුමනි, ක්‍රිස්තුස් වහන්සේගේ දේශනාවේ තිබෙන ප්‍රධාන වදන් තමයි සාමය, අනුකම්පාව වාගේම කරුණාසහගත බව. ඒ කාරණය මේ අති උත්තම බෙනඩික්ට් පාප් වහන්සේ ලෝකයට ප්‍රකාශ කළා. මොන ආගමේ වුණත්, මොන ජාතියේ වුණත්, මොන රටේ වුණත් ලෝකයේම ජනතාව සාධාරණව බයෙන් සැකෙන් තොරව ජීවත් වන්න ඕනෑය කියන තත්ත්වයක් ලෝකයට ප්‍රකාශ කිරීමට උන්වහන්සේගේ කාල පරිච්ඡේදයේදී උන්වහන්සේ හුඟාක් උත්සාහ ගත්තා. උන්වහන්සේ මේ තනතුරට පත් නොවුණා නම්, මහාචාර්ය කෙනෙක් වනවා. එහෙම හැකියාවක් තියෙද්දි තමයි මේ පදවියට උන්වහන්සේ තෝරාගත්තේ.

ගරු කථානායකතුමනි, මම 1994 අවුරුද්දේ ඉඳලා හැම අවුරුද්දකම ඒ ස්ථානයට ගියා. ඒ කාල සීමාව තුළ සිටි පාප් වහන්සේලා මම මුණ ගැහුණා. ඒ වාගේම උන්වහන්සේලා සමග සාකච්ඡා කළා. උන්වහන්සේ ගෙන් බොහෝ හොඳ අවවාද, අනුශාසනා අපට ලැබුණා. මම කාෂිකර්ම ඇමති වශයෙන් සිටි කාලයේදී රෝමයේ තිබුණු ඒ හැම රැසවීමකටම යනකොට අපි ඔක්කෝම ඒ ස්ථානයට ගිහිල්ලා උන්වහන්සේලාත් එක්ක සාකච්ඡා කළා.

කතෝලික ආගමේ මූලස්ථානය හැටියට වතිකානයේදී උන්වහන්සේලා හැම දාම ලෝකය යථා තත්ත්වයට පත් කිරිමට, ශ්‍රේෂ්ඨ මනුෂ්‍යත්වයක් ඇති කිරීමට ගත් උත්සාහයන් එයින් පැහැදිලි වෙනවා. පාප් වහන්සේ පමණක් නොවෙයි, ක්‍රිස්තියානි ධර්මය අනුව ජීවත්වන සැම දෙනාම තමන්ගේ ආගම හරියාකාරව ආරක්ෂා කරමින්, තමන්ගේ ආගම අනුව ධර්මානුකූලව ජීවත් වෙමින්. අනෙක් ආගම්වලටත් ගෞරව දක්වමින්, ශ්‍රේෂ්ඨ මනුෂ්‍යත්වයක් ඇති කිරීමට ශ්‍රී ලංකාව තුළ උත්සාහ කිරීම ඉතාම වැදගත්.

ගරු කථානායකතුමනි, අපි හුඟක් සන්තෝෂ වන තවත් කාරණයක් තිබෙනවා. අති උත්තම බෙනඩික්ට් පාප් වහන්සේගේ කාල පරිච්ඡේදයේදී තමයි අපේ අති උතුම් මැල්කම් රංජිත් උතුමාණන්ට කාදිනල් පදවිය ලැබුණේ. ඒකත් අපට ලොකු ආඩම්බරයක්. මෑත කාලය තුළ දී මුළු ආසියාවෙන්ම එතුමාට තමයි ඒ පදවිය ලැබුණේ. රට පුංචි වුණත්, පොඩි පිරිසක් වන්දනාමාන කළත්, ලෝකය ගැන කල්පනා කරලා, මිනිස් වර්ගයා ගැන කල්පනා කරලා ඒ අති උත්තම තත්ත්වය ආරක්ෂා කිරීමට, ඒ පුද්ගලයන්ගේ තත්ත්වයන් ආරක්ෂා කර ඒ තුළින් ආගමානුකූලව සහ ජාතික වශයෙන් මිනිස් වර්ගයා වශයෙන් සේවය හරියාකාරව කරන පුද්ගලයන්ට ඒ ස්ථාන දෙන්න ඕනෑය කියන එක උන්වහන්සේ කල්පනා කළ බව එයින් පෙනෙනවා.

උන්වහන්සේගේ ඉල්ලා අස්වීම ගැන එක් පැත්තකින් අපි දුක් වෙන අතර, කාදිනල් පදවියක් අපේ අගරදගුරුතුමාට ලබා දීලා ලෝකයේම ශ්‍රේෂ්ඨ තැනකට ශ්‍රී ලංකාව පත් කිරිමට උන්වහන්සේ ගත් උත්සාහය ගැන එක පැත්තකින් අපි සතුටු වෙනවා. තවදුරටත් අදහස් ප්‍රකාශ කරන්න මට වෙලාවක් නොතිබුණත් හදිසියෙන් හෝ මේ අවස්ථාව ලබාදීම ගැන ගරු කථානායකතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ක්‍රිස්තියානි ධර්මය, කතෝලික ධර්මය ශ්‍රී ලංකාව තුළ පැතිර වීම තුළින් ශ්‍රී ලංකාවේ පවතින ආගම් භේදයන්, ජාති භේදයන් වෙනත් භේදයන් සියල්ලම නැති භංග කරන ක්‍රිස්තියානි ආගමේ උගන්වන ආකාරයේ ධර්මානුකූල සමාජයක්, ශ්‍රේෂ්ඨ සමාජයක් ශ්‍රී ලංකාවේ ගොඩ නැංවීමට සියලු ආශිර්වාදයන් අති උත්තම බෙනඩික්ට් පාප් වහන්සේගේ නාමයෙන් ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නවතිනවා.

# නොබෝ දිනකින් මීගමුව බෝලවලානේ විවෘත වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පිය අන්තර්ජාතික විශ්ව විද්‍යාලය සසුන් පියා ශ්‍රී ලංකාවට ලබා දුන් දායාදයක්

## ගරු සරත් කුමාර ගුණරත්න මහතා
**(ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය)**



ගරු කථානායකතුමනි, ශුද්ධාසනයේ කටයුතු කළ අති උතුම් සොළොස්වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමාණන් මුළු ලෝකයටම ආදර්ශයක් දීලා ඉසුඹු ගත් අවස්ථාවේදී උන්වහන්සේ වෙනුවෙන් වචන ස්වල්පයක් කතා කරන්නට, 'පුංචි රෝමය' කියා හඳුන්වන මීගමුවෙන් කතෝලික මන්ත්‍රීවරයකු හැටියට පාර්ලිමේන්තුවට පත් වෙලා ආපු මම අද ජීවිතයේ ඉතාම ගෞරවාන්විත අවස්ථාවක් ලබා ගන්නවා.

ගරු කථානායකතුමනි, අද පාර්ලිමේන්තුවට ඓතිහාසික දවසක්. මම හිතනව අගරදගුරු කාදිනල් තුමා, අපේ වතිකාන තානාපති රදගුරුතුමා ඇතුළු රදගුරු මඬුල්ලක් පාර්ලිමේන්තුවට පැමිණීමේ අවස්ථාවක් ඉතිහාසයේ කිසිම දිනක උදා වෙලා නැහැ කියලා. එයිනුත් පෙන්නුම් කරනවා කතෝලිකයන් හැටියට ශ්‍රී ලාංකික කතෝලික ජනතාව අපේ අති උතුම් සොළොස්වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමාණන්ට කොතරම් ගෞරවයක් දක්වනවාද කියලා.

ගරු කථානායකතුමනි, ශුද්ධෝත්තම පියතුමාණන් කතෝලිකයන්ගේ නායකයකු පමණක් නොවෙයි. උන්වහන්සේ මුළු ලෝකයටම නායකයෙක්. සාමාන්‍යයෙන් රාජ්‍ය නායකයකුගේ නායකත්වය එක රටකටයි, එහෙම නැත්නම් එක ප්‍රදේශයකටයි යොමු වන්නේ. නමුත් ශුද්ධෝත්තම පියතුමාණන්ගේ හඬ මුළු ලෝකයේම හඬක් හැටියට ප්‍රචලිත වෙනවා.

යම යම් අවස්ථාවල ලෝකයට කථා කරලා වැරැදි දේ වැරැදියි කියලා පෙන්වීමේ හැකියාවක් උන්වහන්සේට තිබෙනවා. උන්වහන්සේ කොයි රටකට ගියත් කතෝලික ද, ඉස්ලාමික ද කියන හැඟීමකින් තොරව ඒ සියලු රට වැසියෝ උන්වහන්සේට ජය ඝෝෂා පවත්වනවා. ඒ නිසා මේ අවස්ථාව පැහැදිලිවම ඉතිහාසගත වන අවස්ථාවක් කියලා මම හිතනවා.

දෙවියන් වහන්සේ ඉදිරියේ සිය වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යමින් ශුද්ධ වූ පේදුරුතුමාගේ අනුප්‍රාප්තිකයකු ලෙස සේවය කළ උන්වහන්සේ සිය ශරීර සෞඛ්‍ය ගැන කල්පනා කරලා, "මේ අවස්ථාවේ මගේ ශරීර සෞඛ්‍ය පිළිබඳ අයහපත් තත්ත්වය නිසා මා මෙම තනතුරෙන් ඉසුඹු ගන්නවා" කියලා එම තනතුරෙන් ඉසුඹු ගැනීම ලෝකයට ලබා දුන්, විශේෂයෙන් නායකයන්ට ලබා දුන් ඓතිහාසික ආදර්ශයක් කියලා මම හිතනවා.

සමහර රාජ්‍ය නායකයන්. එහෙම නැත්නම් වෙනත් නායකයන් තමන්ගේ බලය රැක ගන්න ආයුධ පවා පාවිච්චි කරන කාලයක් මේ. බලය හිමි නායකයන්ට උන්වහන්සේ ලබා දීපු මේ ආදර්ශය ඉතිහාසගත වනවා කියලා මම හිතනවා.

ගරු කථානායකතුමනි, ශුද්ධෝත්තම පියතුමාණන් විශේෂයෙන් ශ්‍රී ලංකාවට දැක්වූ ආදරය ගැන මා අද උදේ අතිගරු ජනාධිපතිතුමා සමග කථා කරපු අවස්ථාවේදීත් මතක් කළා.

අතිගරු ජනාධිපතිතුමා ශුද්ධෝත්තම පියතුමා හමු වන්න ගිය සෑම අවස්ථාවකම එතුමා සමග යන්න, ශුද්ධෝත්තම පියනමගේ මුදුව සිපාචාර කරලා ආශිර්වාදය ලබා ගන්න මටත් වරමක් ලැබුණා. එහිදී ශුද්ධෝත්තම පියතුමාණෝ අප සියලු දෙනා සමග කළ සාකච්ඡාවට අමතරව, අතිග රු ජනාධිපතිතුමා වෙනම කාමරයකට කැඳවා ගෙන ගිහිල්ලා පැය ගණනක් එතුමා එක්ක කථා කරපු ආකාරය අපි දැක්කා.

ශ්‍රී ලංකාවට ආදරය කරපු නායකයකු හැටියට අති උතුම් සොළොස්වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමාණෝ ඉතිහාසගත වනවා කියලා මම හිතනවා. ලංකාවේ ප්‍රශ්න ගණනාවක් තිබුණු අවස්ථාවක අපේ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ සර්ව ආගමික නායකයන් සමග ශුද්ධෝත්තම පියතුමා බැහැ දැකපු අවස්ථාවේ. ශුද්ධෝත්තම පියතුමා ලංකාව වෙනුවෙන් ප්‍රකාශයක් කළා. ජාත්‍යන්තරව ලංකාවට සහාය දෙන්න කියලා. උන්වහන්සේ ප්‍රසිද්ධියේ ජාත්‍යන්තර සහාය ඉල්ලුවා ශ්‍රී ලංකාව වෙනුවෙන්.

අතිගරු ජනාධිපති තුමා කිහිප වරක් ශුද්ධෝත්තම පියතුමා හමු වුණා. ඒ හැම අවස්ථාවකම රටේ සාමය වෙනුවෙන් උන්වහන්සේ ආශිර්වාද කළා. ඒ විතරක් නොවෙයි ගරු කථානායක තුමනි, රටේ පැවැති අවුරුදු තිස්ගණනක යුද්ධය නිමා වුනාට පස්සේ ශුද්ධෝත්තම පියතුමා පැහැදිලිව අතිග රු ජනාධිපතිතුමාට ප්‍රකාශ කළා, යුද්ධයෙන් පසු රටට සාමය ලබාදීමේ වැඩ පිළිවෙළට අවුරුදු ගණනක් යනවා, ඒකට අවශ්‍ය ශක්තිය, උන්වහන්සේගේ ආශිර්වාදය අපේ අතිගරු ජනාධිපතිතුමාට ලබා දෙනවා කියලා.

එදා මට මතකයි අගරදගුරු හිමිපාණන් හැටියට පත් කරලා වර්තමාන අපේ කාදිනල් හිමිපාණන් වන මැල්කම් රංජිත් හිමිපාණන් ලංකාවට එවපු අවස්ථාව. ශුද්ධෝත්තම පියතුමා එදා ලබාදුන් ඒ වරම තුළිනුත් අපේ අතිගරු ජනාධිපතිතුමාට පණිවුඩයක් දුන්නා සාමයට අවශ්‍ය කරන ශක්තිය උන්වහන්සේ ලබා දෙනවා කියලා.

ඒ වාගේම මා මේ අවස්ථාවේ දී විශේෂ ස්තුතියක් පිරිනමන්න කැමැතියි, අපේ අතිග රු ජනාධිපතිතුමා අපේ රටට ලබා දුන් සාමය වෙනුවෙන්, දහසයවන බෙනඩික්ට් ශුද්ධෝත්තම පිය අන්තර්ජාතික විශ්ව විද්‍යාලය තව නොබෝ දිනකින් මීගමුව බෝලවලානේ විවෘත කිරීමට කටයුතු කිරීම ගැන. දැන් ඉසුඹු ලැබූ අපේ දහසයවැනි බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමාණන් විසින් එය අපේ ශ්‍රී ලංකාවට ලබා දුන් දායාදයක්.

ගරු කථානායකතුමනි, මම හිතන විදියට ශ්‍රී ලංකාවේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ රජයේ සාමූහික සහජීවනය සහ මිත්‍රත්වය වෙනුවෙනුයි ලෝකයේ වෙනත් කිසිදු රටකට නොලැබුණු එම ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාවට ලබාදුන්නේ. සාමය වෙනුවෙන් ලබා දුන් එම ජාත්‍යන්තර ආයතනය නිසා මුළු ලෝකයේම අවධානය මේවනකොට ශ්‍රී ලංකාවට ලබාදුන්නේ.

සාමය වෙනුවෙන් ලබා දුන් එම ජාත්‍යන්තර ආයතනය නිසා මුළු ලෝකයේම අවධානය මේ වනකොට ශ්‍රී ලංකාවට ලැබීමේ මහඟු අවස්ථාවක් උදා වෙනවා. ඒ තුළින් අපේ ලංකාවට ලෝකයේ නොයෙකුත් රටවල්වලින් දේව ධර්මය හැදෑරීම සඳහා විශාල පිරිස් පැමිණෙනවා.

අපේ දහසයවන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියනම ශ්‍රී ලංකාවට කොපමණ ආදරය කළ නායකයකුද කියන එක පැහැදිලිව දකින්න අප මේ ලැබූ දායාදයම ඇති කියලා මා හිතනවා.

අපේ අනෙකුත් කථිකයනුත් සඳහන් කළ ආකාරයට පාප් වහන්සේ ලෝකයේ සිදු වූ හැම දෙයක් ගැනම කථා කර තිබෙනවා. ගබ්සාව ගැන කථා කළා; බිළිඳුන් මැරීම තුළින් සිදුවන අපරාධය ගැන කතා කළා.

සම ලිංගික විවාහයන් ගැන කතා කළා; යුද්ධය හා අවි ආයුධ පිළිබඳව කථා කළා. ඒ විතරක් නොවෙයි, උන්වහන්සේ මුළු ලෝකයට අත වැනුවා; මුළු ලෝකයටම සාමය පැතුවා; යුරෝපා රටවල සමගිය ගැන කථා කළා. උන්වහන්සේට අවශ්‍ය වෙලා තිබුණේ මුළු ලෝකය තුළ සාමය ඇති කිරිමයි. ඒ සාමයේ අවශ්‍යතාව ගැන උන්වහන්සේ හැම විටම පැහැදිලිව කථා කළා. උදාහරණයක් විදියට ගත්තොත්, විශේෂයෙන්ම උන්වහන්සේ ජුදා ආගමික රබ්බිවරුන්ගේ ආධ්‍යාත්මික නායකයකු ලෙස රබ්බිවරුන් පිළිගත්තා. විවිධ ජාතීන් උන්වහන්සේට ගෞරව කළේ කොයි ආකාරයටද කියන එක තේරුම් ගැනීමට ඒකම අපට හොඳ උදාහරණයක් වෙනවා.

මේ නව ශුද්ධෝත්තම පාප් වහන්සේ පත් කිරිම සම්බන්ධයෙන් අපේ සමහර මාධ්‍යවලින් එක් එක් අවස්ථාවන්වලදී විවිධ අර්ථ කතනයන් දෙන්න උත්සාහ කරනවා. ගරු කථානායකතුමනි, මා පැහැදිලිව කියන්න කැමැතියි,

මේ නව ශුද්ධෝත්තම පාප්තුමකු පත් කර ගැනීම සඳහා පවත්වනු ලබන්නේ නිලවරණයක් **(Election of the Pope on Papal Election)** නොවෙයි කියා. අපි නියම සිංහල වචනයෙන් කියනවා නම් එය 'සුදොතුම් පිය වරණ දැහැන' ලෙසයි හැඳින්වෙන්නේ. ඊට අමතරව අපේ නව සුදොතුම් පියාණන් කෙනකු පත් කිරීම පිළිබඳව 'ඡන්දයක්' කියන වචනය පාවිච්චි කරනවා. එය ඡන්දයක් නොවෙයි. මෙය අපි හඳුන්වන්නේ ආගමික වතාවත්ගෙන් සමන්විත 'රහස් සම්මුති සභාවක්' **(Conclave)** විදියටයි. සමහරුන් මෙය 'ඉල්ලා අස්වීමක්' **(Resignation)** ලෙස හඳුන්වනවා. එය එසේ නොවෙයි. මෙය අපි දකින්නේ 'තනතුර මුදා හැරීමක්' **(Renouncing)** හැටියටයි. සිංහල භාෂාවෙන් එම වචන විග්‍රහ වන්නේ එහෙමයි. මෙය ඉතාම විරල අවස්ථාවක්.

මේ දක්වා තුන් වරක් පමණයි අපේ ශුද්ධෝත්තම පියතුමන්ලා විශ්‍රාම ගැනීමක් ඉසුඹු ගැනීමක් සිදුවෙලා තිබෙන්නේ.

ඒ අවසන් අවස්ථාවෙන් අවුරුදු 598 කට පසුව තමයි අපේ මේ ශුද්ධෝත්තම පියතුමා මේ තීරණයට අවතීර්ණ වෙලා තිබෙන්නේ.

# මානව අයිතිවාසිකම් දරිද්‍රතාව පිළිබඳව ඉතාම සංවේදීව කටයුතු කළා

## ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය



මුළු ලෝකයේම බිලියන 1.2 ක් වූ කතෝලික ජනතාවගේ දෘශ්‍යමාන නායකයා අති උත්තම දහසයවන බෙනඩික්ට් පාප් වහන්සේයි. උන්වහන්සේගේ කායික රෝගී තත්ත්වය සලකලා ඒ වාගේම කතෝලික සභාවට ඉතාමත්ම ශක්තිමත් නායකත්වයක් දීමේ අවශ්‍යතාව නිසා උන්වහන්සේගේ හෘදය සාක්ෂියට එකඟව මේ ධූරයෙන් අයින් වීමට තීරණය කිරීම ගැන සමස්ත ලෝකයේම කතෝලික ජනතාව ඉතාම කලබලයට පත් වුණත්, එය කතෝලික සභාවේ ඉදිරි ගමන ගැන කල්පනා කරලා, දේව කැමැත්ත අනුව උන්වහන්සේ ගත් ඉතාමත්ම හොඳ තීරණයක් හැටියට සලකලා අද ලෝකවාසී ජනතාව උන්වහන්සේට ප්‍රශංසා කරනවා. මොකද, උන්වහන්සේ ඉසිළුවේ ඉතාමත්ම වැදගත් වගකීමක්. ඒ නිසා ඒ වගකීම හරියාකාරව ඉෂ්ට කිරීමේ අඩු පාඩු දැක්කාම උන්වහන්සේ එම තනතුර අත්හරින්න තීරණය කළා. ඒ හරහා අපි සියලු දෙනාටම යම් කිසි පාඩමක් ඉගෙන ගන්නට පුළුවන්.

අති උතුම් දහසයවන බෙනඩික්ට් පාප් වහන්සේ එම නිල තනතුරට පත් වුණු අවස්ථාවේ එම උත්සවයට පෞද්ගලිකව සහභාගි වෙලා උන්වහන්සේව බැහැ දකින්නට මාගේ ආදරණීය ස්වාමි පුරුෂයා වූ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ හිටපු ඇමතිතුමාටත් එදා ඒ විරල අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. එයත් මට ඉතාමත්ම සුවිශේෂි අත්දැකීමක් බව මේ අවස්ථාවේදී මා මතක් කරනවා.

අප මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ. උන්වහන්සේ විශේෂයෙන්ම මානව අයිතිවාසිකම්, පරිසරය ආරක්ෂා කිරීම. දරිද්‍රතාව හා අයුක්තිය පිටු දැකීම පිළිබඳව ඉතාම සංවේදීව කටයුතු කළ බව, එලෙසම ආගමික සහජීවනය වෙනුවෙන් උන්වහන්සේ ඇඩි ලෙස පෙනී සිටියා. විශේෂයෙන්ම උන්වහන්සේ උපත් පාලනය, ගබ්සාව, සමලිංගිකත්වය සහ දික්කසාදයට එරෙහිව ඇඩි ලෙස පෙනී හිටියා. ළමා අපචාර වැළැක්වීම පිළිබඳවත් උන්වහන්සේ ඇඩි අවධානයකින් කටයුතු කළා. විශේෂයෙන්ම පූජක ළමා අපචාර පිළිබඳව ලෝකයෙන්ම සමාව ඉල්ලන්න තරම් උන්වහන්සේ බැහැපත් වුණා. අපට මතකයි, 2002 වසරේදීත් ඒ විධියටම දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේත් ලෝකයෙන් සමාව ඉල්ලපු ආකාරය.



# කතෝලික සසුන් ප්‍රතිපත්ති දිවි හිමියෙන් රැකි නායකයෙක්

## ගරු විජයදාස රාජපක්ෂ මහතා

**ගරු කථානායක තුමනි, අතිඋත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා විශ්‍රාමයන මොහොතේ ඒ අලලා වචන ස්වල්පයක් කතා කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මම මහත්සේ සතුටුවෙමි.**

ඉකුත් අටවසර පුරා කතෝලික සසුන් නියමුවාණන් ලෙස උන්වහන්සේ කටයුතු කරද්දී මනසේ, හදවතේ සහ නායකත්ව ගුණාංග ප්‍රකට කරමින් කතෝලික ලෝකයේ විවිධ හැලහැප්පීම්වලට මුහුණ දුන්නේය. ලෝකයේ ආධ්‍යාත්මික වටිනාකම් සුරැකීමට නිරතුරු වෙහෙසවු අතර කතෝලික සසුන් ප්‍රතිපත්ති දිවි හිමියෙන් සුරැකීමට පෙරමුණ ගත්තේය.

ශුද්ධෝත්තම පියතුමා සමිඳාණන්ගේ මිදි උයනේ සැබෑ අපෝස්තුළුවරයාණන් ලෙස සිය බැටළු රැළ පෝෂණය කළේය. 'කැඳවනු ලැබුවෝ බොහෝ වෙති.

තෝරා ගත් අය ස්වල්පයකි' යන දේව වදන අනුව සමිඳු මිදි උයනේ සේවාවට උන්වහන්සේව තෝරා ගත්හ.

තමන් වහන්සේ ශාරීරිකව හා මානසිකව සවිමත් නොමැති කම නිසා විශ්‍රාම යන බව ප්‍රකාශ කළ අතර එකමුතුකම, යුක්තිය හා සාමය ලොව පුරා ගෙනයන්නට සවිමත් මදිබව පිළිගනිමින් උන්වහන්සේ විශ්‍රාම යන්නට තීරණය කළහ.

උන්වහන්සේට නිරෝගි සම්පත්තියෙන් යුතු දිගු දිවියකට මගෙන් සුබ පැතුම්!

# නිහතමානීත්වයේ පරමාදර්ශයක්

## ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා (සමාජ සුබසාධන අමාත්‍ය)



ස්තුතියි, ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා වන ජෝන් අමරතුංග මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. දහසයවැනි බෙනඩික්ට් පාප් වහන්සේ කළ සේවය අගය කිරීම සම්බන්ධව පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනැල්ලා සාකච්ඡා කරන්න අවස්ථාවක් සලසා දීම පිළිබඳව. ඒ වාගේම එයට ගරු කථානායක තුමා හැටියට ඔබතුමාගේ අවසරය, අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක තුමාගේ අවසරය, අනුමැතිය ලබාදීලා අද දවසේ උන්වහන්සේගේ සේවය ඇගැයීමේ යෝජනාව පිළිබඳව සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දීම සම්බන්ධව විශේෂයෙන්ම අපේ ස්තුතිය පිරිනමනවා.

ගරු කථානායක තුමනි, විශේෂයෙන්ම කතෝලිකයන් හැටියට අප පාප් වහන්සේ ගැන ආඩම්බර වනවා. ශ්‍රේෂ්ඨ නායකයෙක් වන දහසයවැනි බෙනඩික්ට් පාප් වහන්සේ සාමය ගැන තමයි හැම තිස්සේම කථා කළේ. මේ රටේ දෙවැනි ලෝක යුද්ධය පැවති හිට්ලර්ගේ පාලන කාලයේ දී තමයි උන්වහන්සේ මෙලොවට බිහිවුනේ උන්වහන්සේ දැක්කා, යුද්ධයේ තිබුණු භයානකකම සහ ඒකාධිපති පාලකයකුගේ පාලනයේ තිබුණු දුර්වලකම. එයින් ජනතාවට වුණු අසාධාරණය උන්වහන්සේ දැක්කා. උන්වහන්සේ පාප් තනතුරට පත් වෙන්නත් ඉස්සෙල්ලා ඉඳලාම කථා කළේ මේ ලෝකයේ සාමය ගැනයි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ ජනාධිපතිතුමාත් සමග උන්වහන්සේ බැහැ දකින්න ගිය වෙලාවෙ 'දී උන්වහන්සේගෙන් ප්‍රකාශ වුණේ රටට සාමය, සියලු දෙනාටම ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් ඇති වෙන්න ඕනෑය කියලයි. ලෝකයේ වාගෙ 'ම ශ්‍රී ලංකාවේත් සාමය ඇති වෙන්න ඕනෑ කියලා තමයි උන්වහන්සේ ප්‍රාර්ථනා කළේ. අද පත්තරයක් ගත්තොත් පෙනෙනවා, බාල වයසේ ඉන්න දරුවන්ට සිදුවන අපචාර සම්බන්ධව. ඒ අපචාර සම්බන්ධයෙන් තමයි උන්වහන්සේ නැගී හිටියේ. මේ අපචාර ලෝකයේ ඇති වන්නට ඉඩ නොදී ඒ දරුවන් ආරක්ෂා කර ගන්න ඕනෑය කියලයි එතුමා කිව්වේ. අපේ දරුවෝ තමයි ලෝකයේ වස්තුව. ඒ දරුවන්ට අපචාර කටයුතු සිද්ධ වන්න ඉඩ නොදී, ඒ ළමයින්ව ආරක්ෂා කර ගන්න කියලා තමයි උන්වහන්සේ හැමදාම කිව්වේ. විශේෂයෙන්ම අද අප එතුමා ගැන ආඩම්බර වෙනවා. එතුමා තමන්ගේ කාල සීමාවේදී ළමයින්ව ආරක්ෂා කර ගන්න කටයුතු කළ ආකාරය ගැන අප ආඩම්බර වෙනවා.

ගරු කථානායකතුමනි, උන්වහන්සේ අද අසනීපයෙන් පසු වෙනවා. ලෝකයේ කිසිම නායකයෙක් කිසිම දවසක තමන්ගේ තිලයෙන් අයින් වෙලා නැහැ. එවැනි යුගයක උන්වහන්සේ මුළු ලෝකයටම ආදර්ශයක් දුන්නා. අපට කරන්න බැරි නම්, අප මහලු නම්, අප ඒ තානාන්තරය තවත් කෙනකුට දිය යුතුයි. උන්වහන්සේ ඒක මුළු ලෝකයටම ප්‍රකාශ කර තිබෙනවා. ඒක විශිෂ්ට ආදර්ශයක් හැටියට අප දකිනවා. කතෝලිකයෝ හැටියට අප සියලු දෙනාම අද අපේ නායකයා ගැන ආඩම්බර වෙනවා. හැමදාම අප අගය කරන අපේ නායකතුමා මුළු ලෝකයටම නියම ආදර්ශයක් දී තිබෙනවා. බලන්න, උන්වහන්සේ පාප් තනතුරෙන් අයින් වෙද්දී ආපසු යන්නේ කාදිනල් තනතුරටයි.

# හින්දු ජනතාවගෙන් සුබපැතුම් !

## ඩී. එම්. ස්වාමිනාදන් මහතා



ගරු කථානායකතුමනි, අතිඋතුම් සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් පිළිබඳව හින්දු භක්තිකයකු ලෙස වචන ස්වල්පයක් කතා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම මහත් සතුටට පත්ව සිටින්නෙමි.

අතිඋතුම් දහසය වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා සත් වසරකට වැඩි කාලයක් පුරා විශිෂ්ට සේවාවක් ඉටුකළ සසුන් නායකයකු ලෙස ඉතිහාස ගතවන්නේය. සිය ධූර කාලයේදී මතුවූ අභියෝග වලට අභීතව මුහුණ දුන් එතුමා ඉස්ලාම් දහම ගැන කළ ප්‍රකාශයක් නිසා මහත් ආන්දෝලනයක් ඇතිවිය. සමලිංගික විවාහ වැනි ගැටලු ගැන නිහඬ නොවූ උන්වහන්සේ සිය දැක්ම මත පිහිටා ඒවා ගැන මතයන් පළ කළහ.

වර්ෂ 1294 දී සෙලස්ටීන් පාප්තුමා මෙසේ තනතුර අත්හැරි ප්‍රථමයා වූයේ පත්වී පස් මසකට පසු ඉල්ලා අස්වූ නිසායි. අතිඋතුම් දොළොස් වන ග්‍රෙගරි පාප්තුමා 1415 දී අස්වීමෙන් පසු වත්මන් සසුන් පියා විශ්‍රාම ලබා තියෙනවා. ලොව කතෝලිකයන් බිලියන 1-2 ක නායකයා ලෙස විශ්වීය බලයක් උන්වහන්සේ සතුවූවත් මහත් ආත්ම ශක්තියකින් මේ තීරණය ගෙන තිබෙනවා.

සිය ශරීර සෞඛ්‍යය හේතුවෙන් විශ්‍රාම ලැබූ උන්වන්සේගේ ඉදිරි දිවිය සෞඛ්‍ය සම්පත්තියෙන් පිරියේවා යැයි ශ්‍රී ලාංකිකයන් සහ හින්දු බැතිමතුන් වෙනුවෙන් ප්‍රාර්ථනා කරමි.

# ධනවතුන් හා දුප්පතුන් අතර වර්ධනය වන අසමානතාවය නැති කිරීමට කතා කළ නායකයෙක්

## විජිත හේරත් මහතා



ගරු ගරු කථානායක තුමනි, දහසයවැනි බෙනඩික්ට් ජෝශප් පාප් වහන්සේ හදිසියේ ඉල්ලා අස්වීම ගැන සමස්ත ලෝකවාසී කතෝලික ප්‍රජාවම විමතියට පත් වුණා. කතෝලික ප්‍රජාව විතරක් නොවෙයි, සමස්ත ලෝකවාසී අපි කවුරුත් විමතියට පත් වුණා. එතුමා තමන්ගේ ජීවිතය තුළ විවිධ කුසලතාවන් දක්ෂතාවන් පෙන්නුම් කළ ආගමික නායකවරයෙක්.

ඒ වාගේම විවිධ ක්ෂේත්‍ර සම්බන්ධව උන්වහන්සේගේ තිබුණු දැනුම ඒ හැකියාවන් තමන්ගේ පෞද්ගලික සුබ විහරණය සඳහා නොව සමස්ත ලෝකවාසීන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා යෙදවූවා කියන එක අවිවාදිත කරුණක්. මෙවැනි ඉල්ලා අස්වීමක් ඇත්තටම සමස්ත ලෝකයටම මහත් ආදර්ශයක්. සමහර නායකයන් දේශපාලන ලෝකයේ ව්‍යවස්ථාමය වෙනස්කම් හරහා චිරාත් කාලයක් ඒ වගකීම්වල ඉන්න උත්සාහ දරන මොහොතකදී ලාංකීය දේශපාලනය තුළත් ලෝක දේශපාලනය තුළිත් ව්‍යවස්ථාමය වෙනස්කම් හරහා නායකත්වය තුළ රැඳී ඉන්න උත්සාහ දරන මොහොතකදී ආගමික නායකයෙක් විධියට අද උන්වහන්සේ සමස්ත ලෝකයටම විශාල ආදර්ශයක් සපයා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ පමණක් නොවෙයි, ලෝකය පුරාම විවිධ ආගමික මතවාදයන් පදනම් කර ගෙන ආගමික ගැටුම් නිර්මාණය වන යුගයක් මේ. එවැනි ආගමික ගැටුම් සමනයට පත් කර ආගමික සහජීවනය ඇති කිරීම සඳහා උන්වහන්සේ විශාල උත්සාහයක්, මෙහෙයක් තමන්ගේ ධූර කාලයේදී සමස්ත ලෝකවාසී ප්‍රජාවට හිමිකර දුන්නා.

ගරු කථානායකතුමනි, ඇත්තටම උන්වහන්සේගේ විවිධ හැකියාවන්වලට, විවිධ කුසලතාවන්වලට සාක්ෂි විධියට 2013 වර්ෂය ආරම්භයේදී නව වසර සඳහා ලෝකවාසී ප්‍රජාව වෙත උන්වහන්සේ ඉදිරිපත් කරනු ලැබූ ශුභාශිංසන පණිවුඩයේ ඉතාමත්ම වැදගත් කරුණු කිහිපයක් අවධාරණය කර තිබෙනවා. එහිදී උන්වහන්සේ ඉතා පැහැදිලිව කියනවා, "ධනවතුන් හා දුප්පතුන් අතර වර්ධනය වන අසමානතාවය මගින් නොසන්සුන්ව හා ගැටුම්කාරී තත්ත්වයන් ලෝකය තුළ ඇති වීම කණගාටුදායකය. මෙසේ වී ඇත්තේ නොහික්මවන ලද ධනවාදය පැතිරීම විසින් ඇති කරන ලද ආත්මාර්ථකාමී සහ පෞද්ගලිකවාදී මනෝභාවයේ ව්‍යාප්තිය නිසාය" කියා. උන්වහන්සේ ඉතා පැහැදිලිව ලෝකයට මේ පණිවුඩය ලබා දීම තුළ ඉතාම වැදගත් කරුණක් අවධාරණය කළා. ධනවතුන් සහ දුප්පතුන් අතර වර්ධනය වන අසමානතාව මගින් තමයි මේ නොසන්සුන්තාව සහ ගැටුම්කාරි තත්ත්වය ලෝකය තුළ ඇති වෙලා තිබෙන්නේ ඉතාම කණගාටුදායක තත්ත්වයක්. මේ තත්

ත්වය ඇති වෙලා තිබෙන්නේ නිකම් නොවෙයි. නොහික්මවන ලද ධනවාදය පැතිරීම විසින් තමයි මේ ආත්මාර්ථකාමී පෞද්ගලික මනෝභාවයන් ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ ආර්ථික, සමාජ ක්‍රමවේදයේ පරිවර්තනයක් අත්‍යවශ්‍යයි කියන එක උන්වහන්සේ ඉතා පැහැදිලිව අවධාරණය කර තිබෙනවා.

# සුවිශේෂී ප්‍රඥාවෙන් හා නුවණින් පිරි නියමුවෙක්!

## ආචාර්ය හර්ෂ ද සිල්වා



ගරු කථානායක තුමනි මට හැඟෙන අන්දමට අතිඋත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් පිළිබඳව කතා කරන්නට ලැබෙන මේ විරල අවස්ථාව මහත් භාග්‍යයක් කොට මම සලකමි බෞද්ධයකු ලෙස අන් ආගමිකයන් ගැන කතා කිරීම අසාමාන්‍ය වූවත් රාජකීය විදුහල් අධ්‍යාපනයේදී කතෝලික, හින්දු. ඉස්ලාම් හා බුදුනු සියලු සිසුන් සමග මුහුවීම නිසා එය අසීරු කරුණක් නොවේ.

ශුද්ධෝත්තම පියතුමා සුවිශේෂී ප්‍රඥාවෙන් හා නුවණින් යුතු තැනැත්තකු වන අතර බිලියනයකට අධික කතෝලිකයන්ගේ නායකයාණන් ලෙස සියලු මානවයන්ට පොදු ශරීර සෞඛ්‍ය බඳු ගැටළුවලට මුහුණ දීමට සිදුවී ඇත.

කතෝලික, බෞද්ධ, හින්දු සහ ඉස්ලාමිකයන් ලෙස අප සියලු දෙනාට මේ සමාජය ගොඩනැගීමේ වගකීමක් ඇති අතර මානව දිවිය අනතුරේ හෙළන ප්‍රවනතාවයන් ජයගැනීමේ අභියෝගයක්ද ඇත.

**මෙම ලිපිය සසුන් පිය සේවය වෙනුවෙන් පාර්ලිමේන්තුවේ දී කළ කතාවක් නොව ප්‍රදීපයට එවූ විශේෂ ප්‍රකාශයකි**

# දේව රාජ්‍යයේ සැබෑ වටිනාකම සොයන 16 වන බෙනඩික් ශුද්ධෝත්තම පාප්තුමා

## දයාශ්‍රිත තිසේරා මහතා - (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය කටයුතු පිළිබඳ අමාත්‍ය)



මේ අවස්ථාව ශුද්ධෝත්තම පාප්තුමන්ට වසර 85 ක තම ජීවිතය දෙස ආපසු හැරී බැලීමට දෙවියන් වහන්සේම දුන් වටිනා අවස්ථාවක් ලෙස අපි කල්පනා කරමු.

තම පෞද්ගලික ජීවිතය උන්වහන්සේට වඩා එලදායි ලෙස දෙවියන් වහන්සේ සමග ඇතුලතින් බද්ධ වූ ජීවිතයකට මඟ හෙලිකරනු ඇත. එසේ නොවුනොත් පාප් ධූරයේ මහා වගකීම් සම්භාරයත්. අවිවේකි බවත් සමග උන්වහන්සේට මේ ඇතුලාන්ත ජීවිත ගමන සාර්ථක කරගැනීම අසීරු වනු ඇත.

මේ ලෝකයේ සියළු දෙනා බලය දිනෙන් දින වැඩිකරගන්නට සියළු උත්සාහයන් ගන්නා අවධියක නැති බලයක් ලබාගන්නට හැකි සෑම දෙයක් කරන්නා වූ යුගයක සියළුම ලෝකවාසි ජනතාවටත්, කතෝලිකයින්ටත්, ලෝකයේ සියළු නායකයින්ටත්, අප රටේ ජනතාවටත් කතෝලිකයකුද රජයේ කැබිනට් ඇමතිවරයකු ද වන මටත් මේ අත්හැරීම තුළ ශුද්ධෝත්තම පාප්තුමන් ලබාදුන්නේ සුවිශේෂිවූ ආදර්ශයකි. එනම් මේ තාවකාලික ලෝකයේ අප සිතන අප දකින බලය නොව ඉන් එහා ගිය වඩා වටිනා ලෝකයක බලාපොරොත්තුව ලෝකවාසි මිනිසුන් වන අපහට උරුමව තිබෙන බවයි. උන්වහන්සේගේ මේ තීරණය අපටත් අප ජීවිතය දෙස අලුත් ඇසකින් බැලීමට කරන ආරාධනාවක් වැනිය.

"ස්වර්ග රාජ්‍යය කෙතක සඟවා තැබූ නිධානයකට සමානය. එක්තරා මිනිසෙකුට එම නිධානය සම්භ විය. ඔහු එය සඟවා තබා මහත් ප්‍රීතියෙන් ගොස් තමන් සන්තක සියල්ල විකුනා දමා ඒ කෙත මිලදී ගත්තේය. "යැයි බයිබලයේ සඳහන් වේ. එලෙසින්ම අද සුදතුම් පියාණන්ද ඒ ප්‍රීතිය එලෙසින්ම අත් දකිනු ඇතැයි මා සිතමි.

# වාමාංශික ව්‍යාපාර වෙනුවෙන් සුදොතුම්පිය සේවාව අගය කරමි

## ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍ය)



කථානායක තුමනි, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය සහ මෙරට වාමාංශික ව්‍යාපාර වෙනුවෙන් අතිඋතුම් සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන්ගේ සේවාව අගයන්නට මමද එක්වෙමි.

ශුද්ධෝත්තම පියතුමකු වසර 600 කට පසු සිය තත්ත්වයෙන් ඉවත්වීම විශ්‍රාම ලැබීම ගැන මම වඩාත් පුදුමයට පත්වූයෙමි. අතිඋත්තම සොළොස්වන බෙනඩික් පියතුමා සිය සාම්ප්‍රදායික මතවාදයන් වෙනුවෙන් පෙනී සිටි අතර කතෝලික සභාව තුළ සිය මතවාදයන් නොබියව ඉදිරිපත් කිරීමේ ශක්තියක් විය. වඩාත් මානව වාදී, විශ්වීය කාරනා වෙත අවධානය යොමුකරමින් විශ්ව ආර්ථික පසුබෑම් හමුවේ විකල්ප මං සෙවීමේ මඟ අවධාරණය කළ බව අපට මතකය.

අතිඋතුම් සොළොස්වන බෙනඩික් සසුනිසුරාණන්ට සාමකාමී විශ්‍රාමික දිවියක් සතුටින්, යහපත් සෞඛ්‍යයෙන් යුතුව ගතකිරීමට වරම් ලැබේවායි යන්න අපේ පැතුමයි.

ශුද්ධවූ ජුසේ මුනි .... 5 පිටුවෙන්

එතුමාණන්ගේ ඔත්පලවීම දුටු දෙව් පුතු සහ මව එතුමා මෙලොව හැර යන මොහොත ළඟාවී ඇති හෙයින් අත්‍යන්ත ප්‍රේමයෙන් යුතුව එතුමාණන්ට අවැසි දේ සපයා දෙමින් උපස්ථාන කරමින්, සැනසිලි වචන පවසමින් පසු වී ඇත.

ශු. ජුසේ තුමාගේ ආත්මය එතුමාණන්ම දෙවිපියාණන්ට පූජා කර ඇත. ශු. ජුසේ තුමාගේ ආත්මය උකුත් වීමෙන් පසු ජේසු සමිඳුන් ද, මෑණියන් ද කඳුළු වගුරවමින් හැඬූ බව ද සඳහන් වේ.

එතුමාණන්ගේ නිර්දෝෂී ආත්මය පාතාලයට බැස ජේසු සමිඳුන් මළවුන්ගෙන් උත්ථාන වනතුරු එහි සිට පසුව මෝක්ෂ සුගතිය ලබාගත් බව කියැවේ.

# 45 වසරක යුග දිවි සැමරුම



හපුගොඩ මීසමට අයත් ලයනල්හාරංජනීමැදගමයුවළ පසුගිය දා තම විවාහ දිවියේ 45 වසර සංවත්සරය සැමරුවේ ඥාතින් හා මිතුරන් සමඟ දෙවිඳුන්ට තුති පිදීමෙන් ය.

නැව් සංස්ථාවේ විශ්‍රාමික ආරක්ෂක කළමනාකරු වන ලයනල් මැදගම මහතා කාලයක සිට හපුගොඩ මීසමේ ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටුවේ ක්‍රියාකාරි ලෙසද, අසිපා කණ්ඩායමේ ක්‍රියාකාරකම් සඳහා ද දායක වෙමින් වැඩිහිටි දරුවන් දෙදෙනකුගේ දෙමාපියන් වශයෙන් යහමඟ යමින් ශුද්ධවත් පවුල් ජීවිතයක් ගත කළ යුවළකි. ඔවුනට හපුගොඩ මීසම් ජනතාවගේ සුබාසිංසන ද පිරිනමමු.

# විශ්ව විද්‍යාලයීය කතෝලික ශිෂ්‍ය සංගමයෙන් විවෘත ආරාධනයක්!

**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය කතෝලික ශිෂ්‍ය සංගමය විසින් මෙහෙයවන වාර්ෂික චතාරික පාදනමස්කාරය මෙවර තේවත්තේ අප ස්වාමිදුගේ බැසිලිකා දෙව්මැඳුරේ දී මාර්තු 26 (පෝය දින) උදෑසන 9.00 ට ආරම්භ කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇත.**

මෙම චතාරික පාදනමස්කාරයට සහභාගි වන ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය කතෝලික ශිෂ්‍ය සංගමයේ සියලුම ආදී මානව මානවිකාවියන්ට විවෘත ආරාධනයක් කරන සංවිධායක කමිටුව වැඩි විස්තර සඳහා ප්‍රින්ස් - 0773 523750 / දිමුතු - 0773 820460 හෝ වජිර 0777 796838 අමතන ලෙස ඉල්ලා සිටී.

# අවමංගල්‍ය ස්තූතියයි



කොළඹ 15 අලුත් මාවත පාරේ 790 "පාතිමා" නිවසේ පදිංචිව සිට පසුගිය පෙබරවාරි මස 12 වෙනි දින සග සැපත් වූ මේරි ප්‍රිසිලා රාජපක්ෂ මහත්මියගේ වියෝවෙන් ශෝකයට පත් ස්වාමිපුරුෂයා රනිල් රාජපක්ෂ, සංජය ඇන්ටන්, ජනක මංජු ශ්‍රී, අමිල අංජු පුතුන්ද, ශිවන්ති කන්නන්ගර ලේලිය ද, ගරු සෙරි යුකරිස්ටා රාජපක්ෂ පැවිදි සොයුරිය ද ස්තූතිය පුද කරති.

කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ට ද, විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්ට ද, ගරු පියතුමන්, පැවිදි සොයුරියන් සහ සහෝදරතුමන් ටද, ජපමාල කන්‍යාරාමයේ ගරු සොයුරියන්ට ද, කාමලයිට් කන්‍යාරාමයේ පැවිදි සොයුරියන්ට ද, මෝදර තෙරේසා කන්‍යාරාමයේ පැවිදි සොයුරියන්ට ද, මෝදර ස්නාවක ජුවාම් මුනිඳුන්ගේ දේවස්ථානයේ මීසම් සේවක ගරු හේෂාන් ප්‍රනාන්දු පියතුමාට ද ශු. ස්නාවක ජුවාම් මුනි දේවස්ථානයේ පැරණි මීසම් සභාවට සහ මීසම් වාසින්ට ද, මට්ටක්කුළිය සා. මරියා දේවස්ථානයේ මීසම් සභාවට ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා ඇලිතියා විදුහලේ අධ්‍යක්ෂිකා කුමාරි හපුගල පෙරේරා මියට ද, එහි ගුරු මණ්ඩලයට සහ සේවක මණ්ඩලයට ද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කළමනාකර අධ්‍යක්ෂ ඇතුළු සේවක මඬුල්ලට ද, ද ලාසාල් විදුහලේ ආදි ශිෂ්‍ය සංගමයට සහ ගුරු මණ්ඩලයට ද, සා. පීතර විදුහලේ ආදි සිසු සංගමයට සහ එංගලන්ත ආදි සිසු සංගමයට ද, මහරගම ජාතික පිළිකා රෝහලේ වෛද්‍යවරුන් සහ හෙදියන්ට ද බස්නාහිර පළාත් පාසල් රියදුරු සංගමයට ද සියලුම පුවත්පත් සමාගම් වලට ද, ශ්‍රී ලංකා පුවත්පත් නියෝජිතයන්ගේ සංගමයේ ගරු සභාපති සිරිමල් පීරිස් මහතා ටද, එංගලන්තයේ ඩෙවෝන් ක්‍රිකට් සමාජයේ සියලු සාමාජිකයන්ට ද අපට ශෝක පණිවුඩ, මල් වඩම් සහ විවිධාකාරයෙන් අප හා ශෝකය බෙදාගත් සියලු දෙනාට ද ස්තූතිය පුද කර සිටිමු.


## ඔටෝ ප්ලේට්න් වර්ගයේ මුද්‍රණ යන්ත්‍රයක් විකිණීමට තිබේ

**හයිඩල්බර්ග් වර්ගයේ, 13" X 18" ප්‍රමාණයේ ඔටෝ ප්ලේට්න් මුද්‍රණ යන්ත්‍රයක් විකිණීමට ඇත. ඉහළම ඉල්ලුමට විමසන්න.**

**අධ්‍යක්ෂ, කොළඹ කතෝලික මුද්‍රණාලය,**
**නො. 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**බොරැල්ල, කොළඹ 08.**
**දු. අංක 2695984 / 2678106**


# සැබෑ මනස්ථාපයක් තුළින් දෙවිඳුන් අත්දකිමු

මෙය වරප්‍රසාදජනක කාලයයි. අපගේ ජීවිත අභ්‍යන්තරයෙන්ම දෙවිඳුන්ව හමුවෙන, අත්දකින කාල පරිච්ඡේදයයි. සැබෑ සිත් හැරීමක් මඟින් උන්වහන්සේගේ ආදරය වඩ වඩා අපගේ ජීවිතයන් තුළ අත්දැකිය හැකිය. අපගේ ජීවිතවල සැබෑ වෙනසක් අත්දකින්න පුළුවන් වන්නේ ද උන්වහන්සේත් සමඟ තිබෙන මේ ගැඹුරු සම්බන්ධතාවය වැඩිකර ගැනීම මඟින්ය. එනම් අපගේ පාප වලට සැබෑ මනස්ථාපනයක් තුළින් සමිඳුන් සමඟ ශුද්ධවන්තකමින් පිරි ජීවිතයක් ගත කිරීමට අපට මාවතක් විවෘත වේ.

මෙවැනි පුද්ගලයන් අපට ඔවුන්ගේ ජීවිත රටාවන් තුළින් ද හඳුනාගත හැකි වේ. එනම් මනස්ථාපිත පුද්ගලයකුගේ බාහිර ලක්ෂණයක් වන්නේ ඔවුන්ගේ සැබෑ ජීවිත වෙනස්වීමයි. මෙය ශුද්ධවූ බයිබලයෙන් ගෙන හැර දක්වන විවිධ කාලපරිච්ඡේදයන් තුළ ජීවත් වූ පුද්ගලයන්ගේ ජීවිත රටාවන් තුළින් මැනවින් පිළිබිඹු වේ. සාවුලු නමින් හැඳින් වූ පුද්ගලයා පාවුලු ලෙස වෙනස් වුනේ ද දෙවිඳුන් අත්දැකීම තුළය. ඔහු ගත කළ පාපිෂ්ඨ ජීවිතය පිළිබඳ සැබෑ මනස්ථාපනයක් මඟින් දෙවිඳුන්ගේ ආදරයට විවෘත වී ජීවිතය තුළ සැබෑම වෙනසක් අත්දුටු පුද්ගලයකු බවට ඔහු පත් විය. තවද පවුකාර ස්ත්‍රිය, ස්වාමින් වහන්සේගේ දෙපාමුල ස්පර්ශය ලබලා, ඇයගේ පවුකාර ජීවිතයට නැවතීමේ තිත තබලා, උන්වහන්සේව හමුවීම මඟින් අලුත් ජීවිතයක් ගත කිරීමට ආශිර්වාද ලැබූ තැනැත්තියකි. එදා හිටපු මුලු සමාජයම පාපිෂ්ඨයි. පවුකාරයි කියලා හංවඩු ගහද්දී, උන්වහන්සේගේ දෙපාමුල ඇදවැටීම නිසාම භාග්‍යවත් ජීවිතයක් ගත කිරීමට අවස්ථාවක් ඇයට සැලසිනි. මෙවැනි චරිත බොහෝමයක් ශුද්ධවූ බයිබලයේ සඳහන් වේ. මේ සෑම චරිතයකින්ම අපට ගෙන හැර දක්වන්නේ සැබෑ මනස්ථාපනයක් තුළින් ඇතිවන ජීවිත පෙරළියයි. ඒ නිසාම අත්දකින දෙවිඳුන්ගේ ආදරයයි. එම නිසා අප ද මේ කාලය තුළ උන්වහන්සේගේ ආදරයට වඩ වඩා විවෘත වී උන්වහන්සේ තුළම යැපුනු ජීවිතයක් ගත කිරීම මඟින් අපගේ ජීවිත තුළ ද සැබෑ මනස්ථාපනයක් ඇති කරගෙන උන්වහන්සේත් සමඟ ජීවිතයක් ගත කිරීමට අදිටන් කරගනිමු.

**(ප්‍රියාන් මධු ප්‍රනාන්දු**

| **15 වන සැමරුම** | **තෙමස් සැමරුම** |
|---|---|
| **ජෝන් පැට්ට්‍රික් මදුරාවල** | **පිලීෂියා සෙලින් මදුරාවල** |
|  |  |
| **සග උපත 1998. 02. 26** | **සග උපත 2013. 12. 17** |

ඔබ අපෙන් වෙන්වූවත් නිරන්තරයෙන් අපි ඔබ ගුණ දෙවිඳුන් ඉදිරියේ සමරමු.

කාන්ති මදුරාවල, නිහාල් මදුරාවල, ගරු රංජිත් මදුරාවල පියතුමා සහ මුණුබුරු මිණිබිරියන්.

# සා. ජෝශප් විද්‍යාලයෙන් බිහි වූ ක්‍රීඩා තරු ඇගයේ



කොළඹ සා. ජෝශප් විද්‍යාලයෙන් බිහිවී ජාතික තලයට ගිය ක්‍රිකට් ක්‍රීඩකයින් සිව් දෙනෙක් පසුගියදා පාසල් භූමියේ දී පිදුම් ලැබූහ. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ නව නායකයා ලෙස තේරී පත් වූ ඇන්ජලෝ මැතිව්ස් ද, තුන් ඉරියව් ක්‍රීඩක තිසර පෙරේරා ද, නව වේග පන්දු පුහුණුකරු ලෙස තේරී පත් වූ චමින්ද වාස් ද සමඟින් යොවුන් ක්‍රීඩක දිමුත් කරුණාරත්න මෙසේ උපහාර ලැබීය. සා. ජෝශප් විද්‍යාලයේ ස්ටැන්ලි අබේසේකර ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවැති මෙම උපහාර උලෙළ සංවිධානය කරනු ලැබුවේ පාසල් අදියුරු ගරු සිල්වෙස්ටර් රණසිංහ පියතුමා ප්‍රමුඛ ගුරු මඬුල්ල විසිනි. **(අශේන් සාවින්ද සේනාරත්න)**

**දැනට දේව වාක්‍ය සංග්‍රහයේ අවසාන සෝදුපත් නිරීක්ෂණය කරගෙන යන බැවින්, මුද්‍රණය කිරීමට පෙර යම් අදහසක් ඇතොත් ලිඛිතව පහත සඳහන් ලිපිනයට දන්වන්න.**

**ගරු ඉග්නේෂස් වර්ණකුලසිංහම් පියතුමා,**
**ජාතික අධ්‍යක්ෂ,**
**ජනවන්දනා සහ සංස්කෘතික ජාතික කොමිසම,**
**"ලංකාරාම" බැල්කම් පෙදෙස,**
**කොලඹ 08.**



"ජීවයට ජීවය ස්වභාව ධර්මයයි" යන තේමාව මුල් කරගෙන ජා-ඇල සා. මරියා විදුහලේ ඉග්‍රීසි දිනය නොබෝදා උත්සවාකාරයෙන් පැවැත්වීය. මෙහි විශේෂත්වය වූයේ අමුත්තන් පිළිගැනීමේ සිටම සියල්ල ස්වභාව ධර්මය මුල් කරගෙන පිළියෙල කර තිබීමයි. මේ සඳහා ජා-ඇල වික්ෂෝප මාතා දෙව්මැඳුරේ සහයක ගරු තුසිත සෝලංගආරච්චි පියතුමා සමඟ බෝලවලාන ගුරු අභ්‍යාස විදුහලේ හිටපු ආචාරිණී එමිල්ඩා ඩග්ලස් මෙනෙවිය ද ඇතුළු විදුහල්පතීන් සහ සිසු සිසුවියන් ද සහභාගි වූහ. **(කුමුදු ප්‍රනාන්දු - ඉංග්‍රිසි ආචාරිනි, ජා-ඇල සා. මරියා විදුහල)**

# සුහද සහජීවනයෙන් සබැඳුනු අසිරිමත් දෙව්පුද මෙහෙයක්



**සීතල දුරුතු මහේ 22 වෙනි ගුරු දින මහරගම ගුරු විද්‍යාලයට වරප්‍රසාදීය දිනයක්ම විය. කිතුනු, බොදුනු, හින්දු, ඉස්ලාම් ආගමික සිසු ගුරු සුසංයෝගයේ සහභාගිත්වයෙන්, මහරගම ශා. මරියා දෙව්මැඳුරේ දී දිව්‍ය පූජා මෙහෙයන් සිදුකෙරිණි. පුරා වසර 37 ක කාලයක් ගුරු හා කථිකාචාර්ය සේවයේ නියැලී, ඉසිඹු සුවයට පිවිසි නෙළුම් වීරසූරිය ගුරු මැණියන්ගේ අමිල මෙහෙවර වෙනුවෙන් දෙවිඳු පැසසීමටත්, එතුමියගේ ඉදිරියාව දෙවිඳු රැකවරණයට පවරා දීමටත්, නව වසර තුළ විද්‍යාලයීය විදුහල්පති සැමගේ ජීවිත වලට දේවාශිර්වාදය පැතීමත් අරබයා මෙය සංවිධානය කෙරිණ.**

විද්‍යාලයීය සිසුන්ගෙන් බහුතරයක්ම සිය ජීවිතයේ ප්‍රථම වතාවට කතෝලික දෙව්මැඳුරකට පිවිසීමේ හා උතුම් දිව්‍ය පූජා යාගයක් දැන ගැනීමේ වාසනාව ලැබීම ගැන මහත් සතුටට පත්වූහ. සෑම දෙනා තුළ පහන් සිත් අවදි කළ අසිරිමත් වූ දිව්‍ය යාගය, කතෝලික ධර්මය ප්‍රධාන කථිකාචාර්ය ගරු ඉන්ද්‍රානි ප්‍රනාන්දු (ශු.ප.නි.) පැවිදි සොයුරියගේ ප්‍රධාන අනුශාසකත්වයෙන් ද, අගරදගුරු පදවි අධ්‍යාපන අධ්‍යක්ෂ ගරු රංජිත් මදුරාවල පියතුමාගේ ප්‍රධානත්වයෙන් ද සිදුවුනි. එතුමාණන් සමඟ මහරගම මීසම් සේවක ගරු ජූඩ් නික්ලස් පියතුමා සහ ගරු කාල්ටන් පියතුමා එක්ව සිදුකළ මෙම ගාම්භීර වූ දිව්‍ය පූජාව, වැඩම කළ සංඝරත්නය ඇතුළු සියල්ලන්ගේම පැසසුමට ලක්විය. අගපේ බොදුන සංකේතාත්මකව විඳගනු වස් දිව්‍ය පූජාවෙන් පසුව සුහද සත්කාරයන් ද සිදුකෙරිණ. මහරගම ගුරු විද්‍යාලයීය ඉතිහාසය තුළ සියළු පාර්ශ්වයන්ගේ එකමුතුවෙන් පළමුවරට සිදුකෙරුනු මේ මහා යාගය සෑම හදවතක් වෙතම ගෙන ආවේ ආශිර්වාදයක් ම ය.

**– නීලා කුරේ**

# සාම විනිසුරු පදවි ලබයි



**දළුගම මීසමේ පමුණුවිල සභාවේ මීසම් කමිටු සාමාජිකයකු වශයෙන් වසර 40 කට අධික කාලයක් සේවය කරන, පමුණුවිල - ගල්ප්දණ්ඩ අවමංගල්‍යාධාර සමිතියේ අනුශාසකවරයකු මෙන්ම ප්‍රදේශයේ විවිධ සමිති සමාගම්වල ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස ඉමහත් සේවයක් කරන සැදැහැවත් කතෝලිකයකු වන කැලණිය, ගෝනවල, ගල්ප්දණ්ඩ, අංක 215 පදිංචි එල්. ජේ. බෙනඩික් සිල්වා මහතාට මුළු දිවයිනටම බල පැවැත්වෙන පරිදි සමාදාන විනිශ්චයකාරවරයකු වශයෙන් පත්වීමක් ලැබීම පමුණුවිල සභාවට හා ප්‍රදේශයට දක්වන ලද ඉමහත් ගෞරවයකි.**

බෙනඩික් සිල්වා මහතා රජයේ සේවකයකු ලෙස විවිධ තනතුරු දරමින් වසර 41 ක කාලයක් සේවය කර ඇති අතර, විශ්‍රාම යන විට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහකාර විගණකාධිපතිවරයකු වශයෙන් කටයුතු කර ඇත. ඒ මහතා රාජ්‍ය මූල්‍ය හා විගණනය සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ රාජ්‍ය ගිණුම් හා විගණනය පිළිබඳ වරලත් ගණකාධිකාරී ආයතනයේ සහතිකලත් විගණකාධිපතිවරයකු වශයෙන් කටයුතු කර ඇත. ඒ මහතා රාජ්‍ය මූල්‍ය හා විගණනය සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ රාජ්‍ය ගිණුම් හා විගණනය පිළිබඳ වරලත් ගණකාධිකාරී ආයතනයේ සහතිකලත් විගණකවරයකු වන අතර, විදේශ පුහුණුවීම් කිහිපයකට ද සහභාගි වී ඇත. එසේම එක්සත් රාජධානියේ "වොවික් විශ්ව විද්‍යාලයේ" ඉංග්‍රීසි පිළිබඳ සම්මාන සහතික ලාභියකු මෙන්ම මහා බ්‍රිතාන්‍යයේ ශිෂ්‍යත්වලාභීන්ගේ සංගමයේ සාමාජිකයකු වශයෙන් ද කටයුතු කරයි.

තමා ලද තනතුරු හා නිලයන් සම්බන්ධයෙන් සතුටුවන බෙනඩික් සිල්වා මහතා දෙවියන්ට ස්තූති ප්‍රශංසා කරන අතර, කතෝලික සභාවට හා ප්‍රදේශයට දැනට කරන සේවය තව තවත් කැපවීමෙන් කිරිමට දෙවිඳුන්ගේ ආශිර්වාදය හා පිහිට බැගෑ සිතින් අයැද සිටී. ඒ මහතාගේ ඉදිරි කටයුතු කිරීමට අවශ්‍ය සවියද, දිරියද, වීරියද නොමඳව ලැබේවායි අප ඉත සිතින් ප්‍රාර්ථනා කරමු.